## 2025. 08. 12 දින පෙ.ව.  9.30 ට පවත්වන්නට යෙදුනු කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ වාර්තාව :-

- **සභාපතිතුමා මුලසුන ගැනිම** :-  ගරු සභාපතිතුමා විසින් පැමිණි සිටි සියළු දෙනා පිලිගන්නා ලදී. මහ සභාව පෙ.ව. 9.30 ට ආරම්භ කරන ලදී.
- පැමිණීම- මෙදින රැස්වීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා සහ ගරු මන්ත්‍රීතුමියන්ලා සහභාගී විය.

| අනු අංකය | තනතුර | පක්ෂය | නම | පැමිණීම |
|---|---|---|---|---|
| 1. | ගරු සභාපති | ජා.ජ.බ. | එම්. විකසිත පුෂ්පසූරිය මහතා | 08.25 |
| 2. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජේ.ඩී.කේ. පී. කුමාර ජයනෙත්ති මහතා | 08.26 |
| 3. | ගරු ප්‍රා.ස.ම. | ප්‍රජා.වාමාංශික | එච්.එම්. සිසිර සේනාරත්න මහතා | 08.30 |
| 4. | ගරු ප්‍රා.ස.ම. | පො.එ.පෙ. | එම්.ඒ. ඉනෝකා මල්ලව ආරච්චි මිය | 08.35 |
| 5. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | ඩී. පත්මසිරි දෙල්ගොල්ල මහතා | 08.35 |
| 6. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | කේ.පී. මහින්ද  ජයලාල් පතිරණ මහතා | 08.40 |
| 7. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | කේ.ජී. සිරිල් කරුණාරත්න මහතා | 08.45 |
| 8. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | එන්.ජී. එම්.නිරෝෂණ නාපාවල මහතා | 08.50 |
| 9. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | අජිත් නන්දසිරි මනම්පේරි මහතා | 08.52 |
| 10. | ගරු ප්‍රා.ස.ම. | එ.ජා.ප. | එම්. ඩග්ලස් ප්‍රේමදාස මහතා | 08.53 |
| 11. | ගරු ප්‍රා.ස.ම | ස.ජ.බ | ඉරෝෂා උදයන්ගනී | 08.55 |
| 12. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.ඩී. ආශා සමන්කුමාරි මිය | 08.55 |
| 13. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එච්. තනූජා දීපානි චන්ද්‍රකා මිය | 08.56 |
| 14. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ඩී.ජී. ජස්ටින් රණවීර මහතා | 09.10 |
| 15. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.පී. රොෂාන් මධුසංක දේශප්‍රිය මහතා | 09.10 |
| 16. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | ජී. රංගනාත් ගහබඩගේ මහතා | 09.11 |
| 17. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | එන්. කපිල අබේසිරි මුණසිංහ මහතා | 09.11 |
| 18. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ටී.එම්. උමේෂා මල්කාන්ති මිය | 09.13 |
| 19. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජේ.ටී. ඒ. රංගන විජේසුන්දර මහතා | 09.13 |
| 20. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජී.ඩබ්.ජයරත්න මහතා | 09.14 |
| 21. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -1 | අයි. මංගල කිත්සිරි ඩයස් මහතා | 09.15 |
| 22. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -2 | කේ.කේ. දුමින්ද කසුන් අමරසිංහ මහතා | 09.18 |
| 23. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | කේ.ඩී. චූලා ශාන්ති මිය | 09.20 |
| 24. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජී.මහින්ද ගුණසිංහ මහතා | 09.22 |
| 25. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ඒ. දමින්ද නලින් අදිකාරම් මහතා | 09.23 |
| 26. | ගරු ප්‍රා.ස.ම. | එ.ජා.ප. | ජී.ඒ.ඊ. රනිල් එදිරිසිංහ මහතා | 09.24 |
| 27. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | ඒ. ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා | 09.24 |
| 28. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | කේ.එම්. ජයසේකර මහතා | 09.24 |
| 29. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා | 09.25 |
| 30. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -2 | ඒ. නයනා ජීවනී අතුකෝරළ මිය | 09.25 |
| 31. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | කේ.කේ. දයාවතී මිය | 09.27 |
| 32. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.කේ. විජේසිරි මහතා | 09.30 |
| 33. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | ඩී.ඒ. මොහාන් චන්දික අමරසේන මහතා | 09.30 |
| 34. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජී.ඒ. සෂිකලා මදුභාෂිනී මිය | 09.30 |
| 35. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | බී.එම්. ගයාන් වික්‍රමසූරිය මහතා | 09.30 |
| 36. | ගරු ප්‍රා.ස.ම. | ස්වායීන -1 | ඩී.එච්.හරිසිංහ  මහතා | 09.30 |
| 37. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.ඒ. දේවින්ද කුමාර් මහතා | 09.31 |
| 38. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | බී.ඒ. එස්.පී. කැලුම් ශ්‍රී ධර්මදාස මහතා | 09.31 |
| 39. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | සතා සිවම් චන්ද්‍රකුමාර් මහතා | 09.31 |
| 40. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ආර්.එල්. එන්  මල්කාන්ති ලියනගේ | 09.32 |
| 41. | ගරු ප්‍රා.ස.ම. | පො.එ.පෙ. | අනිල් ජගත් කුමාර ලියනගේ මහතා | 09.31 |
| 42. | ගරු ප්‍රා.ස.ම. | පො.එ.පෙ. | එම්. ප්‍රේමරත්න මහතා | 09.36 |
| 43. | ගරු ප්‍රා.ස.ම | ශ්‍රී.ල.පො.පෙ | පී.වී. සුදර්ශන සම්පත් බොතේජු මහතා | 09.39 |

`

01. පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.
2025.07.16 දිනැති මහාසභා රැස්වීම් වාර්තාව.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා :-</u>

2025.07. 16 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

<u>ගරු උපසභාපති අනිල් ලියනගේ මහතා -</u>

2025.07.16 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමේ යෝජනාව ස්ථිර කරමි.

<u>සංශෝධන ඉදිරිපත්කිරීම.</u>

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා:-</u>

**මෙම වාර්තාව සභා රීති අනුව සෙනසුරාදා, ඉරිදා දින හැර සතියේ වැඩ කරන දින 4 කට පෙර අපිට ලැබිය යුතුයි. රීතිවල සඳහන්වන්නේ එලෙසයි . රීති අනුව කටයුතු කරමු. 15 පිටුවේ අන්තිම පේලිය නාලන්ද එල්ලාවල මැතිතුමා නොව නන්ද එල්ලාවල මැතිතුමා විය යුතුයි. 16 පිටුවේ සභාව සතුව තිබුනේ රු. 50000.00ට අඩු ලෙස විය යුතුයි. 19 පිටුවේ මන්ත්‍රී වරු එක් කමිටුවකට එක් අයෙක්වත් නියෝජනය විය යුතුයි ලෙස නිවැරදි විය යුතුයි. 28 පිටුවේ ඩී.අයි. පයිප්ප නොව ජී. අයි. පයිප්ප විය යුතුයි. මුද්‍රණ දෝෂ නිවැරදි විය යුතුයි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. කේ. විජේසිරි මහතා:-</u>

**13 පිටුවේ සියළු කටයුතු වලට සහාය වෙනවා වෙනුවට යහපත්, නිවැරදි කටයුතු වලට සහාය වනවා ලෙස නිවැරදි විය යුතුයි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. ඩබ්. ජයරත්න මහතා:-</u>

**21 පිටුවේ මාගේ නම ජී. ඩබ්. ජයලත් නොව ජී. ඩබ්. ජයරත්න ලෙස නිවැරදි විය යුතුයි. එසේම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. ලීලානන්ද මහතාගේ නියෝජනය කරන පක්ෂය ජාතික ජන බලවේගය ලෙස සඳහන්විය යුතුය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය -</u>

**11 පිටුවේ 2015 වසරේ රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ සංකල්පයක් නොව 2018 වසරේ සංකල්පයක් ලෙස නිවැරදි විය යුතුයි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා:-</u>

**මම එදා 15 පිටුවේ කිව්වා අපි පාරවල් හදන්නේ නැතිව මුදල් ගත්තානම් විමර්ශනයක් කරන්න කියලා. ඒ වාර්තා දෙන්න. ලබන සභා වාරෙදි එහෙම එකක් කරලා නම් වාර්තා දෙන්න. ප්‍රකාශයක් කරන්න ගරු සභාපතිතුමා. එහෙම වැරැද්දක් වෙලා නම් විමර්ශනයක් කරන්න. ලේකම්තුමා තොරතුරු දෙන්න. අපි නිවැරදි විය යුතුයි. සියල්ල ඇතුලත් විස්තරයක් දෙන්න.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා:-</u>

**පිටුව 8 හි සඳහන් පරිදි දෙහෙරගොඩ ග්‍රාමනිලධාරී ලෙස මා වසර 2 ක් කටයුතු කර නොමැත.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නාපාවල මහතා-

**9 පිටුවේ ශ්‍රී ලංකා යුධ හමුදා විශේෂ බලකාය ලෙස නිවැරදි විය යුතුයි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී තනූජා දිපානි චන්ද්‍රිකා මියගේ සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රොෂාන් මධුශංක දේශප්‍රිය මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලව ආරච්චි මිය ගේ නම් කාරක සභා වලට ඇතුලත් නොවීම සම්බන්ධයෙන් දිර්ඝව අදහස් සාකච්ජා වු අතර විවිධ නම් යෝජනා වි අවසානයේ නිශ්චිත සංයුතියක් පමනක් කමිටුවලට පත්වූ අතර ඉදිරි වසරේ නව කමිටු පත් කිරිම් සිදු කිරීමේදි අවස්ථා ලබා නොදුන් පිරිසටද අවස්ථා ලබාදීමට සාකච්ජා විය.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු **2025. 07. 16 වන දින මහා සභා වාර්තාව ඉහත සංශෝධන වලට යටත්ව ඒකමතිකව මහා සභා සම්මත විය.**

02.සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන - නොමැත.

**03.සභා රැස්විමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ජයලාල් මහතා:-

1. **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී .මහින්ද මහතා 2025.8.12 දින, එනම් අද දින අසනීප වීම හේතුවෙන් මහා සභාවට සහභාගිවිමට නොහැකි බැවින් නිවාඩු ඉල්ලීම්කර ඇති අතර එම නිවාඩුව ලබාදීමට මහා සභා එකඟත්වය ලබාදීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-

**එම යෝජනාව ස්ථිර කරමි.**

**සභා මතය විමසීමෙන් අනතුරුව ගරු ප්‍රාදේශීය මන්ත්‍රී එච්.වී .මහින්ද මහතා 2025.8.12 දින, එනම් අද දින අසනීප වීම හේතුවෙන් මහා සභාවට සහභාගිවිමට නොහැකි බැවින් නිවාඩු ඉල්ලීම්කර ඇති අතර එම නිවාඩුව ලබාදීමට මහා සභා එකඟත්වය ලබාදීමට ඒකමතිකව තීරණය විය.**

2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂණ නාපාවල මහතා:-

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සුධීරා සේමිණි ලියනගේ මිය හට 2025.8.12 දින, එනම් අද දින අසනීප වීම හේතුවෙන් මහාසභාවට සහභාගිවිමට නොහැකි බැවින් නිවාඩු ඉල්ලීම්කර ඇති අතර එම නිවාඩුව ලබාදීමට මහා සභා එකඟත්වය ලබාදීමට යෝජනාකරමි**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-

**එම යෝජනාව ස්තිර කරමි.**

**සභා මතය විමසීමෙන් අනතුරුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සුධීරා සේමිණි ලියනගේ මිය හට 2025.8.12 දින, එනම් අද දින අසනීප වීම හේතුවෙන් මහා සභාවට සහභාගිවිමට නොහැකි බැවින් නිවාඩු ඉල්ලීම්කර ඇති අතර එම නිවාඩුව ලබාදීමට මහා සභා එකඟත්වය ලබාදීමට ඒකමතිකව තීරණය විය.**

04.<u>ප්‍රාදේශීය සභාව අමතා එවනලද සංදේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරිම.</u>

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා:-</u>**

**05. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -නැත.**

**06. යථා පරිදි කල් දී ඇති යෝජනා**
**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා විසින් කරනු ලබන යෝජනා</u> -**

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**06-01. කුරුවිට ප්‍රාදේශීය සභාබල ප්‍රදේශය තුළ වීදි ලාම්පු සවිකිරීමේ සහ නඩත්තු කිරීමේ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂමව සහ ක්‍රමවත්ව සිදුකිරිම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීමට යෝජනා කරමි.**

**<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**ජනතාවගෙන් විවිධ ප්‍රදේශ වලින් ඉල්ලීම් එනවා. දිනකට දුරකථන ඇමතුම් 15, 20ක් එනවා. මේ වීදිලාම්පු ඉල්ලීම් පිලිබඳව. විදිලාම්පු දාන්නයි. අළුත්වැඩියා කරන්නයි. බලප්‍රදේශයේ දැනට විදිලාම්පු 15000 ක් විතර සවිකරලා. වීදි ලාම්පු දාන විදිහ අපි පසුගිය දිනවල සොයා බැළුවා. දිනකට ලාම්පු 10, 12 වගේ තමා දාන්නේ. දැනට කොපමන බල්බ් දාලාද? කොපමන අළුත්වැඩියා කරලද හොයාගන්න බෑ. නිසි ක්‍රමවේදයක් ඕනි. වීදි ලාම්පු වොරන්ටි කාලය තුළ අක්‍රිය නම් අපිට පුළුවන් මාරු කර ගන්න. 2022 අධීක්ෂන වාර්තාවේත් මේ කාරණය තියෙනවා. නමුත් මේවා අළුත්වැඩියා කරන්න , තොරතුරු ගන්න කාර්මික ශිල්පියා ඉතා දිර්ඝ කාලයක් ගත්තා. මේ විධිහට ඉවර කරන්න බෑ. තවත් දිර්ඝ කාලයක් යයි. ගැලපෙන ක්‍රමවේදයක් ඕනි.මේ විදිලාම්පු වැඩේට දැනට අපිට ස්ථිර සේවකයෙක් ඉන්න නිසා වෙන අයව බඳවා ගන්න බෑ. කාඩර් එක සම්පූර්ණ නිසා. කෙටිකාලිනව හෝ සාර්ථක ක්‍රමවේදයක් ඕිනි. එක වීදි ලාම්පුවක් දාන්න යම් මුදලක් තීරණය කරලා ලංසු කැඳවලා සුදුසු අයෙකු කෙටිකාලිනව ගමු. මේ විදිලාම්පු වැඩේ ඉවර කරන්න.මේ කටයුත්තට සුදුසු නිර්ණායක ඕනි. කෙටිකාලින විසඳුමක් විධිහට සාර්ථක වෙයි. මේ කටයුත්ත පිළිබඳව තවත් යෝජනා තියෙනවද?**

**<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී රන්ජන් කීර්ති මහතා -</u>**

**වීදි ලාම්පු අත්‍යාවශ්‍යායි. අපි ගියවරත් දැම්මා විශාල ප්‍රමාණයක් අවශ්‍යා ස්ථාන වලට නගර වලට හන්දි වලට මන්ත්‍රී අධීක්ෂණය යටතේ . ආයතන වලින් මිළ කැඳවලා සුදුසු ඒවා ගත්තේ. නමුත් දැන් බොහොමයක් අක්‍රියයි. නැවත යථා තත්වයට පත් කරමු. ඔටෝ ෂෙල් එක පිච්චෙනවා.**
**කුඩා බල්බ් අතුරු පාරවල් වල දිරලා වැටෙනවා. කොට්ඨාශයේ මන්ත්‍රීවරයා අපහසුතාවට පත් වෙනවා. මල්කැකුළ සභාපතිතුමාගේ කාලේ අපි විදිපහන් සවිකලා. ඒ කාලේ වොරන්ටිය තිබුන ඒවා නැවත යථාවත් කලා. සභාවට අත්‍යවශයි. මේ කටයුත්තට සුදුසු ක්‍රමවේදයක් යොදමු. සූර්ය පැනල් විදුලි බල්බ් සුදුසුයි. බල්බල පිච්චෙන්නේ නෑ. සමහරු කුලී පදනමට**

බඳවාගත් කාර්මිකයා ලවා වතු වලට ලයිට් සවිකරලා. මුදලාලිලගේ වැඩ. අපේ අවශ්‍යතාවට ගත් කාර්මිකයෝ. මේවා ගැටළු.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -</u>

වීදි ලාම්පු මාත් සවි කෙරෙව්වා. ගියවර. පිච්චුන බල්බ් නැවත අළුත් වැඩියා කෙරෙව්වා. තවත් තියෙනවා. අළුත්වැඩියා කරන්න. මේ එරත්න ප්‍රදේශය සුවිශේෂියි. ශ්‍රී පාද බැතිමතුන්ට යාමට වන්දනා කිරිමට යන මාර්ගයට විදි ලාම්පු අත්‍යවශයි. වාරය ආරම්භ විමට පෙර සිදු කිරිම පහසුයි. අවශ්‍ය සේවකයින් බඳවාගෙන කටයුතු කඩිනම් කරමු. සුදුසු අයගෙන් බඳවාගෙන මේ කටයුත්ත සිදු කරන්න.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීණි නයනා ජිවනී අතුකෝරළ මිය -</u>

පසුගිය වසර 5 ක් පුරා කිව්වා මේ සම්බන්ධව. වීදි ලාම්පු ලේඛනයක් නඩත්තු කරලා නෑ. විදි ලාම්පුව සවිකල තැන ඇහුවාම ගෙදරක නමක් කියනවා. ටික දවසකින් ඒ මනුස්සයා ගමෙත් නෑ. මම කියන්නේ කොට්ඨාශ 26 ට මේ ලේඛණ 26 ක් තියාගන්න. ඒක පහසුයි. කුරුවිට නම් ලේඛන අංකය , විදිලාම්පුවේ අංකය, කණුව අංක කල හැකියි. ස්ථානය සඳහන් කල හැකියි. වීදි ලාම්පුව අක්‍රිය නම් ලේඛනය අනුව සොයාගත හැකියි.ඒ වෙනුවෙන් වගකිම දරන අයෙක් පත් කරන්න.සූර්ය පැනල් යනවා නම් අවශ්‍ය නෑ.සවස 4 ටත් සමහර ලාම්පු පත්තු වෙනවා.මිනිස්සු බනින්නේ සභාවට. මේ සභා වාරේ ඉඳන්වත් මේක හදමු. වීදි ලාම්පු 10000 ක් විතර සවි කලාට ඒවා කොහේ තියේද දන්නේ නෑ. පරණ ඒවාටත් අංක කරලා. කොට්ඨාශ මට්ටමින් නිවැරදිව මේ කටයුත්ත කරමු.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

හැම මන්ත්‍රි වරයාම අපේක්ෂා කරනවා. තමාගේ කොට්ඨාශෙ වීදි ලාම්පු දමන්න. මේ පත්වෙලා ඉන්න 46 ම වීදි පහන් සවි කිරිම ට බලාපොරොත්තු තියෙනවා. ඒ වගකීම භාරදිය යුත්තේ කොට්ඨාශෙ මන්ත්‍රි වරයාට. ගලුකාගම නම් ලයිට් කණු දෙකෙන් දෙකට ලයිට්. ඒ තරමට දාලා. අළුත්වැඩියා කරන්නත් තියෙනවා.මේ වන විට නව තාක්ෂනය සහිත බල්බ් තියෙනවා. මගේ කොට්ඨාශෙ ආණ්ඩුපක්ෂෙ මන්ත්‍රි වරයා තමා විදි පහන් දාන්නේ. මට වීදි පහන් 5 ක් දුන්නා මල්කැකුළ සභාපතිතුමා . ඉල්ලලා. රහසේ වගේ දුන්නේ. අගය කරනවා. අපිට දෙන්නේ රු.2500.00 ලයිට් එක. පොඩි එක. ආන්ඩුපක්ෂෙ මන්ත්‍රි ඒක අයින් කරලා ලොකු එකක් සවිකරනවා.ඒ ගලවපු එක වෙනම තැනක ගහනවා.කණුවෙන් කණුවට ලයිට්. ගලුකාගම ආණ්ඩු පක්ෂෙ හිටපු මන්ත්‍රි හැමතැනම ලයිට් දාලා.මම දාපු තැන්වලටම ලොකු ලයිට් දාලා. මම හිතනවා. ඔබතුමා මේ කටයුත්ත සාධාරණව කරයි. මන්ත්‍රිවරු 46 ටම වගකිම දෙන්න. ඔබතුමාලා ප්‍රතිපත්තියක් ඇතුව වැඩ කලේ. 46 ටම වගකිම දෙන්න. පිච්චුන බල්බ් යථා තත්වයට පත් කරන්න. වගකීම දරන අයෙකුට මේ අළුත්වැඩියාව දෙන්න. කලින් ගලවපු බල්බ් එක සභාවට දෙනවාද දන්නෙත් නෑ. එරත්න ශ්‍රී පාද මාර්ගයට විශේෂයෙන් වන්දනා සමයට පෙර අවශ්‍ය විදිපහන් සවි කරන්න. සද්භාවයෙන් කියන්නේ. අපි 46 එකතු වෙලා මේ කටයුත්ත සාර්ථකව කරමු

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී නලින්ද අධිකාරම් මහතා -</u>

වීදි පහන් ආලෝකය ගන්න සවිකලාට ඇත්තටම ජනතාවගේ ආරක්ෂාව ගැන හිතලා නෑ. දැම්ම බල්බ් තෙමෙනවා. මේ පැත්තේ නිරන්තර වැස්ස. විදුලිය සම්බන්ධයෙන් භයානක තත්ව ඇතිවෙන්න පුළුවන්. සුවිච් එක තෙමෙනවා. තාවකාලිකව දාපු තැන. සමහර තැන් පලදායි

නැති තැන්වල දාපු විදිලාම්පු තියෙනවා. ඒකක ප්‍රමාන බලලා නෑ. කණුවෙන් කණුවට සමහර තැන්වල සවිකරලා. වගකීම පවරලා නෑ. සමහර ලයිට් දවලුත් දාලා. නිවලා නෑ. මම පාර දිගේ යනකොට හතක් අටක් නිවලා යන්නේ. ක්‍රමයක් යොදලා නෑ. නඩත්තුවට . වීදි පහන් සම්බන්ධව දත්ත පද්ධතියක් නෑ. මිල්ලවිටියේ 159 ක් තියෙනවා. විදි ලාම්පු. ලඟම ඉන්න කෙනාට වගකිම පවරන්න පුළුවන් . විදි ලාම්පුව නිවන්න.මුළු සභාවටම ක්‍රමවේදය හදන්න. මේ සමහර තැන්වල මම දැක්කා වොරන්ටි කාඩ් එකත් එක්කම විසි කරලා.වැඩක් ඇති අයව වගකීම දරන අයව පත් කරන්න මේ වැඩේට. ස්විච් වහරු දාපුවා එල්ලෙනවා කණ්ඩි පල්ලම්වලත්. වැටුනොත් අවධානම්. සුවිච් එල්ලිලා.ඇත්තටම ජනතා ආරක්ෂාවට අවධානමක්. වගකීම් කාලය තුල අවශ්‍ය ඒවා මාරුකරන්න ඕනි. මාකට් එකේ සුවිච් එකක් රු.125 යි. බිල දාලා තුන්දාස් ගානක. මේවා මිලදි ගන්න හොඳ ආයතන සම්බන්ධ කරගන්න. ප්‍රසාද දීමනා තියෙනවා. නිදහස් මුදල් අයකිරීමෙන් තොරව නඩත්තු කරනවා. විශේෂ වට්ටම් ලබාගන්න. හොඳ ආයතන සම්බන්ධ කරගෙන මිලදි ගැනීම් ගන්න. වගේම ජනතාවගේ ආරක්ෂාව ගැන බලන්න. සුවිච් වලට හොඳ ආවරණ ඕනි. රෙගියුලේෂන් තියෙනවා. ලූස් කනෙක්ෂන්. වයර් ඔහේ එල්ලෙනවා. හරිම අවධානම්. වසමේ මන්ත්‍රිලා, කාර්මික නිලධාරිලා එක්වෙලා නිවැරදිව මේ කටයුත්ත කරමු. නිවැරදි පටිපාටියකට මේක කරමු.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -</u>

විදි ලාම්පු 10000 කට වඩා සවි කලා. රන්ජන් මන්ත්‍රිතුමා හොඳ කිව්වා. විපක්ෂ නායක තුමා ලැබුනේ නෑ කිවා. මේ 10000 ට වඩා ලාම්පු සවි කලේ මේ බලප්‍රෙද්ශයේ. ජනතාවගේ අවශ්‍යතා අනුව කටයුතු සියල්ලම ඉටු කලේ. මේ දැනුවත් කිරිම වැදගත්. අපි සුවිච් එකේ ආරක්ෂාවට දැම්මේ අයිස් කප් වගේ දේ. නමුත් තවත් විශාල මුදලක් යනවා ඒවා වෙනම ගන්න ගියා නම්.අපි වෙනම කප් ගත්තා නම්. නොගැලපෙන තැන්වලට නෙමේ අපි විදි ලාම්පු සවි කලේ ජනතා ඉල්ලිම් වලට අන්ධකාරය නිසා අවශ්‍යතා අනුව . ස්වේච්ජා සංවිධාන,ජනතා නියෝජිතයෝ ජනතාව ඉල්ලපු තැන් වලට දැම්මා. සියයට සියයක් සම්පූර්ණ නැතිව ඇති සමහර තැන් වලින් මුදල් ඉල්ලලා. පැමිණිලි තිබුනා. අපි දන්නෑ තේ වතු වලට ලයිට් දාලා කියලා. මට ගැටළුව මේ සභාවේ මිට පෙර මේ ගැන වචනයක් කියලා නෑ. විදුලි කාර්මිකයා මේ මේකට මැදිහත් වෙලා නෑ. ක්‍රියා මාර්ග ගන්න. විපක්ෂ නායකතුමා කිව්වා විදි පහන් දුන්නෙ නෑ කියලා. රන්ජන් මන්ත්‍රි කියනවා දුන්නා කියලා. මගේ කොට්ඨාශෙ කව්රු හරි වීදි පහන් දානවා නම් මම කැමතියි. කොන්ත්‍රාත් පදනමට ගන්ත කාර්මික ශිල්පියෝ. ගියවර ඒ ලාම්පුව දාපු තැන මාර්ග සලකුනු කලා. තොරතුරු ගත්තා. මුදල් ගෙව්වා මාර්ග සිතියම් ගත කලාට. සමහරු සිරිපාදෙත් ගියා. අපි 25 ක් 30ක් හරි අරන් මේ කටයුත්ත ඉක්මනට නිම කරමු. විදි පහන් අළුත්වැඩියාව. ඒ ඒ කොට්ඨාශෙන්ම ගන්න. අධීක්ෂණය අදාල මන්ත්‍රි වරුන්ට දෙන්න.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සම්පත් රූපසිංහ මහතා -</u>

වීදි ලාම්පු සවිකිරීම තුලින් අනාගතයේ යම් වියදමක් දරන්න වෙයි සභාවටත්. විදුලිබලමණ්ඩලය පුද්ගලීකරණය කලොත් මේ සවි කරන ලාම්පු වලට මුදලක් අයකරයි. මගේ කොට්ඨාශෙත් 60 ගානක් තියෙනවා. පුද්ගලිකරණය උනොත් මුදල් ගෙවන්න වෙයි. නියමිත ක්‍රමවේදයට මේ කටයුතු කල යුතුයි.ගන්න විදිලාම්පුවෙත් නියම ප්‍රමිතිය , අදාල වොට් ගනන, වොරන්ටිය මේ සේරම බලලා නඩත්තුව සොයා බලලා කටයුතු කරන්න.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

මහජන දේපල පුද්ගලීකරනයට විරුද්ධයි. මේ වීදිලාම්පු අපි මුලින් දැම්මේ නගරවලට. මුලින්ම කුරුවිට , කිරිඇල්ල වගේ. විදුලිබල මණ්ඩලෙන් නිර්දේශත් ගත්තා මුලින්. ඒක

පස්සේ වෙනස් වෙලා. මහජන අවශ්‍යතා අනුව දැම්මේ. සවිකරන්න වගකීම ගත්තට ඒක පිච්චුනාම වගකීම ගන්නෑ. වොරන්ටිය යාවත්කාලින කරන්න තිබුනා ඒ නිසි කාලේ දැනුම්දුන්නානම්. මේ කටයුතු වලට නිසි ක්‍රමවේදයක් හදමු. සෙන්සස් ලයිට් සවිකලාට සබරගමුවේ අසාර්ථකයි. ගැලපෙන ලෙස කරන්න තාක්ෂනය අපිට නෑ. සමහර ඒවා මලකඩ බැඳිලා. අයින් කලා. ඒ වගේම අනාරක්ෂිත ක්‍රමවේද. අයිස් කප් යෝගට් කෝප්ප වගේ දේ දාලා තමා සුවිච් පරිස්සම් කරලා තියෙන්නේ. ඒවා හදාගමු නිසි ක්‍රමයක් හදන්න. අපිට මේවගේ කටයුතු කරන්න පොදු සමිතිත් හවුල් කරගන්න පුළුවන්. විදුලි බල මණ්ඩලයෙනුත් උපදෙස් ගමු. සියළු දෙනාගේ සහායෙන් ක්‍රමවත් වැඩසටහනක් හදමු. ඊලඟ සභා වාරය වෙන කොට පුළුවන්. නිසි ක්‍රමවේදය හදමු.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

අපි මේ සියළු කාරණා සැලකිල්ලට ගන්නවා. මේ කටයුත්ත අදාල වන ප්‍රජා සංවර්ධන කමිටුවට වගකීම පවරමු. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවට වගකීම පවරලා ඒක හරහා ක්‍රියාත්මක වෙමු. නව ඒවා නෙමේ . මුලින්ම තියෙන රෙපෙයාර් කරමු. ස්විච් බල්බ් අවශ්‍යතා අනුව මිලදී ගන්න වෙයි. දැනට තියෙන මුදල් සීමාව තුල කරමු. රු. 2053452.84 ක් තමා වීදි පහන් වැය ශිර්ෂයේ ඉතිරිව තියෙන්නේ. දළ සැලැස්මක් හදලා තියෙනවා. කමිටුවේ කාරණා කීපයක් අවධාරණය කරලා ෆෝමැට් එකක් හදලා තොරතුරු ගන්න. කණු අංකය, සවිකල දිනය, අළුත්වැඩියා කල දිනය, වොට් ගනන, සවිකලේ කව්ද? අධීක්ෂණය කව්ද , වොරන්ටි දිනය ආදි වශයෙන්. මේ කටයුතු කඩිනම් කරන්න අපි තාවකාලිකව අයෙක් ගන්න ප්‍රජා සංවර්ධන කමිටුවේ අනුමත කරගෙන ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යවමු.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -</u>

කාර්මිකයන් කීදෙනෙක්ගේ සේවාව ගන්නවාද ? වීදි පහන් අළුත්වැඩියාවටත් විශාල ප්‍රමාණයක් තියෙනවා.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

එක එක කොට්ඨාශෙට වෙන වෙනම ගන්න ගියොත් වැඩේ සංකීර්ණ වෙනවා.දැනට දිනකට ලාම්පු 10,15 අතර අළුත්වැඩියා වෙන්නේ. අපි ඒ අය මගින් ඊට වැඩි ප්‍රමාණයක් සිදු කරවමු. සුදුසුකම් තියෙන අය ගමු. කමිටුවේ කතා කරමු. එන්.වී.කිව් ලෙවල් තියෙන අය ගමු. අපි තුන්දෙනෙක් විතර ගමු. ඒ අයගේ මිල ගනන් අරගෙන කටයුත්ත කරමු. නිර්ණායක හදන්න වෙනවා.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

මන්ත්‍රී වරයාව මීට මැදිහත්කරන්න. අක්‍රිය ඒවා අළුත්වැඩියා කරනකොටත් ඒ බව අදාල මන්ත්‍රී වරයාට දැනුම් දෙන්න.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

අපි මන්ත්‍රී වරයා දැනුවත් කරමු. ඒ අවශ්‍ය ස්ථාන මන්ත්‍රී වරුත් දැනුම් දෙන්න. අළුත්වැඩියා කල යුතු තැන් දෙන්න. අපි ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය අරන් තුන් දෙනෙක් මේ වීදි පහන් අළුත්වැඩියා කිරීමේ කටයුත්තට යොදවා ගමු. සේවාව ලබා ගන්න ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාබල ප්‍රදේශය තුළ වීදි ලාම්පු සවිකිරීමේ සහ නඩත්තු කිරීමේ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂමව සහ ක්‍රමවත්ව සිදුකිරිම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීමටත් දැනට සභා බල ප්‍රදේශය තුළ අක්‍රියව ඇති සියළුම වීදි පහන් කෙටි කාලයක් තුළ අළුත්වැඩියාව සිදු කිරිම සඳහා වීදි පහන් වැය ශීර්ෂයේ ඉතිරි වී ඇති ප්‍රතිපාදන අනුව වීදි පහන් අළුත් වැඩියා කිරීමේ සේවාව මිළ ගනන් කැඳවා සිදු කරගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනීමට ඒකමතිකව මහා සභා තීරණය විය.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

06-02. කඳන්ගොඩ උතුර සුමග ප්‍රජාමාවත කනත්ත අසල සිට ඉදිරියට ඇති මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කඳන්ගොඩ උතුර සුමග ප්‍රජාමාවත කනත්ත අසල සිට ඉදිරියට ඇති මාර්ගය සංවර්ධනය කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

06-03. හිග්ගස්හේන සද්ධාතිස්ස මාවත මිඩ්ලන්ඩ් වත්ත දෙසට යන මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව හිග්ගස්හේන සද්ධාතිස්ස මාවත මිඩ්ලන්ඩ් වත්ත දෙසට යන මාර්ගය සංවර්ධනය කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
06-04. මෙම සභා බල ප්‍රදේශයේ කුරුවිට නගරය ඇතුළු නගර ක්‍රමවත් ලෙස සකස් කිරීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

කුරුවිට නගරය ඇතුළුව සියළු නගර ගැනයි අදහස් කලේ. කුරුවිට නගරයට තියෙන ඉඩම් ප්‍රමාණය, නගර සංවර්ධනයට ගැසට් පත්‍රය අනුව අක්කර නමය හමාරක් තියෙනවා. මේ ප්‍රමාණය මේ වන විට විවිධ හේතු මත අඩුවෙලා. මේ කුරුවිට නගරය පිලිවෙලකට ගොඩ නගන්න ඕනි. දෙල්ගහඹිවිට ඉඩම අක්කර 1 1/4 ක්. මේ භූමිය සම්බන්ධව නිරාකරණය කිරීම් අවශ්‍යයි. අවස්ථා ගනනාවකදි නාගරික සංවර්ධන අධිකාරිය මැදිහත් උනා. පාරිසරික ලෙස සුන්දර නගරයක් බිහිකිරිමට . කැලිකසල බැහැරලිම, ජලනල පද්ධතිය වගේම කාණු පද්ධතිය ක්‍රමවත් විය යුතුයි. පළාත් පාලන ආයතනයක් තියෙන්නේ ඒකට. ගරු සභාව එක් වෙලා සැලැස්මක් හදමු. කාරක සභාවල නියෝජිතයෝ එක් වෙලා අදහස් අරගෙන සුන්දර නගරයක් බිහිකරමු. වැඩපිලිවෙලක් දියත් කරමු. ජනතාවට පහසුකම් තියෙන සුන්දර නගරයක් වීමයි විය යුත්තේ. කුරුවිට කියන්නේම සංචාරක ආකර්ශනයට ලක් උන නගරයක්. විශාල ජනගහනයක් මේ නගරයට දිනපතා ඇදී එනවා. නමුත් වාහනයක් නතර කරන්නවත් තැනක් නෑ. බෝපත් ඇල්ල පෝෂනය වෙන්නේ කුරුගඟෙන්. කුරුගඟ අපවිත්‍ර වෙනවා. කුරුගඟට එක්වෙන වළඳුර මහ ඇල අපවිත්‍රයි. මෙහේ විතරක් නෙමෙයි. තෙප්පනාව හරියෙදි ගඟේ නාන්න බෑ. දෙල්ගමුව හරියත් එහෙමයි. පිරිසිදු ජලය අපවිත්‍ර කරලා. නගරේ වැසිකිළි සියල්ල කුරුගඟට හරවලා. තෙප්පනාවේ හරියෙදි නාන්න වෙන්නේ ඒවා. මේවා නවත්වන්න ක්‍රමවේදයක් හදන්න.මේ වෙළඳසැල් ශ්‍රේණිගත කිරීම් කරන්න. පිරිසිදුකම අනුව කල හැකියි. මහජන සෞඛ්‍ය පරික්ෂක වරුන්ටත් බලතල පැවරීම අද න්‍යාය න්‍යාය තියෙනවා. ඒවා හරියට ක්‍රියාත්මක වීම විය යුතුයි. නැත්නම් මේවා හුදෙක් කතා විතරක් වෙයි. පෙර තිබුන සභා වලත් නගර සංවර්ධනය ගැන බොහෝ දේ කතා කලා. හැකි බෙහෝ දේ සිදු කලා සංවර්ධන කටයුතු. තව පියවරවල් ඉදිරියට තියමු. අනවසර ඉදිකිරීම් ඉවත් කලත් තාමත් පිරිසක් ඉන්නවා. අධිකරණ තින්දු ගනන් ගන්නේ නෑ. නගර සංවර්ධනයට ඇත්තටම කැපවීම් කල අය එලියේ. පක්ෂ පාට අනුව නෙමේ මේ කියන්නේ. සරත්චන්ද්‍ර වගේ ආයතනයක් වැහිලා ගියා. රාජ්‍ය ආයතන , පුද්ගලික ආයතන ,විදේශිකයෝ ගෙන්න ගන්න හැකි සංවර්ධනයක් නගරයට අවශ්‍යයි. මේ නගරයේ තියෙන ගංගා පද්ධතියම පිරිසිදු කල යුතුයි. වගකීමෙන් කියන්නේ ජලය අපිරිසිදු කරන්න කාටවත් නීතියෙන් පවා බෑ. මල් වවලා තීන්ත ගාලා විතරක් බෑ. ගෙදර වගේම නගරයත් පිරිසිදු විය යුතුයි. නාගරික සංවර්ධන අධිකාරිය, භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය සහාය අරගෙන ඒ අයගේ කැපවීම අරගෙන අපි අභිමානවත් නගරයක් හදමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා -</u>

එකහයි. වටිනා යෝජනාවක්. ගරු සභාපතිතුමණි , කුරුවිට විතරක් නෙමෙයි කිරිඇල්ලෙත් සභාව සතු දේපල අයථා පරිහරනයේ තියෙනවා. කිරිඇල්ල බස්නැවතුම ලඟ ඉඩම වසර කීපයක ඉඳන්ම වෙනත් පිරිස් භාවිතා කරනවා. පොදු වැසිකිලියට වෙන්කල භූමිය. වැසිකිලිය ඉදිකිරිමට නොහැකි උනා. කිරිඇල්ලෙ සංචාරයක් කරන්න. පොදු වෙළඳ සංකීර්ණයේ කම්බි දිරලා. මස්කඩය මාළුකඩය ලැලි ගහලා ඉතාමත් අපිලිවෙලයි. අනවසර ඉදිකිරීම් ගනනාවක් තියෙනවා. මම මේ තත්වය පෙරත් දිගින් දිගටම මේ සභාවේ කිව්වා. කිරිඇල්ල ක්‍රීඩා පිටිය තියෙන භූමිය. හොරෙන් පතල් කපනවා. ගංවතුරට යට උනත් ඒක වටිනා ක්‍රීඩා පිටියක්. මැනලා නෑ. කිරිඇල්ල පොදු වෙළඳ සංකීර්ණය පාළු බිමක් වෙලා. ඒක සංවර්ධනය කරන්න වැඩපිලිවෙලක් ඕනි. මාළු කඩේ අප්‍රසන්නයි. අනවසර ඉදිකිරීම් ගැන ගිය වසර පහේම කිව්වා. පුද්ගල තරාතිරම නොබලා කටයුතු කරන්න. පොදු වැසිකිලිය තිබුන ඉඩම, කිරිඇල්ල වෙළඳ සංකීර්ණය ගැන කටයුතු කරන්න. බස් නැවතුම තියෙන තැන ඊට සුදුසු නෑ. එල් හැඩය තිබුණ මුහුණතක් තිබුණා කලින්. නමුත් දැන් එහෙම නෑ. පාළු වෙළඳ සංකිර්ණයත් වෙලා. තිබුණ කඩ

වෙන වෙන තැන් වලට අරන් ගියා මිනිස්සු. කඩ කාමර වහලා දාලා. මම හිතනවා කිරිඇල්ල ගැන අවධානයක් දෙයි. ලබන සතියේ දිනයක් දාගෙන කිරිඇල්ල සංචාරයක් කරලා තත්වය සොයා බලනවා නම් ඉතාම වටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල් කැකුළ මහතා -</u>
කිරිඇල්ල මාකට් එක හදද්දි කඩ හදන්න උනේ පාසැල පැත්තට මූන දාලා. එතන හිටි අයට ඕනි උනා බස් හතරක් විතර ගාල් කරලා ඒ ස්ථානයත් හදන්න. සැලූන් ටේලර් ෂොප් එර් පැත්තට දාන්න එකඟ උනා. මස් කඩ මාළු කඩ එක පැත්තකට ගන්න කිව්වා. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් දළ සැලැස්ම ඇඳලා ඉදිකිරිම් කටයුතු කලේ. මේ කටයුතු ඉවර උනේ නෑ. නිම කිරිමට අවශ්‍යයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනි අතුකෝරළ මිය -</u>
කුරුවිට නගරයේ රථ වාහන ගාල් කිරීම ඉතාම අක්‍රමවත්. සභාවට ඇති බලතල අනුව රථවාහන නතර කරන්න තැනක් හදලා නිශ්චිත වගකීම් පවරලා සභාවටත් ආදායමක් එන විදිහට අතුරු ව්‍යවස්ථා පනවලා ටිකට් පතක් හෝ නිකුත් කරලා වැඩපිලිවෙලක් හදන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලව ආරච්චි මිය -</u>
උප සභාපතිතුමාගේ යෝජනාව ස්ථීර කරනවා. මමත් මේ සම්බන්ධ යෝජනාවක් කලේ . කිරිඇල්ල නගරය ගැන. කිරිඇල්ල නගර සංචාරයකට දිනයක් දාගෙන ඉදිරි කටයුතු කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා -</u>

කිරිඇල්ල නගරයේ ගැටළු විසඳීමට කඩිනම් වැඩ පිලිවෙලක් අවශ්‍යයි.නගරයේ වැසිකිලිය විශාල ගැටළුවක්. සම්බන්ධීකරණ රැස්වීමෙත් මේ ගැන සාකච්ජා කලා. නාගරික සංවර්ධන අධිකාරිය එක්ක එකතු වෙලා මේ වැසිකිලිය ඉදිකිරීමට උපරිමයෙන් කටයුතු කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>
කිරිඇල්ලේ තියෙනවා සභාව නඩුවක් කියලා පුද්ගලයෙක් ඉවත් කරන්න ගත්ත තීන්දුවක්. පෙර පාසැල් ගොඩනැගිල්ල. ඒ ගොඩනැගිල්ලේ සන්තකය ආපසු ගැනීම සිදු කලාද? ඒ ඉඩම සභා දේපලක්. උසාවියේ තින්දු උනා ඒක ආපසු ගන්න. වටිනා ඉඩමක්. ඒ ගැන කටයුතු කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -</u>
ඉතාම වැදගත් මාතෘකාවක්. කුරුවිට නගරය ප්‍රදේශ කීපයක අග නගරය වගේ. ඒත් බස් නැවතුමට යන්න බෑ. ලොකු වලවල් හැරිලා. වාහන නතර කරනවා හැමතැනම. එක එක තැන්වල වාහන නතර කරන්න බෑ. විධිමත් සැලැස්මක් ඕනි. විශේෂයෙන් නමක් දාලා තියෙන ගොඩනැගිල්ලක බුලත් කෙල ගහලා ඉතාමත් අපිරිසුදුයි. දුම්රිය ඉඩමේ ගොඩනැගිල්ල හදලා තාමත් වහලා දාලා කෝච්චියත් එනවළු. කෝච්චිපාර එනකොට ගොඩනැගිල්ල කැඩෙයිද? මේ නගරය ක්‍රමවත්ව ඉදිකිරීමෙන් විවේකයේ නගරය බිහිකරමු. නගරයේ කඩවල අප ජලය, සියල්ල මුදා හරින්නේ පිටුපස ඇති ඇල මාර්ගයට. අවධානය දෙන්න. නීතිමය තත්වය වතුර අපිරිසිදු කරන්න බෑ. කාටවත්. නීතිය ක්‍රියාත්මක කරන්න. බුලත් කෙල ගැසීමයි. වාහන නතර කිරීමයි. හැම තැනම. නීතිමය තත්වයට ගන්න. හොඳ කුරුවිට නගරයක් හදන්න. සිරීපාදේ යන්නේ ජනතාව මේ නගරය හරහා . කුරුවිට එරත්න ඇතුළුව විධිමත් වාහන සැලැස්මක් හදන්න. කිරිඇල්ලත් බලන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂණ නාපාවල මහතා -

රන්ජන් මන්ත්‍රීතුමා දැක්වූ අදහස් අනුමත කරනවා. සියළු නගර එකයි. නගර, උප නගර සියල්ලම අපි හොඳ සංවර්ධන තත්වයකට ගන්න ඕනි. නීතියට අවනත නොවී , පුද්ගලික අවශ්‍යතා මත කාටවත් ක්‍රියා කරන්න බෑ. ඒවාට විරුද්ධව නීතිමය කටයුතු කරන්න. වැරදි කියයි, බනියි. නමුත් අනාගතයේදී කියයි හොඳ දෙයක් කලා කියලා. අතීතය ගැන අඩුවෙන් කතා කරලා වර්තමානය ගැන කතා කරලා කාලය ඉතිරි කර ගමු. ඉදිරියේ අනාගතයට අවශ්‍ය සංවර්ධන මාවත කරා යමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

පසුගිය දිනක සභාවේ ගරු සභාපතිතුමා,මන්ත්‍රීතුමන්ලා පිරිස එකතු වෙලා නගරය පිරිසිදු කලා. ස්තූතියි ඒ කටයුත්තට. මම හැමදාම දකිනවා රන්ජන් මන්ත්‍රී තුමා ඉඩංගොඩ නගරය ගැන කියනවා. ඒ මන්ත්‍රීතුමා විපක්ෂෙ හින්දද මන්දා. ඉඩංගොඩ ගැන දිගින් දිගටම කියන්න වෙලා. කිරිඇල්ලට දෙන අවධානය මදි. ඉඩංගොඩ නගරයත් සංවර්ධනය කල යුතුයි. ගිය ආණ්ඩුව කාලෙත් මම මේ නගර සංවර්ධනය ගැක කතා කලා. කුරුවිට සමූපාකාරයේ උඩ තට්ටුවට නැග්ගාම පේනවා අපජලය ඇලට එක් වෙන තරම. මම වීඩියෝත් කලා. වළදූර ඇලට රිසිවේෂන් තියෙනවාද? සාමාන්‍ය ඇලකට අඩි 24 ක රිසිවේෂන් තියෙනව නේද? මේ ඇලට නම් රිසිවේෂන් නෑ. ඇලේම කිට්ටුව ඉදිකිරීම් කරලා. සියළු අපජලය මිනිස් බැහැරකිරීම් සියල්ල මේ ඇළට දාන්නේ. අද ගිහින් බලන්න. පේනවා. මම එදාත් කිව්වා. පියවර ගත්තේ නෑ. ඇලකට තිබිය යුතු නිදහස් ඉඩම් ප්‍රමාණය ඇරලා නෑ. මාස ගානකට වතාවක් නගරය සුද්ද කරලා වැඩක් නෑ. ප්‍රායෝගිකව පැවැත්මක් නෑ. අපි 46 එකතු උනොත් , උත්සහා කලොත් සුන්දර නගරයක් හදන්න පුළුවන්. රටේ ප්‍රධාන ගංගාවක් නගරය මැද්දෙන් ගලන්නේ. අපි නගරය පිරිසුදුව සුන්දරව පවත්වාගැනීම ප්‍රායෝගිකව කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල මුණසිංහ මහතා -

ඉතාම කාලෝචිතයි. දිර්ඝ කාලයක් මම ග්‍රාම නිලධාරී ලෙස කුරුවිට වැඩ කලා. අඩුපාඩු රැසක් තියෙනවා. සිනමාහල පාර කොටස ඉතාම අපිරිසිදුයි. ඒ කොටස තියෙනවා ජලජ කොටසක්. ඒ කොටස අයිති කෝනාර මහත්තයා කැමතියි ඒ ඉඩම පරිසර අලංකරණ පද්ධතියක් ලෙස සංවර්ධනය කරන්න. අවස්ථාවක් දෙමු. වළදූර මහ ඇලට අපද්‍රව්‍ය එකතු වෙනවා. වගේම බැකෝ පතල් මඩ, එකතු වෙලා. අපි මේ තත්වය ඉවත්කරලා පිරිසිදු නගරයක් හදමු. කුරුවිට නගරය ගැන අදහස් දැක්වූවාට ස්තුතියි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.මහින්ද ගුණසිංහ මහතා -

දේශීය හා විදේශීය සංචාරක ආකර්ශනය දිනාගත් ප්‍රෙද්ශයක්. ඒ ආකර්ශනීය ප්‍රදේශ සහිත මේ නගර සැලැස්මක් සහිතව, වැඩි අවධානයක් සහිතව , පහසුකම් ඇති නගර බවට පත් කරමු. උප සභාපතිතුමාට ස්තුතියි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

ඉඩංගොඩ බිල්ඩිමේ වහලේ නෑ. ගංජා කාරයෝ පාවිච්චි කරන්නේ. විශේෂ අවධානයක් ඕනි. බස් එකක් එතකං නගරයේ ඉන්න තැනක් නෑ. මේ සතිය තුලම ශ්‍රමදානයකුත් දාමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -

කුරුවිට නගරය පිලිබඳව මීට පෙරත් යෝජනා කලා සංචාරක අමාත්‍යාංශයට, නගරයේ විවේක ගන්න පුළුවන් විධිහට ස්ථායක් හදන්න. උද්‍යානයක් විදිහට, පවුලකට ඇවිත් විවේකයෙන් ඉන්න පුළුවන් තැනක් නගරය ආසන්නයෙන්ම හදන්න පුළුවන් නම් වැදගත්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා -

තෙප්පනාවේ නාන්නේ අපවිත්‍ර වතුර කිව්වා. ජල ව්‍යාපෘතියට ගන්නේ ත් ඒ වතුර. සුමන බාලිකාවේ ළමයි කෑම්ප් එකකට ආවා. ඒ ළමයින්ට නාන්න තැනක් තිබුනේ නෑ. හැමතැනම ගඟේ මඩ වෙලා. තොටුපලෙත් බෑ. දෙල්ගමුවට ආවා එතනත් බෑ. පතල් කපලා වතුර මඩ වෙලා. ආපහු ගියා. කුරුවිට නානතොටුපල මුහුනු පොතේ දාලා. වීඩියොත් තියෙනවා. ජඹුරත් නෑ. එතන නානතොටුපල සංවර්ධනය කරන්න. සිරීපාදේ යනකොට කුරුවිට නානතොටත් වැදගත්. දෙල්ගමුව නානතොටත් වැදගත්. ඒ ස්ථාන අලංකාර කරලා හදමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -

කුරුවිට නගරය, නාගරික සංවර්ධන දෙපාර්තමේන්තුව හා භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව එක්ව තමා සැලසුම් ක්‍රියාත්මක කලේ. එවකට සිටි දේශපාලන නායකත්වය සලිත සභාපතිතුමගේ කාලේත් විවේකයේ නගරය කටයුතු ආරම්භ කරන්න සැලසුම් කලා. ඒඩීබී ගොඩනැගිල්ල ඒකාලේ හැදුවේ. අපි ගංඉවුර සංවර්ධනය කලා. පාලම යටත් සංවර්ධනය කරන්න පුළුවන්. තව බොජුන් හලක් විවේක ගන්න ස්ථානයක් ඕනි. කඩ හදලා, ගසුත් හිටවලා තියෙනවා. උද්‍යානය එතන හදන්න උත්සහා කරමු. එදා හිටිය මැති ඇමතිවරුත් මැදිහත්වෙලා මේ කටයුතු කලේ. ඔබතුමාත් මැදිහත්වෙලා මේ නගරය මේ සැලැස්ම හරි මදි නම් වෙනස් කරලා හරි කරන්න.බස් ස්ටෑන්ඩ් එක හදන්න අවසර දුන්නා. නැවත අපිට භාර දෙනවා කිව්වා.

නමුත් දුන්නෑ. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියෙන් ආදායමත් ගන්නේ.ඒක පවරා ගැනීම කරන්න. ගොඩනැගිල්ල සම්පූර්ණ උනාට පස්සේ දෙනවා කිව්වේ. නගර සැලැස්ම පෙන්නලා කතා කරන්න. සියළු විස්තර තියෙනවා. දෙල්ගහඕවිට ඉඩම අපිට නගරයේ තියෙන එකම ඉඩම.ඒකත් යම් යම් පිරිස් අල්ලගෙන. ඒ පිලිබඳව සොායා බලන්න. එරත්න පාරට හැරෙන ඉඩම පරණ බිල්ඩිම කඩලා එතන ලොකු ගොඩනැගිල්ලක් හදන්න පුළුවන්. නඩුවක් දැම්මට මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඒ අයට මුදල් ගෙවලා. අපි නඩුවට ගියා. අපිට වාසි වෙන තත්වෙක නඩුව තිබුනේ. ඒ හිස් බිම ප්‍රයෝජනවත් බිමක් කරන්න. ජනාධිපතිතුමාට හරි කියලා සහාය අරන් මේ නගරය විවේකයේ නගරයක් කරන්න කටයුතු කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

රීතිය අනුව එක් වතාවකට වඩා මේ විධිහට වරින් වර කතාකරන්න බෑ. ඒ අනුව කටයුතු කරමු.

ගරු ප්‍රාදේශීය සභා සභාපති විකසිත පුෂ්පසූරිය මහතා

රීති අනුව කටයුතු කරමු. ඔබතුමන්ලාම එකඟතාවයට ඇවිත් ඒ අනුව කටයුතු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා -

කිරිඇල්ල නගරයේ ලොකුම ගැටළුවක්. පොදු වැසිකිළියක් නැති එකම නගරය. වැඩියෙන්ම චෝදනාව එන්නේ කුරුවිට ප්‍රාදේශීය සභාවට. කුඩම්මාගේ සැලකිලි. ඉංගිරිය රත්නපුරයට කිලෝ මීටර් 40 ක දුරක් ගිහින් තියෙන ප්‍රධාන නගරය කිරිඇල්ල. ගමනාන්ත ප්‍රවාහන සේවා ගනනාවක් තියෙනවා. හදිසියට වැසිකිළියට කියලා යන්න දිහාවක් නෑ. අවධානය දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

**විවිධ අදහස් ආවා. වැදගත්. කුරුවිට නගරය පිලිබලදව සියළු මන්ත්‍රීතුමන්ලාගේ එකතු කල අදහස් තුලින් අරමුණක් ඇතිව ඉදිරි කටයුතු කරමු. කුරුගහත් වළදුර ඇළත් ජලය පිරිසිදුව තබාගන්න ඒ අවශ්‍ය සියළු ආයතන සම්බන්ධීකරණය කරගමු. භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව සහාය කරගමු. ඉඩම්වල අඩුපාඩු හදාගමු. විවේකයේ නගරය නිර්මාණය කරමු. අතුරු ව්‍යවස්ථා උපයෝගී කරගෙන කුරුවිට නගරය ක්‍රමවත්ව පිරිසිදුව තබාගමු. දැන්වීම් පුවරු ආදියත් එහෙමයි. විධිමත් කරන්න වෙලා. අපි එකතු වෙලා ජීවමාන සැලැස්මක් ක්‍රියාත්මක කරමු. අවශ්‍ය ආයතන වලින් උපදෙස් අරන් තියෙන සැලැස්ම යාවත්කාලීන කරන්න. සභාව එකතු වෙලා විවේකයේ නගරය හදමු.**

ගරු ප්‍රාදේශීය සභා සභාපති විකසිත පුෂ්පසූරිය මහතා

**සියළු අදහස් අරන් ඉදිරියේදි අවශ්‍ය මැදිහත්වීම් කරමු. කුරුවිට නගරයේ සැලසුමට අවශ්‍ය වෙනස්කම් කරලා අදහස් අනුව කරමු. නගරය ගැන අපිට ගැටළු එනවා. නගරයේ අනවසර වෙලදාම් තියෙනවා. සමහරු මම පත් උනාට පස්සෙත් අහනවා කඩ දාන්න. නමුත් මම ඉඩදුන්නේ නෑ. ඉවත්කරන්න කීවා. ඒ වගේමයි තියෙන අනවසර කඩ සම්බන්ධව. අවිධිමත් කඩ. සැලැස්මකට අනුව ඉවත් කරනවා. එකපාරටම නෙමෙයි. අදහස් ගෙන සැලැස්මකට අනුව ඒ කටයුත්ත කරනවා. විවිධ අදහස් පල උනා වාහන නැවැත්වීම සැළසුම් කිරිමට. වාහන නවත්වන ඉඩ ප්‍රමාණයේ විවිධ වෙළදාම් කරනවා. පහුගිය දිනක පොලීසියත් මහජන සෞඛ්‍ය පරික්ෂකත් සමග කතා කලා. ඒ අදහසුත් එකතු කරලා තීන්දු අරන් පියවරෙන් පියවර අපි අනවසර වෙළදාම් ඉවත්කරමු. පලමු දැනුම්දීම දෙවන දැනුම්දිම කරලා ඉවත් වෙන්නේ නැත්නම් අපි නීතිමය කටයුතු කරමු. බදු ගෙවමින් නිත්‍යානුකූලව කටයුතු කරන පිරිසට අසාධාරණයක් වෙන්නේ. අපහසුවෙයි. නවත්වන්න. නමුත් අපි මැදිහත්වෙලා කටයුත්ත කරමු.**

**විශේෂයෙන් වළදුර මහ ඇළ විවිධ අපද්‍රව්‍ය නිසා අපිරිසිදු වීම නවත්වන්න ඕනි. එකවර බැරිවෙයි. සැලැස්මක් ඇතිව කරන්න ඕනි. සාකච්ජා මගින් අවබෝධ කරවමු. දුම්රියත් රුවන්පුර අධිවේගී මාර්ගයත් කුරුවිටට එනවා. කුරුවිට නගරය කේන්ද්‍ර කොට ගෙනයි සියල්ල සිදු වෙන්නේ. මන්ත්‍රී තුමන්ලාගේ අදහසුත් එකතු කරගෙන වෙනස් කරන්න ඕනි දේ මොනනවද බලල කරමු. කෙටිකාලිනව කල හැකි බස්නැවතුමේ වලවල් වහන වගේ වැඩ කඩිනමින් කරමු. එරත්නට හැරෙන තැන වතුර බහින්නෑ. බ්ලොක් එකක්. ඒක හදන්න දැනුම් දුන්නා. නගරයේ බිම පිලිසකර කරන්න අවශ්‍ය ස්ථාන හදන්න ඇස්තමේන්තු කලා. දීර්ඝ කාලිනව කලයුතු දේවල් අපි සැලසුම් කරලා ඒ අනුව කරමු. අපි අනවසර ඉදිකිරිම් , අවිධිමත් සියල්ල නිත්‍යානුකූලව ඉවත්කරනවා. කිරිඇල්ල නගරයත් කඩිනමින් සංවර්ධනය කරනවා. වැසිකිලිය, වෙළඳ සැළ, මාළුකඩ මස්කඩ, පිලිබඳව යෝජනා ආවා. වැසිකිළිය තියෙන තැන මනිනවා. කුරුවිට සභාවට ප්‍රධාන නගර කුරුවිට, කිරිඇල්ල හැරුණ විට පරකඩුවත් උප නගරයක්. අපි මේ කටයුතු ඉදිරියට සැළසුම් සහගතව කරමු. සියළු දෙනාගේ සහාය දෙන්න.**

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව මහා සභාවේ සම්මත විය.

**ගරු උප සභාපති අනිල් ලියනගේ මහතාගේ යෝජනාව අනුව මෙම සභා බල ප්‍රදේශයේ කුරුවිට නගරය ඇතුළු නගර ක්‍රමවත් ලෙස සකස් කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

**06-05. එල්ලාවල කණුග්ගල්ල සහා මාර්ගයේ දන්ලන්ද හන්දියේ ඇති අනතුරුදායක පිහිටීම තත්වය සහා බලතල ප්‍රකාරව ඉවත්** කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**
**එල්ලාවල කණුග්ගල්ල සහා මාර්ගයේ දන්ලන්ද හන්දියේ ඇති අනතුරුදායකව පිහිටීමේ තත්වය සහා බලතල ප්‍රකාරව ඉවත්** කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා -</u>**
එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**
**එල්ලාවල කණුග්ගල්ල සහා මාර්ගයේ දන්ලන්ද හන්දියේ ඇති වංගුවේ තත්වය වෙනස් කරලා බැම්මක් බැදලා. ඒක ඉවත් කලත් නැවතත් අනතුරුදායක ලෙස බැම්ම ඉදිකරලා. සභාවේ මංමාවත් සම්බන්ධ බලතල අනුව, පනතේ වගන්ති ප්‍රකාරව මේ තත්වය ඉවත් කරන්න. මිනිස්සු මායිම් වෙනස් කරගෙන පාරට ඇවිල්ලා. බැවුම් තියෙන වංගුවල ඒ විධිහට කලාම තත්වය වඩාත් අනතුරුදායකයි. ගරු සභාපතිතුමා මේ තත්වය සොයාබලා නීත්‍යානුකූලව ඉදිරි පියවර ගන්න. මාර්ගයේ සීමා ලකුණු කර ඇති පිඹුරු පත ද ඉදිරිපත්කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා -</u>**
මමත් නිතර ගමන් කරන මාර්ගයක්. මේ පාර මීට පෙරත් ආක්‍රමණය කලා.ඒ මාර්ගය නැවත යථා තත්වයට පත් කරලා කාපට් කලා. සීමා ලකුණු කරලා නැති නිසා වසර දෙකක් විතර යනකොට පාර ආක්‍රමණය කරලා. කාපට් කරපු ගැට්ටටම පාර අල්ලලා. බස් ,ලොකු ලොරි වගේ වාහන යනකොට නිතරම අනතුරු වෙලා තියෙනවා. ජීවිත හානියක් වෙන්න පෙර මේ අනතුරු තත්වය වෙනස් කල යුතුයි. මේ ස්ථානය විතරක් නෙමෙයි.සභාවට අයත් මාර්ග වල පොදුවේ පාරවල් ආක්‍රමණය කරලා. මාර්ග වල ආරක්ෂාව වෙනුවෙන් පියවර ගන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභාපති විකසිත පුෂ්පසූරිය මහතා</u>**
අපි පසුගිය දිනක ප්‍රවාහන මහා මාර්ග ගරු අමාත්‍යතුමා සමග සාකච්ජා කලා. බල ප්‍රදේශයේ මාර්ග අනතුරු, වැලැක්වීමට ජනතාවගේ මාර්ග ආරක්ෂාවට කටයුතු සම්බන්ධව කමිටුවක් පිහිටෙව්වා. ඒ හරහා මේ සම්බන්ද කටයුතු දැනුම්දීලා අදහස් දීලා අනතුරු මාර්ග වල තත්වය අඩු කරමු. කාර්මික නිලධාරි වාර්තා අරන් අවශ්‍ය ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභාවේ සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා ගේ යෝජනාව අනුව_එල්ලාවල කණුග්ගල්ල සහා මාර්ගයේ දන්ලන්ද හන්දියේ ඇති අනතුරුදායකව පිහිටීමේ තත්වය සහා බලතල ප්‍රකාරව ඉවත්** කිරීම සඳහා කාර්මික නිලධාරි වාර්තා ලබාගෙන ඉදිරි කටයුතු සිදු කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**06- 06.** **<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**

**එල්ලාවල පාණීය ජල යෝජනා ක්‍රමය ක්‍රමවත්ව සකස් කිරීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

**මෙම කටයුත්ත සඳහා ප්‍රතිපාදන වෙන්කර ගත්තත් සභාව විසිරවීමෙන් පසුව එම කටයුත්ත සිදු උනේ නෑ. ප්‍රාදේශිය සභාව හා සබරගමු පළාත් සභාව ඒකාබද්ධව මෙම කටයුත්ත කරමු. ඉදිරි සම්බන්ධීකරණ කමිටුවට ද ඉදිරිපත් කරන්න.**

ගරු ප්‍රාදේශීය සභා සභාපති විකසිත පුෂ්පසූරිය මහතා

**එල්ලාවල පානීය ජල යෝජනා ක්‍රමය ක්‍රමවත්ව සකස් කිරීමට අවශ්‍ය මැදිහත්වීම් කරමු. ඉදිරි සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන්න.**

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**එල්ලාවල පානීය ජල යෝජනා ක්‍රමය ක්‍රමවත්ව සකස් කිරීමට අවශ්‍ය මැදිහත්වීම් සිදු කිරිමට හා මේ සම්බන්ධයෙන් ඉදිරි සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරිමටද මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**මෙම අවස්ථාවේදී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් අද දවසේ න්‍යාය පත්‍රය දීර්ඝ බවත් සංවර්ධන යෝජනා රැසක් එහි අන්තර් ගත බවත් නමුත් මුදල් ප්‍රතිපාදන තියෙන තත්වය අනුව යම් නිශ්චිත මුදලක් සෑම මන්ත්‍රි වරයාටම වෙන්කිරීමට සලස්වන්නේ නම් න්‍යාය පත්‍රයේ සංවර්ධන යෝජනා තුලින් දිර්ඝ වීම වලක්වා ගත හැකි බවත් කරුණු දැක්විය. එසේම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා ද අදහස් දක්වමින් සියළු මන්ත්‍රී වරුන්ට යම් නිශ්චිතව ප්‍රතිපාදනයක් දිම තුලින් එම මුදල තුල කල හැකි සංවර්ධන කටයුතු සිදුකල හැකි බවත් සෑම මසකම යෝජනා තුන බැගින් ලබාදි දීර්ඝ න්‍යාය පත්‍රයක් සැකසීම ඉන් වලක්වා ගත හැකි බවටත් කරුණු දැක්වීය. මෙහිදි ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා අදහස් දක්වමින් ප්‍රතිපාදන ඇති ආකාරයෙන් මුදල් වෙන්කිරිම සිදු කල යුතු බවට අදහස් දැක්විය. එසේම රීති 7 යටතේ සභිකවරුන්ගේ ඇඳුම සම්බන්ධයෙන් දක්වා ඇති කරුණු අනුව සඳහන් කර ඇති ඇඳුමින් නොමැතිව මහා සභාවට සහභාගී වන අය සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය ගරු මංගල ඩයස් මන්ත්‍රිවරයා විසින් නගන ලද ප්‍රශ්නයට පිලිතුරු වශයෙන් ගරු සභාපති විකසිත පුෂ්සූරිය මහතා විසින් අදහස් දක්වමින් මෙම අවස්ථාවේ එවැනි මෙම සභාවට නොගැලපෙන ඇඳුමක් සහිතව කිසිඅයෙකු සහභාගී වී නොමැති බැවින් එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීම අනවශ්‍ය වන බවත් සඳහන් කරන ලදී.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.එම්.එන්.නාපාවල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.එම්.එන්.නාපාවල මහතා -

**06-07. පත්බේරිය බෝධියංගන මහා විසුද්ධාරාමය පන්සලඅසල මාර්ගයේ, පැත්තක් ගිලාබැස ඇති බෝක්කුව හා එතන සිට එම මාර්ගයේම මීටර් 300 ක් පමන දුරින් ගිලාබැස ඇති බෝක්කු ව සඳහා පැතිබැම්ම දමා මාර්ගය අළුත්වැඩියාකිරීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.එම්.එන්.නාපාවල මහතා

**වර්ෂාවත් එක්ක සේදී ගිහින්. ලේකම් තුමා, කාර්මික නිලධාරි ගිහින් මැනලා තියෙන්නේ. සභාව පිහිටෙව්වාට පස්සේ යෝජනාව ඉදිරිපත් කලේ. මේ පාරේ පුද්ගලික බස්රථ, පාසැල් වැන්රථ යනවා. දැන් ගමනාගමනය කරන්න බෑ. පාරේ තුන්කාලක් විතර සේදිලා ගිහින්. කඩිනම් අවශ්‍යතාවක්.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

**පෝය දවසේ පන්සලට ගියාම නායක හාමුදුරුවොත් කිව්වා පහුගිය කාලේ බෝධිය ළඟ කාණුව දාපු තැනත් බාදනය වෙලාලු. එතනත් හදමු.**

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.එම්.එන්.නාපාවල මහතා ගේ යෝජනාව අනුව පත්බේරිය බෝධියංගන මහා විසුද්ධාරාමය පන්සලඅසල මාර්ගයේ, පැත්තක් ගිලාබැස ඇති බෝක්කුව හා එතන සිට එම මාර්ගයේම මීටර් 300 ක් පමන දුරින් ගිලාබැස ඇති බෝක්කු ව සඳහා පැතිබැම්ම දමා මාර්ගය අළුත්වැඩියාකිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**06-08. පත්බේරිය මැල්වත්ත මාර්ගය මීටර් 350 ක දුර අළුත්වැඩියා කිරීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.එම්.එන්.නාපාවල මහතා -

**පත්බේරිය මැල්වත්ත මාර්ගය මීටර් 350 ක දුර අළුත්වැඩියා කිරීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -

**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.එම්.එන්.නාපාවල මහතා -

**මේ මාර්ගයේ පාසැල් ළමුන් තුන්සීයක් හාරසීයක් විතර දිනකට යනවා. මේක හැකි කඩිනමින් අළුත්වැඩියා කල යුතු තත්වයේ අබලන්ව තියෙන්නේ.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

**දුම්රිය මාර්ගය ආවොත් යන්න තියෙන්නේ මේ මාර්ගය තමා. අවශ්‍ය කටයුතු කරමු.**

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.එම්.එන්.නාපාවල මහතා ගේ යෝජනාව අනුව පත්බේරිය මැල්වත්ත මාර්ගය මීටර් 350 ක දුර අළුත්වැඩියා කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**06-09. පත්බේරිය සිලින්ටන්වත්ත මාර්ගය මීටර් 600 දුර කොන්ක්‍රිට් කිරීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී. එම්. එන්. නාපාවල මහතා -

**පත්බේරිය සිලින්ටන්වත්ත මාර්ගය මීටර් 600 දුර කොන්ක්‍රිට් කිරීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.පී.එම්.එන්.නාපාවල මහතා -

**වතු ජනතාව වැඩිය භාවිතා කරන්නේ. රෝගියෙක් අරන් ගියොත් ලෙඩා මැරෙනවා. ගැබිණි මවකට යන්නබෑ මේ මාර්ගයේ. විශාල ගැටළුවක්. විශාල අතවශ්‍ය තාවක් තියෙනවා.**

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.පී.එම්.එන්.නාපාවල මහතා ගේ යෝජනාව අනුව පත්බේරිය සිලින්ටන්වත්ත මාර්ගය මීටර් 600 දුර කොන්ක්‍රීට් කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා

**06-10. ඉඩංගොඩ සිට හිඳුරංගල හරහා ඇහැලියගොඩ ප්‍රධාන පාර කි.මී.2 කණුව අසල කිරිඇල්ල පාණීය ජල ළිඳ (පැරණි ගම් සභාව විසින් තනා දී ඇති ) ප්‍රතිසංස්කරණය කිරිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා -

**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා -

**නිවාස ගානක ඉල්ලීමක්. වතුර තියෙනවා. ලක්ෂ තුනක් වගේ යයි. ඒක ප්‍රතිසංස්කරණය කරමු.**

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතාගේ යෝජනාව අනුව ඉඩංගොඩ සිට හිඳුරංගල හරහා ඇහැලියගොඩ ප්‍රධාන පාර කි.මී.2 කණුව අසල කිරිඇල්ල පාණීය ජල ළිඳ (පැරණි ගම් සභාව විසින් තනා දී ඇති ) ප්‍රතිසංස්කරණය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

**06-11. ඉඩංගොඩ බොරලැස්ස සුසානභූමිය මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා -

**ඉඩංගොඩ බොරලැස්ස සුසානභූමිය මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ගුණසිංහ මහතා -

**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා -

**අබලන් උන මාර්ගය හදන්න ලක්ෂ පහත් අටත් අතර වගේ මුදලක් යයි. සුසානභූමිය භාවිතා කරන ජනතාවගේ අවශ්‍යතාවක්.**

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතාගේ යෝජනාව අනුව ඉඩංගොඩ බොරලැස්ස සුසානභූමිය මාර්ගය සංවර්ධනය කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**06-12. කිරිඇල්ල බදුවලකන්ද මාර්ගය ඉහලකොටස සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා -</u>**
**කිරිඇල්ල බදුවලකන්ද මාර්ගය ඉහලකොටස සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ඉනෝකා මල්ලවආරච්චි මිය -</u>**
**එම යෝජනාව ස්ථීර කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා -</u>**
**කිරිඇල්ල බදුවලකන්ද මාර්ගය ඉහලකොටස සංවර්ධනය කිරිම අත්‍යාවශ්‍යතාව කටයුත්තක්.**

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. ඩබ්. ජයරත්න මහතා ගේ යෝජනාව අනුව කිරිඇල්ල බදුවලකන්ද මාර්ගය ඉහල කොටස සංවර්ධනය කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ආර්. එල්. නිරෝෂා ලියනගේ මිය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>**

**06- 13. වළඳුර පාසැල ආසන්නයේ බෝධිය අසලින් ඇති අළුත්වත්ත මාර්ගයේ මීටර් 300 ක දුර ප්‍රමාණය සංවර්ධනය කිරීම සඳහා රු.500000.00 ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ආර්.එල්.නිරෝෂා ලියනගේ මිය -</u>**
**වළඳුර පාසැල ආසන්නයේ බෝධිය අසලින් ඇති අළුත්වත්ත මාර්ගයේ මීටර් 300 ක දුර ප්‍රමාණය සංවර්ධනය කිරීම සඳහා රු.500000.00 ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.**
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් රූපසිංහ මහතා -</u>**
**එම යෝජනාව ස්ථීර කරමි.**
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ආර්.එල්.නිරෝෂා ලියනගේ මිය -</u>**
**වළඳුර පාසැල ආසන්නයේ බෝධිය අසලින් ඇති අළුත්වත්ත මාර්ගය. පවුල් 15ක් 20 ක් භාවිතා කරන මාර්ගය. ඒ දුර ප්‍රමාණය සංවර්ධනය කිරිම මග ඇරිලා. සංවර්ධනය කිරිම අත්‍යවශ්‍යයි.**

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ආර්.එල්.නිරෝෂා ලියනගේ මියගේ යෝජනාව අනුව වළඳුර පාසැල ආසන්නයේ බෝධිය අසලින් ඇති අළුත්වත්ත මාර්ගයේ මීටර් 300 ක දුර ප්‍රමාණය සංවර්ධනය කිරීම සඳහා රු.500000.00 ක ප්‍රතිපාදන ලබාදීමට මහා සභාවේ ඒක මතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී ආර්.එල්.නිරෝෂා ලියනගේ මිය -</u>**

**06- 14. නඩුකාරදෙනිය මාරගහයට පිවිසුමේ සිට දුර මීටර් 300 ක් අතර තැනින් තැන ඇති කඩතොළු වසා පිළිකර කිරිමට රු.200000.00 ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් රූපසිංහ මහතා -</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී ආර්.එල්.නිරෝෂා ලියනගේ මිය -</u>**
**මාර්ගය කඩතොළු වෙලා. වාහන ගමන් කරන්න බෑ.**

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී ආර්.එල්.නිරෝෂා ලියනගේ මියගේ යෝජනාව අනුව නඩුකාරදෙනිය මාරගහයට පිවිසුමේ සිට දුර මීටර් 300 ක් අතර තැනින් තැන ඇති කඩතොළු වසා පිළිකර කිරිමට රු.200000.00 ක ප්‍රතිපාදන ලබාදීමට මහා සභාවේ ඒක මතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී ආර්.එල්.නිරෝෂා ලියනගේ මිය -</u>**

**06- 15. නඩුකාරදෙනිය ආරාමය පාර සිට ප්‍රධාන මාර්ගයට පිවිසෙන කොටස හා වැරණියාවක මාර්ගය කාණු පද්ධතිය දුර මිටර් 300 ක් පිළිසකර කිරිමට රු.100000.00 ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.**
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් රූපසිංහ මහතා -</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී ආර්.එල්.නිරෝෂා ලියනගේ මිය -</u>**

**පන්සල පැත්තේ කාණු සමහර තැන් වැහිලා.විශාල වතුර පාරක් මේ ස්ථානයෙන් ගලනවා. පාර ත් යට වෙනවා. පාරේ යන්න බෑ. කාණු පාදලා මේ සංවර්ධන කටයුතුත සිදුකල යුතුයි.**
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් රූපසිංහ මහතා -</u>**
**පාරවල් තිබුනට පාරවල් වල සිමා නිර්ණයක් කරලා නෑ. කාර්මික නිලධාරීත් සම්බන්ධ කරගෙන මේ සීමා නිර්ණය කරගන්න වෙනවා.**
ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී ආර්.එල්.නිරෝෂා ලියනගේ මියගේ යෝජනාව අනුව නඩුකාරදෙනිය ආරාමය පාර සිට ප්‍රධාන මාර්ගයට පිවිසෙන කොටස හා වැරණියාවක මාර්ගය කාණු පද්ධතිය දුර මිටර් 300 ක් පිළිසකර කිරිමට රු.100000.00 ක ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.කපිල අබේසිරි මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>**

**06- 16. කුරුවිට විදුලිබල මණ්ඩලය අසලින් තැඹිලියන දකුණ මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.කපිල අබේසිරි මුණසිංහ මහතා-</u>**

**කුරුවිට විදුලිබල මණ්ඩලය අසලින් තැඹිලියන දකුණ මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂණ නාපාවල මහතා</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.කපිල අබේසිරි මුණසිංහ මහතාගේ යෝජනාව අනුව කුරුවිට විදුලිබල මණ්ඩලය අසලින් තැඹිලියන දකුණ මාර්ගය සංවර්ධනය කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.කපිල අබේසිරි මුණසිංහ මහතා-</u>**

**06- 17. රණවිරුගම සිට ශ්‍රී සමන්පුර මාර්ගයේ ඉතිරි කොටස මීටර් 200 ක් කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.කපිල අබේසිරි මුණසිංහ මහතාගේ යෝජනාව අනුව රණවිරුගම සිට ශ්‍රී සමන්පුර මාර්ගයේ ඉතිරි කොටස මීටර් 200 ක් කොන්ක්‍රීට් කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.කපිල අබේසිරි මුණසිංහ මහතා -</u>**

**06-18. වැවදෙනිය සිට පැරඩයිස් දක්වා ඇති මාර්ගයේ මීටර් 300 ක් කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.කපිල අබේසිරි මුණසිංහ මහතාගේ යෝජනාව අනුව වැවදෙනිය සිට පැරඩයිස් දක්වා ඇති මාර්ගයේ මීටර් 300 ක් කොන්ක්‍රීට් කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි නයනා ජීවනි අතුකෝරළ මිය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා -
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි නයනා ජීවනි අතුකෝරළ මිය -

**06-19. කුරුවිට ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පැරඩයිස් ක්‍රිස්තියානි පල්ලිය අසල සුසානභූමිය හා රණවිරුගම සුසානභූමිය මායිම් සකස්කර නිරවුල්කරගැනීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි නයනා ජීවනි අතුකෝරළ මිය -

මේ සුසාන භූමි වලට විතරක් නෙමෙයි අනිත් සුසානභූමි වලටත් පොදු ප්‍රශ්නයක්. අවට පදිංචි පිරිස් මේ සුසාන භූමිවල ඉඩම් අල්ලගෙන.මේ සුසානභූමි සභාවට පවරාගෙන නැත්නම් පවරා ගන්න. අක්කර ගානක සුසානභූමි මේ වන කොට කුඩා ඉඩම් ප්‍රමාණ වෙලා. මේවා මැනලා කම්බි ගහන්න. මේ සුසානභූමිය පිලිබඳව මංගල ඩයස් මන්ත්‍රීතුමාත් මැදිහත් උනා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -
ක්‍රිස්තියානි පල්ලිය අසල සුසානභූමිය අමාරුවෙන් මලවට ලැබුණේ. හේඩිස්වත්ත ශාන්තිපුර මිනිස්සු තමයි මිහිදන් කලේ. කර්මාන්පුරය දැමීමත් එක්ක ඒක දිලුම් ඇපරල් එකට ගියා. මට විරුද්ධව පෙලපාලිත් ගියා. පස්සේ අමාරුවෙන් අපි පල්ලිය අසලින් කෑල්ලක් වෙන් කරගත්තා.ග්‍රාම නිලධාරි මගින් මැනලා වෙන් කරලා සභාවට දුන්නේ. පවරාගැනීම් කලාද දන්නේ නෑ. ප්‍රාදේශිය ලේකම් යටතේ තියෙන්නේ. මේ ඉඩම් සභාවට පවරා ගැනීම් කටයුතු විධිමත්ව කරන්න. සමහර සභාව සතු ඉඩම් වල හෝටල් හදලා. මේකේ ප්ලෑන කර්මාන්ත පුරයේ අධ්‍යක්ෂ ලග තියෙනවා. සභාවට වෙන් කල ඉඩමක් තියෙනවා. එතන ආදාහනාගාරය හදන්න ඉඳලා ඒක පුස්සැල්ලට ගියා. පැරඩයිස් වත්තේ වතු ජනතාවට සමහර වෙලාවට මරණ වත්තේ දාන්න දෙන්නේ නෑ. මෙතනට ගේන්නේ. වටේ ඉන්න ගෙවල් වල අය විරුද්ධ වෙනවා. මේ සුසානභූමි සීග්‍රයෙන් අල්ලා ගන්නවා. කඩිනම් ක්‍රියා මාර්ග ගන්න. සම්බන්ධීකරනයට හරි දාන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -
මිට පෙරත් මෙවැනි යෝජනා ගෙනාවා. සුසානභූමිවල ඉඩම් ආසන්නයේ පදිංචිකරුවන් අත්පත් කරගෙන. ශාන්ත ජෝකිම් වතුයාය කැරකොප්පුවේ පතල් කපලා. සභාවට පවරාගන්න. කොස්ගල සුසානභූමිය අක්කර 4 දැන් අක්කර එකක් වෙලා. ප්‍රජා ශාලාව කඩාවැටෙන්න යනවා. අපි එකතු වෙලා මේ සම්බන්ධව විනිවිදව කඩිනම්ව කටයුතු කරමු.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -

සියළු අදහස් වැදගත්. මේ සුසානභූමි වගේම තවත් සභාව සතු ඉඩම් තියෙනවා. නමුත් සියල්ල ලේඛනවල නෑ. ඒ නිසා අපි මේකට සැලසුමක් හැදුවා. යම් ආකෘතියකට සියළු විස්තර ගන්නවා. කොට්ඨාශවල සභාව සතු සියළු ඉඩම් වල විස්තර දෙන්න. ඇත්තටම සභාව සතු ඉඩමක් නම් කඩිනමින් නිරවුල් කරගමු. සභාව සතු ඉඩම් බවට ඒ ඉඩම් වල පුවරුවක් ගහමු.මායිම් ලකුණු කරලා ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී නයනා ජීවනි අතුකෝරළ මිය ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පැරඩයිස් ක්‍රිස්තියානි පල්ලිය අසල සුසානභූමිය හා රණවිරුගම සුසානභූමිය මායිම් සකස්කර නිරවුල්කරගැනීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී නයනා ජීවනි අතුකෝරළ මිය</u>**

**06-20. කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් කුරුවිට වසමේ උක්වත්ත පාර ඉතිරි කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී නයනා ජීවනි අතුකෝරළ මිය ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට අයත් කුරුවිට වසමේ උක්වත්ත පාර ඉතිරි කොටස සංවර්ධනය කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී නයනා ජීවනි අතුකෝරළ මිය</u>**

**06-21. කුරුවිට ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට අයත් රණවිරුගම මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී නයනා ජීවනි අතුකෝරළ මිය</u>**

**මේ පාරවල් දෙකේම සංවර්ධන නොකර ඇති ඉතිරි කොටස් වල වැසිකාලයට වතුර පිරිලා යන්න බෑ. දෙකම සංවර්ධනය කරලා දෙන්න.**

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී නයනා ජීවනි අතුකෝරළ මිය ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට අයත් රණවිරුගම මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා -</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>**

**06-22. කුරුවිට ප්‍රාදේශීය සභාව විසින් දීර්ඝ කාලයක් භුක්ති විඳින ලද කුරුවිට නගර මධ්‍යයේ ඇති දුම්රිය ගොඩනැගිල්ල හා භූමිය කොටස ප්‍රාදේශීය සභාවේ භුක්තිය අතහැර බාහිර පුද්ගලයින්ට දුම්රිය දෙපාර්තමේන්තුව හරහා ලබාදී ඇති බව දැනගන්නට ඇති බැවින් මෙම දේපොළ නැවත ප්‍රාදේශීය සභාව වෙත ලබාගැනීමට හා එසේ සිදුවීමක් ඇත්නම් එය සිදුවූයේ කුමණ කරුණකින්ද සම්බන්ධව පරීක්ෂණයක් කර වාර්තාවක් ඉදිරිපත්කරන ලෙස යෝජනා කරමි.**

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් බදු අරන් කඩ කාමර හදලා බදු දුන්නා. දිස්ත්‍රික් සංවර්ධන සභා කාලේ මේ ගොඩනැගිල්ල බදු දුන්නා. අපේ ප්‍රාදේශිය සභාව අනුමැතිය අනුව බදු අය කලා. නගර සංවර්ධනය කලාම කඩ හිමි අය ඉවත් කිරීමේදි ඒ අයට වෙන කඩ දුන්නා. සමහරු නඩු දැම්මා. තවත් නඩු තියෙනවා. පසුගිය සභාව විසිරෙව්වවට පස්සේ දුම්රිය දෙපාර්තමේන්තුව ටෙන්ඩර් දාලා ගොඩනැගිල්ල ,වාහන දාන පාක් එක ටෙන්ඩර් දාලා බදු දීලා. අපි අක්කර නමය හමාරකට බදු ගෙවනවා. අනිත් ගොඩනැගිල්ල නාගරික සංවර්ධන අධිකාරිය සංවර්ධනය කරලා ආපහු දෙනවා කිව්වට දුන්නේ නෑ. දුම්රිය දෙපාර්තමේන්තුවට සභාවේ ආදායමෙන් බදු ගෙවනවා. මේවනකොට ඒ බිම ගොඩනැගිල්ල අන්සතු වෙලා. මේ නගරයේ වාහන ලක්ෂ ගානක් යනවා. නවත්වනවා. නමුත් භූමිය ඉඩ මදි. නගර සංවර්ධන කටයුතු වලටත් භූමිය අවශ්‍යයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -

මංගල ඩයස් මන්ත්‍රි තුමා කිව්ව ගොඩනැගිල්ල සභාව තමා ආදායම කුලිය අරන් තිබුනේ. කුලිය ගෙවන්නේ නැති නිසා සීල් තියලා. නඩත්තුවක් නෑ. කඩා වැටිලා. සියක් නගර සංවර්ධන වැඩසටහනට ඉදිරිපත්කරලා ඒ කාලේ කෝටියක් වෙන් උනා. නාගරික සංවර්ධන අධිකාරියෙන් සංවර්ධනය කලාට පස්සේ ගන්න ගියාම ආයේ දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ගන්න කියනවා. වරින් වර ඉල්ලීම් කලත් ලැබුනේ නෑ. සමුපකාර ගොඩනැගිල්ලට අපි අපේ බිමක් දුන්නා. ගොඩනැගිල්ල ඉදි කරන්න. අපිට බදු දිය යුතුයි. දැනට සභාවට අක්කර නමය හමාරක් කිව්වට එච්චර බදු ගෙවලා නෑ. මේ බදු ගෙවලා තියෙන්නේ කොයි කොටසටද? රථගාල භූමිය සභාව මැදිහත් වෙලා ගරු ආණ්ඩුකාරතුමියට කියලා නවත්වා ගමු. සභාවට ආදායම් එන්න ඕනි. අපිට අයිතිව තිබුන නිසා බදු අයිතිකරු ලෙස ඉදිරිපත් වෙමු. ඇමතිතුමා ගේ සහාය ඉල්ලමු.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

මේ කටයුත්ත නගර සංවර්ධනය එක්ක නාගරික සංවර්ධන අධිකාරිය සිදු කල වැඩසටහනක්. සභාව මැදිහත් උනා. සමුපකාරයට හිලව් ස්ථානයක් දුන්නා. දුම්රිය දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල දුන්නට වඩා පාක් එක ටෙන්ඩර් කලොත් ලොකු අර්බුධයකට යන්නේ. ඔර්ලෝසු කනුව එක්ක තියෙන පාක් එක. ඒ නිසා මම කියන්නේ මේක දුම්රිය දෙපාර්තමේන්තුව එක්ක කතා කරන්න. මේක විතරක් නෙමෙයි රථ ගාලත් ඒ අයට ඕනිළු. මේ සම්බන්ධයෙන් සාකච්චා කරලා විසඳුමකට එමු. නැත්නම් බරපතල කතාවක් නිර්මාණය වෙයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල අබේසිංහ මහතා -

සභාවට වැදගත්ම ස්ථාන දෙකක්. නගර සංවර්ධනයට වැදගත්ම බිමක්. ඒ ඉඩම් ගියොත් නගර සංවර්ධනයට බාධාවක්. මේ යෝජනාව කාලෝචිතයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

අවබෝධ කරගන්න ඕනි මේ දෙක නැති උනොත් නගරයට බලවත් පාඩුවක්. නගරය පැරඩයිස් පැත්තට යනවා. මේ ස්ථානයේ ඉඩ ඇති නිසා මේ ගොඩනැගිල්ල ඉල්ලුවා ව්‍යාපාර වලට. අපි දුන්නෑ. මාලිමාව ආවට පස්සේ තමා මේක දීලා තියෙන්නේ. ඔබතුමන්ලාගේ කාලේ තමා දීලා තියෙන්නේ.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -

අපි පසුගිය දිනක මේ සම්බන්ධයෙන් තොරතුරු සොයා බැළුවා. දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් බිම් සම්බන්ධයෙන් ගැටළු තියෙනවා. දුම්රිය දෙපාර්තමේන්තුවේ මේ සම්බන්ධ නිලධාරින් එක්ක කතා කලා දුරකථනයෙන්. සාකච්චාවක් අවශ්‍යයි කිව්වා. බදු ගැනත් ස්ථාන ගැනත්. මේ නගරය විතරක් නෙමෙයි. දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් ඒ ආකාරයෙන් බදු දෙන්න තීරනයක් අරන්. පසුගිය රජය සමයේ. ක්‍රියාත්මක වෙලා තියෙන්නේ මේ රජය සමයේ. මේවා දුම්රිය දෙපාර්තමේන්තුවේ තීරණ. මේ ගොඩනැගිල්ල අපේ නගරයේ වැදගත් තැනක්. පාක් එකත් එහෙමයි. අපි ඉක්මනට ආණ්ඩුකාරතුමියත් එක්ක කතා කරලා බදු පදනම මත ඉල්ලා සිටිමු. විශේෂයෙන් අපේ මාලිමාවේ ඇමතිතුමාටත් බිමල් රත්නායක ඇමතිතුමාගේ මැදිහත් භාවය ලබා ගමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව මහා සභාවේ සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා ගේ යෝජනාව අනුව

කුරුවිට ප්‍රාදේශීය සභාව විසින් දිර්ඝ කාලයක් භුක්ති විදින ලද කුරුවිට නගර මධ්‍යයේ ඇති දුම්රිය ගොඩනැගිල්ල හා භූමිය කොටස ප්‍රාදේශීය සභාවේ භුක්තිය අතහැර බාහිර පුද්ගලයින්ට දුම්රියදෙපාර්තමේන්තුව හරහා ලබාදී ඇති බව දැනගන්නට ඇති බැවින් මෙම දේපොළ නැවත ප්‍රාදේශීය සභාව වෙත ලබාගැනීම සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමියගේ හා ගරු ඇමතිතුමන්ලාගේ මැදිහත් භාවය ලබාගෙන නැවත එම දුම්රිය ගොඩනැගිල්ල හා භූමිය කොටස ප්‍රාදේශීය සභාවට බදු පදනම මත ලබාදෙන ලෙස ඉල්ලීම් කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

06-23. ඩිජිටෙල් පද්ධති හරහා කටයුතු කිරීමට අවශ්‍යයතාවය ප්‍රාදේශීය සභාව විසින් වැඩිදියුණුකරගෙන යන බැවින් මේ සඳහා සියලුමදෙනාම හෝ අවශ්‍යතාවය ඇති ප්‍රාදේශීය සභා මන්ත්‍රිවරුන්, මන්ත්‍රිවරියන් සඳහා ටැබ් පරිඝනක ලබාදීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් රූපසිංහ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

වට්ස් ඇප් වලින් දැනට අපිට පණිවිඩ ආවත් හැමෝටම ලබා ගන්න බෑ. සමහර අය ළඟ පොඩි පෝන් තියෙන්නේ. සභා වාර්තාවට කොළ විශාල ප්‍රමාණයක් යනවා. විශාල වියදමක් යනවා. 1991 සිට පසුගිය වාර්තා බොහොමයක් මේ සභාවේ නෑ. බලා ගන්න විදිහක් නෑ. ටැබ් එකක් දුන්නොත් මේ සියල්ල පහසු වෙනවා. කැමති අයට විතරයි මේ ටැබ් දීම තුලින් කටයුතු පහසු කරගන්න පුළුවන්. නවින තාක්ෂනය භාවිතයට පහසුවක්.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

නවීන තාක්ෂනය භාවිතයට එකඟයි. නමුත් මේකට තව ක්‍රම තියෙනවා. ණය මුද්ලක් දිලා ගන්නත් පුළුවන්. සභාවේ මුදලට වැය බරක් වෙනවට මම කැමති නෑ. තියෙන බාලම පෝන් එක තියෙන්නේ මට මම හිතන්නේ. මේක පෝන් එකට එව්වත් ප්‍රින්ට් කරගන්නේ නැතිව කියවන්න බෑ. පුද්ගලික ටැබ් ගන්න එක හොඳයි. සභාවෙනුත් මේවගේ දෙයක් කරන්න පුළුවන් වෙයි. ඒත් තව කාලයක් යයි. එතකම් අපි පුද්ගලිකව මේවා කරමු. වෙන ක්‍රම වලට යමු. වාර්තා ලිඛිතව දීම වැදගත්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ජයලාල් පතිරණ මහතා

නවින තාක්ෂණය හොඳයි. විවිධ මිළ ගනන්වලට තියෙනවා. නවින තාක්ෂනය සහිත පෝන් පවා. ඒත් මේ සභාවට මේවා දරන්න බෑ. සාධාරණ නෑ. තියෙන පෝන් වලින් පුළුවන් විදිහට කරමු. ඒ බර සභාවට දෙන්න එපා. මම එකඟ නෑ. පුද්ගලිකව නයක් අරන් කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

සභාවේ මුදල් යොදවන්න එපා. ගෙවීමේ ක්‍රමයකට හැමෝටම ගන්න පුළුවන් ක්‍රමයක් හදමු.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -

නවීන තාක්ෂනය යොදාගැනී මට එකඟයි. නමුත් සභාවේ මුදල් තත්වය පිලිබඳව සැලකිලි වෙන්න ඕනි. අපේ අරමුණ වලත් එකක් මේ ඩිජිටෙල්කරණය. සභාවේ මුදල් යොදවන්නේ නැතිව අපි නවීන තාක්ෂනයට කඩිනමින් යමු.

ඒ අනුව සභාවේ බහුතර අදහස් දැක්වීම අනුව පහත තීරණය මහා සභාවේ සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතාගේ යෝජනාව අනුව ඩිජිටෙල් පද්ධති හරහා කටයුතු කිරීමට අවශ්‍යයතාවය ප්‍රාදේශීය සභාව විසින් වැඩිදියුණුකරගෙන යන බැවින් මේ සඳහා සියලුම දෙනාම හෝ අවශ්‍යාතාවය ඇති ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් සඳහා සභා අරමුදල් නොායොදවා, ටැබ් පරිඝනක ලබාදීමේ වැඩපිළිවෙලක් ,නවින තාක්ෂනය ලබාගැනීමේ වැඩපිලිවෙලක් ක්‍රියාත්මක කිරීමට මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

06-24. කුරුවිට පැරඩයිස්වත්ත නො.74/3 පදිංචි හුසෙයි රෙජිනා යන අයගේ නිවස 2025.06.30 දින සම්පූර්ණයෙන් ගිණිගෙන විනාශවි ඇති බැවින් ඇයට කරුණාසහගත දීමනාවක් ගෙවීමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

මේ පුද්ගලයාට පදිංචි ඉඩමේ ඔප්පුව නැති නිසා ආපදාකළමනාකරනයෙන් ගෙවන්නෙත් නෑ. වන්දියක් ගන්න බෑ. ලාම්පු කුප්පිය පෙරලිලා ගිනි අරන්. කුඩා ලමයි දෙන්නෙකුත් ඉන්නවා. කරුණාසහගත දීමනා පදනමෙන් රු.15000.00ක් දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍ර කුමාර් මහතා

2025 ජනවාරි මාසයේ චක්‍ර ලේඛනයක් නිකුත් කරලා තියෙනවා ඒක අනුව වතුනිවාස වල ආපදාවකදි ගෙවන්න පුළුවන් උපරිම මුදල රු. 10000.00කට සීමා කරලා. ඒ පවුලේ ලමයි දෙන්නෙකුත් ඉන්නවා. සභාවෙන් කල හැකි උපරිම සහනයක් කරන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතාගේ යෝජනාව අනුව කුරුවිට පැරඩයිස්වත්ත නො.74/3 පදිංචි හුසෙයි රෙජිනා යන අයගේ නිවස 2025.06.30 දින සම්පූර්ණයෙන් ගිණිගෙන විනාශවී ඇති බැවින් ඇයට කරුණාසහගත දීමනාවක් ලෙස රු.15000.00 ක දීමනාවක් ලබාදිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා

06-25. තෙප්පනාව පහලගම හාල්කඩය අසල අතුරුමාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා -

තෙප්පනාව පහලගම හාල්කඩය අසල අතුරුමාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා ඉනෝකා මල්ලවආච්චි මිය-

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා -

කලින් බැම්ම උස්සලා ගහලා නිසා වතුර බහින්නේ නෑ. ගෙවල් ලගින් පාර නතර වෙලා. එතන ඉතිරි කොටස මඩ වලක් වෙලා. සංවර්ධනය කල යුතුයි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතාගේ යෝජනාව අනුව තෙප්පනාව පහලගම හාල්කඩය අසල අතුරුමාර්ගය සංවර්ධනය කිරීමට ඒකමතිකව සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා -

06-26. තෙප්පනාව මිනිවන්දෙනිය තලගහකන්ද අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. හරිසිංහ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා -
තෙප්පනාව මිනිවන්දෙනිය තලගහකන්ද අතුරු මාර්ගය සංවර්ධනය කිරිම ජනතාවට පහසුවක්.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතාගේ යෝජනාව අනුව තෙප්පනාව මිනිවන්දෙනිය තලගහකන්ද අතුරු මාර්ගය සංවර්ධනය කිරිමට ඒකමතිකව සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා -
06-27 . තෙප්පනාව ඉහලගම අමුණගොඩ මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.
ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා -
වෙල කොටස සංවර්ධනය වෙලා නෑ. පවුල් 15 ක් විතර භාවිතා කරනවා. පාර හොදාපාළුවට පත් වෙලා. සංවර්ධනය කිරීම අත්‍යවශ්‍යයි.
ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතාගේ යෝජනාව අනුව. තෙප්පනාව ඉහලගම අමුණගොඩ මාර්ගය සංවර්ධනය කිරීමට ඒකමතිකව සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.සිසිර සේනාරත්න මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා -
06-28 . දෙවිපහල වසම කිරිබත්ගල පන්සල අසල මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.සිසිර සේනාරත්න මහතා

දෙවිපහල වසම කිරිබත්ගල පන්සල අසල මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.සිසිර සේනාරත්න මහතාගේ යෝජනාව අනුව

දෙවිපහල වසම කිරිබත්ගල පන්සල අසල මාර්ගය සංවර්ධනය කිරීමට ඒකමතිකව සභා තීරණය විය.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.සිසිර සේනාරත්න මහතා -

06-29. බෝධිමළුව වසම පාලුවත්ත පීල්ල පාර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.සිසිර සේනාරත්න මහතාගේ යෝජනාව අනුව බෝධිමළුව වසම පාලුවත්ත පීල්ල පාර සංවර්ධනය කිරීමට ඒකමතිකව සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.සිසිර සේනාරත්න මහතා -

06-30. මෝලකැලය අබේමහතාගේ නිවස අසල මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.සිසිර සේනාරත්න මහතාගේ යෝජනාව අනුව මෝලකැලය අබේමහතාගේ නිවස අසල මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීමට ඒකමතිකව සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි තනූජා දීපානි චන්ද්‍රිකා මිය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා

06-31. කුරුවිට නගරයේ නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා ජල හා සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීමට විධිමත් ක්‍රමයක් සැකසීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි තනූජා දීපානි චන්ද්‍රිකා මිය -

කුරුවිට නගරයේ නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා ජල හා සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීමට විධිමත් ක්‍රමයක් සැකසීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ආශා සමන්කුමාරි මිය -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි තනූජා දීපානි චන්ද්‍රිකා මිය -

කඩ කාමර 36 ක් තියෙන මේ ගොඩනැගිල්ල නගරයේ පැරණිම ගොඩනැගිල්ල.ඒ කඩකාමර 36 ටම වතුර නෑ. සනීපාරක්ෂක පහසුකම් නෑ. ඒ පිලිබඳව මීට පෙර හඬක් නැගුවත් වෙළඳ සංගමයේ ලේකම් ලෙස මම, ඒ ඉල්ලීම් වලට ප්‍රතිචාර තිබුනේ නෑ. වසර ගනනක අපි ඉල්ලුවා ප්‍රජාවගේ වියදමෙන් හදන්න. අවස්ථාවක් දුන්නේ නෑ. 2018 මම වෙළඳ සංගමේ ලේකම් කමින් ඉවත් උනා.ඒ අවශයතාවය යටපත් වෙලා ගියා. දැන් කඩ වැහිලා.වැසිකිලි නෑ. වතුර නෑ. ඒ සංකීර්ණය බඩු ගබඩා බවට පත් වෙලා. නගරේ අපකීර්තියට පත් උන තැනක් වෙලා. අන්වර්ත නම් දාලා මේ ගොඩනැගිල්ලට. ජනතාවගේ අපහසුකම් ගනන් ගන්නේ නෑ. ලස්සන නගරයක් බිහිකරන්න නම් මේ ගොඩනැගිල්ලේ පහසුකම් දීලා සංවර්ධනය කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

ඒ නම දැම්මේ මම. ඒකට හේතු සහිතවයි දැම්මේ. මේ සැලැස්ම හැදුවේ කොළඹින් ආපු පිරිස. මම ඒ රැස්වීමට එනවටත් කැමති උනේ නෑ ඒ අය . මේ ගොඩනැගිල්ල ඇතුලට කවර් කරලා හදලා. පිටතට මුහුනත නෑ. වොෂින්ටන් ඩීසි වගේ. වැසිකිලි නෑ. වතුරත් නෑ. මේකේ උඩ මල් ගස් නැති උනාට පාක් එකක්. මිනිස්සු විවිධ අපචාර කටයුතු මේකේ කරනවා. ගඳයි. අපවිත්‍රයි. කාන්තාවකට යන්න බෑ . ප්‍රමිතියක් නෑ. ඒ බිල්ඩිමේ ඉඩ තියෙනවා. යම් කොටසක් හිස් ඉඩක් ලෙස තියෙනවා. ඒ ඉඩ ප්‍රමාණතුල එක තට්ටුවකට එක ගානේ වැසිකිලි හදන්න පුළුවන්. ගිහින් බලන්න.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

නාගරික සංවර්ධන අධිකාරියයි , භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවයි සැලසුම දුන්නේ. ඒ ලොවෙත් කිව්වා වතුර ගැන. ඒකෙදි අපේ අදහස් ගත්තේ නෑ. අන්තිමට ගැටළු විතරයි අපිට. වැසිකිලි නෑ. අවස්ථා ගනනකදි කිව්වත් ඒ අයගේ විධිහට තමා හැදුවේ. රටේ මුදල්. තාක්ෂනික ක්‍රමවේදයක් අනුව වතුර උඩට ගන්න වෙන්නේ. ක්‍රමවේදයක් හදමු. ඒ වගේමයි මේ කඩ පුද්ගලයින්ට වෙනස් කරන්න දෙන්න බෑ. සභාවේ අවසර නැතිව. මේවා ගැනත් සොයා බලන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -

හිටපු පාලකයෝ කලේ නෑ කිව්වට ලක්ෂ ගානක් වෙන් කරලා වතුර දෙන්න හදන කොට විරෝධතාවක් දක්වලා ඒක සිදු උනේ නෑ. කුරුවිට නගරය අවිධිමත්ව තියෙද්දි මේ බිල්ඩිම හදලා පහත මාලයේ සාර්ථකව වෙලඳාම කරනවා. යම් අඩුපාඩු තිබුනත් ඒ භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තුමිය මේ ගැන උනන්දු උනා. කැපවීම් කලා. කුඩා නගර ජලය හරි වතුර දෙන්න ක්‍රමයක් හදලා. ඉහල මහලේ කඩ ගත්තට ව්‍යාපාර සාර්ථක උනේ නෑ. සාර්ථක වෙන දේවල් වලට යොදවන්න. අඩුපාඩු හදන්න .

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් රූපසිංහ මහතා -

පුද්ගලික පන්තියකට අරන් ඉහල මහල. එතුමා පුද්ගලික මුදලින් යම් තත්වෙකට අරන්. සභාවෙන් සහාය දුන්නොත් යම් තත්වයකට ගන්න පුළුවන්. ආර්ථික වටිනාකමක් එයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල මුණසිංහ මහතා -

ගයාන් මන්ත්‍රීතුමාත් එක්ක අපි ගියා මේ ස්ථානයට. නිරීක්ෂනය කලා.රැකගතයුතු ස්ථානයක්. නැවත යථා තත්වයට ගන්න කටයුතු කල යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -

මේ යෝජනාව පිලිබඳව අපේ කාලෙත් කථා කලා. කඩ දැම්මට වැසිකිලි කැසිකිලි නැතිව බෑ. වතුර නෑ. මිනිස්සු අපහසුතා නිසා කඩ වහලා ගියා. දැන් මේ ස්ථානය අවභාවිත තැනක් වෙලා. ගරු සභාපතිතුමා මේ ස්ථානය සුබෝපභෝගී ස්ථානයක් කරන්න. ජනතාව එයි. වැසිකිලි හදන්න ඉඩ තියෙනවා. කාර්මික නිලධාරි එක්ක ගිහින් බලන්න.වගකිම මේ සභාවට. අපි සහාය දෙන්නම්. මේ ස්ථානය සංවර්ධනය කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

මම මිට පෙරත් මේ සභාවේදි කිව්වා ඔය අඩුපාඩු ගැන. ආයේ නැවතත්කථා වෙනවා. අර අන්වර්ථ නාමයට මම විරුද්ධයි. රටේ ජනතා මුදලින් හදපු , අපේ නගරයේ ඉදිකිරිමක්. කතා කරන්නේ ගිය සභාවේ නොකල දේ ගැන. ඊලඟට එන සභාවේත් මේ දේම කතා කල යුතු නෑ. මේ අඩුපාඩු හදමු. ඒකේ උඩ තට්ටුවට යන්න බෑ. සභාවෙන් පඩි ගෙවන සේවකයෙක් හිටියා. දැන් නෑ. විශබීජ ගොඩක් වෙලා. විනිවිදව මේවාට වියදම් කරලා ඒක ගොඩ නගන්න. ප්‍රතිපාදන එක පාර්ශවයකට දුන්නට යම් දේකදි අගෞරවය එන්නේ හැමෝටම. චෝදනාව සියළු දෙනාටම.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි තනූජා දීපානි චන්ද්‍රිකා මිය -

හැකි ඉක්මනට මේ අඩුපාඩු හදලා දෙන්න. වෙළඳ ප්‍රජාව නගරයේ සංවර්ධන කටයුතු වලදි දැනුවත් කරලා හවුල් කරගන්න. වෙළඳ සංගම් වලට දැනුම් දෙන්න.සැලසුම් කරද්දි ඒ ජනතාවත් එකතු කරගන්න.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -

කුරුවිට නගරයේ ඉදිරි සැලසුම්වලදි ව්‍යාපාරික ප්‍රජාව එකතු කරගෙන කටයුතු කරමු. ඒ වගේම ව්‍යාපාර අවස්ථා වැඩිකල යුතුයි. මැදිහත් වෙනවා. කලින් සභා වලත් කිව්වා. නගරයේ ගොඩනැගිල්ලකට එවැනි නම් මේ ස්ථානයේ භාවිතා කරන්න එපා. අපි අඩුපාඩු හදමු. අතීතය අපිට හදන්නබෑ. අපි නිවැරදිව අඩුපාඩු හදමු. සනීපාරක්ෂක කටයුතු ගැන අවශ්‍ය මැදිහත්වීම් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි තනූජා දීපානි චන්ද්‍රිකා මියගේ යෝජනාව අනුව කුරුවිට නගරයේ නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා ජල හා සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීමට විධිමත් ක්‍රමයක් සැකසීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි තනූජා දීපානි චන්ද්‍රිකා මිය -

06-32. දොඩම්පෙ කොට්ඨාශයේ පුනාගම්මානයේ රණසිංහ මහතාගේ නිවස අසල සිට දයාවංශ මහතාගේ නිවස දෙසට ඇති පාර මිටර් 100 ක් කොන්ක්‍රිට් කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි තනූජා දීපානි චන්ද්‍රිකා මියගේ යෝජනාව අනුව දොඩම්පෙ කොට්ඨාශයේ පුන්‍යාගම්මානයේ රණසිංහ මහතාගේ නිවස අසල සිට දයාවංශ මහතාගේ නිවස දෙසට ඇති පාර මීටර් 100 ක් කොන්ක්‍රීට් කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි තනූජා දීපානි චන්ද්‍රිකා මිය -

06-33. මිල්ලකඩේ කුමුදුනී කලටුආරච්චි මියගේ නිවස අසල සිට ආර්.එම්.යසවර්ධන මතාගේ නිවස දෙසට ඇති මාර්ගය මීටර් 200 ක් කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි තනූජා දීපානි චන්ද්‍රිකා මියගේ යෝජනාව අනුව මිල්ලකඩේ කුමුදුනී කලටුආරච්චි මියගේ නිවස අසල සිට ආර්.එම්.යසවර්ධන මතාගේ නිවස දෙසට ඇති මාර්ගය මීටර් 200 ක් කොන්ක්‍රීට් කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

( ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි බී.එල්.සුධීරා සේමිණි මිය මෙදින මහා සභා රැස්වීමට සහභාගී නොවූ අතර එතුමියගේ යෝජනා අංක 06- 34,06-35,06- 36 යෝජනා ඉදිරිපත් නොවිණි.)

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි කේ.ඩී.චූලා ශාන්ති මිය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා

06-37. එල්ලාවල කොට්ඨාශයේ පහලගම වත්තහේන මාර්ගයේ පාර දෙසට කැඩී බිඳී ගොස් ඇති අතර එම ස්ථාන හා කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි කේ.ඩී.චූලා ශාන්ති මිය

එල්ලාවල කොට්ඨාශයේ පහලගම වත්තහේන මාර්ගයේ පාර දෙසට කැඩී බිඳී ගොස් ඇති අතර එම ස්ථාන හා කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි කේ.ඩී.චූලා ශාන්ති මිය

මේ මාර්ගය අබලන් වෙලා. කානු පද්ධතියත් වැහිලා. වහිනකොට වතුර පාරේ පිරිලා. පාසැල් ළමයින්ටත් යන්න බෑ.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි කේ.ඩී.චූලා ශාන්ති මියගේ යෝජනාව අනුව එල්ලාවල කොට්ඨාශයේ පහලගම වත්තහේන මාර්ගයේ පාර දෙසට කැඩී බිඳී ගොස් ඇති අතර එම ස්ථාන හා කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි කේ.ඩී.චූලා ශාන්ති මිය</u>

**06-38.** එල්ලාවල පහලගම වසමේ තවලම වත්ත මාර්ගයේ ඉතිරි කොටස ප්‍රතිසංස්කරණය කිරිමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි කේ.ඩී.චූලා ශාන්ති මිය</u>

කොටසක් කොන්ක්‍රිට් කරලා. ඉතිරි කොටස සංවර්ධනය කරගන්න අවශ්‍යයි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි කේ.ඩී.චූලා ශාන්ති මියගේ යෝජනාව අනුව එල්ලාවල පහලගම වසමේ තවලම වත්ත මාර්ගයේ ඉතිරි කොටස ප්‍රතිසංස්කරණය කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි කේ.ඩී.චූලා ශාන්ති මිය</u>

**06-39.** එල්ලාවල වසමේ අළුත්වත්ත මාර්ගය කොටස ප්‍රතිසංස්කරණය කිරිමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි කේ.ඩී.චූලා ශාන්ති මිය</u>

පාසැල් දෙකකට යන ළමයි යන මාර්ගයක්. වලවල් හැරිලා. වතුර පිරෙනවා.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි කේ.ඩී.චූලා ශාන්ති මියගේ යෝජනාව අනුව එල්ලාවල වසමේ අළුත්වත්ත මාර්ගය කොටස ප්‍රතිසංස්කරණය කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.රන්ජන් ප්‍රදීප් මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>

**06-40.** බ/දොඩම්පෙ කොට්ඨාශයේ සීවලීවත්ත ගම්මානයට සුසානභූමියක් සඳහා ඉඩමක් වෙන්කරගැනීම සහ පුවක්ගහවලවත්ත සුසානභූමියක් ලෙස භාවිතා කලත් එම ඉඩම සභාවට පවරාගෙන නොමැති නිසා එම ඉඩම සභාවට පවරාගැනීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.රන්ජන් ප්‍රදීප් මහතා -

බ/දොඩම්පෙ කොට්ඨාශයේ සීවලීවත්ත ගම්මානයට සුසානභූමියක් සඳහා ඉඩමක් වෙන්කරගැනීම සහ පුවක්ගහවලවත්ත සුසානභූමියක් ලෙස භාවිතා කලත් එම ඉඩම සභාවට පවරාගෙන නොමැති නිසා එම ඉඩම සභාවට පවරාගැනීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.රන්ජන් ප්‍රදීප් මහතා -

සීවලීවත්ත තියෙනවා රජයේ ඔප්පු දුන්න ඉඩමක්. රජයේ මිනින්දෝරුවරයා මැන සුසාන භූමියකට වෙන් කලා. ඒක කව්රුහරි අල්ලගෙන. කිරිඇල්ලේ ප්‍රාදේශිය ලේකම් ලඟ ඇති විස්තර. පැරණි අය කියන්නේ ඒ ඉඩම සුසානභූමියකට වෙන්කල ඉඩම කියලා. ප්‍රාදේශිය ලේකම් ගෙන් ඉල්ලීම් කරලා මේගැන කටයුතු කරන්න. ඒ වගේමයි පුවක්ගහවලවත්ත සුසානභූමියක් ලෙස භාවිතා කලාට සභාවට පවරාගෙන නෑ. අක්කර තුන හමාරක් තිබුනත් දැන් තියෙන්නේ අක්කර දෙකයි. කිරිඇල්ලේ ප්‍රාදේශිය ලේකම් ලඟ ඇති විස්තර අරන් මේක සභාවට පවරා ගන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.රන්ජන් ප්‍රදීප් මහතාගේ යෝජනාව අනුව බ/දොඩම්පෙ කොට්ඨාශයේ සීවලීවත්ත ගම්මානයට සුසානභූමියක් සඳහා ඉඩමක් වෙන්කරගැනීම සහ පුවක්ගහවලවත්ත සුසානභූමියක් ලෙස භාවිතා කලත් එම ඉඩම සභාවට පවරාගෙන නොමැති නිසා එම ඉඩම සභාවට සභාවට පවරාගැනීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.රන්ජන් ප්‍රදීප් මහතා -

06-41. අධිකාරිය ගොරකඇල ප්‍රධාන ගම් සභා මාර්ගයේ කළු ගඟ අසල කොටස ගඟට සේදී යාම නිසා එම මාර්ගය ගඟට සම්පූර්ණයෙන් සේදී යාමේ අවධානමක් පවතින බැවින් මෙම මාර්ගය ආරක්ෂා කිරිමට සුදුසු පියවරක් ගැනීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.රන්ජන් ප්‍රදීප් මහතා -

මේ මාර්ගය 1200 ක් විතර දිනකට පුද්ගලයින් භාවිතා කරන පාරක්. ජීවිත අවධානමක් සිදු විය හැකියි. කාර්මික නිලධාරි පරික්ෂා කලා. මේ පිලිබඳව කටයුතු කරන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.රන්ජන් ප්‍රදීප් මහතාගේ යෝජනාව අනුව අධිකාරිය ගොරකඇල ප්‍රධාන ගම් සහා මාර්ගයේ කළු ගඟ අසල කොටස ගඟට සේදී යාම නිසා එම මාර්ගය ගඟට සම්පූර්ණයෙන් සේදී යාමේ අවධානමක් පවතින බැවින් මෙම මාර්ගය ආරක්ෂා කිරිමට සුදුසු පියවරක් ගැනීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.රන්ජන් ප්‍රදීප් මහතා -</u>

06-42. අධිකාරිය තුන්මංහන්දිය අසල මාර්ගයේ අඩි 150 ක් පමන කොටස සංවර්ධනය කිරිමට ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ඉනෝකා මල්ලව ආරච්චි මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.රන්ජන් ප්‍රදීප් මහතාගේ යෝජනාව අනුව අධිකාරිය තුන්මංහන්දිය අසල මාර්ගයේ අඩි 150 ක් පමන කොටස සංවර්ධනය කිරිමට ප්‍රතිපාදන ලබාදීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -</u>
06-43. එරත්න සූදාගල කොට්ඨාශයේ දොඩම්පෙ කඩේ ඉදිරිපසින් කුරුගඟ හරහා දමා ඇති පාලමේ ඇඳි ගැලවී ඇති බැවින් ඇඳි සවිකිරිමට අහලේ බට 26 ක් ලබාදිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -</u>
මේ පාලමේ පාසලට, පන්සලට ගමන් කරන පිරිස යනවා. ත්‍රී විල් වලට විතරයි යන්න පුළුවන්. ඇඳි ගැලවිලා. ප්‍රභාත් මන්ත්‍රි තුමාත් දන්නවා. එක පැත්තක ඇන්ද ඇත්තේම නෑ. අනෙක් ඇන්ද ඇල වෙලා. ජීවිත ගානකට අනතුරු වෙන්න පුළුවන්. ඔබ තුමා මැදිහත් වෙලා මේක සකසන්න. පාසැල් ළමයි 300 විතර යන්නේ මේකේ. අහලේ බට 26 ක් තමා ඕනි. ජල විදුලි බලාගාරයෙනුත් ඉල්ලුවා. නමුත් දැන් ගම් වලට ඔවුන් සහායක් දෙන්නෑ. පොදු කටයුතු වලට. ඒවාගෙන් සභාවට අයවිය යුතු මුදල් ආදිය එනවාද බලන්න. මට දේශපාලන අරමුණු නෑ. මේ ගමට විශාල සහනයක් මේ දේ කරන්න.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

මේ පිළිබඳව කඩිනම් අවධානය දෙමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් කුමාර ජයනෙත්ති මහතා -</u>
මේ සම්බන්ධයෙන් අවධානය දිම ගැන ස්තූතියි. අපි කාර්මික නිලධාරී සහභාගිකරගෙන ඇස්තමේන්තු කලා. මේ සම්බන්ධයෙන්. ඒත් ඒ මුදලින් කරන්න බෑ. පළාත් සභාවෙන් ලක්ෂ 10 ඉල්ලුවේ. කරගන්න පුළුවන් වේවි. මේ කටයුත්ත කරමු.

**අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා ගේ යෝජනාව අනුව_එරත්න සුදාගල කොට්ඨාශයේ දොඩම්පෙ කඩේ ඉදිරිපසින් කුරුගහ හරහා දමා ඇති පාලමේ ඇදි ගැලවී ඇති බැවින් ඇදි සවිකිරිමට අඟලේ බට 26 ක් ලබා දීම, පාලම යථා තත්වයට පත් කිරිම සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -</u>**

**06-44. එරත්න නගරයේ පොදු වැසිකිලිය සෑදීමට අවශ්‍ය ඉඩමක් තෝරාගෙන සභාවට පවරාගැනීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -</u>**
**රෝහල,විද්‍යාලය,පන්සල, සේරම මේ නගරයේ තියෙනවා. නමුත් වැසිකිලියක් නෑ. හදන්න මුදල් වෙන් කලත් භූමියක් නෑ. එරත්න රෝහලට කථා කරලා ඒ ස්ථානයේ හදන්න හැදුවත් විරුද්ධ වීම් මත බැරි උනා. එරත්න පිට කුඹුරේ ඉඩමේ හදන්න බැළුවත් ඒකටත් විරෝධතා නිසා බැරි උනා. මේ කටයුත්ත අත්‍යාවශ්‍යතාවක්. පර්චස් තුනක් ඇති. සිරීපාද කාලේ ට අත්‍යාවශ්‍යයි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් කුමාර ජයනෙත්ති මහතා -</u>**
**පිංකුඹුර ඉඩම නගරයේ මැද තියෙන්නේ. එරත්න නගරය කේන්ද්‍ර කරගෙන.එරත්නට බස් නැවතුමකුත් නෑ. ඒත් ඉඩමක් නෑ. මම කාර්මික නිලධාරි එක්ක ගිහින් සැලසුම් හැදුවා. සම්බන්ධීකරන කමිටුවටත් දැම්මා. ඒ ඉඩම දෙන්න එරත්න හාමුදුරුවෝ විරුද්ධ නෑ. නමුත් බලංගොඩ ඉන්න හාමුදුරුනමක් තමා විරුද්ධ. නමුත් අපි හමු වෙලා ක්‍රමවේදයක් හදා ලමු. පන්සලට ඒ ඉඩම නෑ කියලත් කියනවා. මුදල් දෙන්නෑ. ස්ථිර ඉඩමක් නැති නිසා.**

**<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**ඉඩම ගැන අවධානය යොමු කරමු. ගැටළු තියෙනවා. නඩුවක් තියෙනවා නම් ඉඩම කොටසක් වෙන් කරගන්න බෑ. එන්තරවාසි එව්වොත් බෑ. රජයේ මුදල් යොදවලත් බෑ. ප්‍රාදේශිය ලේකම් එක්කත් කතා කරමු. මැදිහත් වෙමු.**

**ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා ගේ යෝජනාව අනුව එරත්න නගරයේ පොදු වැසිකිලිය සෑදීමට අවශ්‍ය ඉඩමක් තෝරාගෙන සභාවට පවරාගැනීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ජී.එර්.එස්.මධුභාෂිණී මිය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>**
**06-45. පාතගම ගොඩගම්පල කඩය අසල සිට හපුගහහේන ගල්අමුණ මාර්ගය හතරමං හන්දියේ බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීම ට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ජී.එර්.එස්.මධූභාෂිණී මිය

පාතගම ගොඩගම්පල කඩය අසල සිට හපුගහහේන ගල්අමුණ මාර්ගය හතරමං හන්දියේ බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීම ට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ඉරෝෂා උදයංගනී විජේසිංහ මිය

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ජී.එර්.එස්.මධූභාෂිණී මිය -

මේ පාරේ බෝක්කුව නෑ. කැඩිලා .පාර මෙතන කැඩුනොත් ගම්දෙක දෙකඩ වෙනවා. යන්න වෙන විකල්පයක් නෑ. අත්‍යාවශ්‍ය කටයුත්තක්.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ජී.එර්.එස්.මධූභාෂිණී මියගේ යෝජනාව අනුව පාතගම ගොඩගම්පල කඩය අසල සිට හපුගහහේන ගල්අමුණ මාර්ගය හතරමංහන්දියේ බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ජී.එර්.එස්.මධූභාෂිණී මිය -

06-46. ඌරුපැලැව්ව බෝධිය ඉදිරිපස මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ඉරෝෂා උදයංගනී විජේසිංහ මිය

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ජී.එර්.එස්.මධූභාෂිණී මිය -

මේ පාරේ වාහනයකට යන්න බෑ. මාර්ගය අබලන් වෙලා.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ජී.එර්.එස්.මධූභාෂිණී මියගේ යෝජනාව අනුව ඌරුපැලැව්ව බෝධිය ඉදිරිපස මාර්ගය කොන්ක්‍රීට් කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ජී.එර්.එස්.මධූභාෂිණී මිය -

06-47. පාතගම වීරරත්න මහතාගේ නිවස අසලින් පටන්ගන්නා මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ඉරෝෂා උදයංගනී විජේසිංහ මිය

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ජී.එර්.එස්.මධූභාෂිණී මිය -

මේ මාර්ගයේ පාසැල් ළමුන්ට යන්න බෑ. වහිනකොට හැමතැනම මඩ වලවල්.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ජී.එර්.එස්.මධුභාෂිණී මියගේ යෝජනාව අනුව පාතගම වීරරත්න මහතාගේ නිවස අසලින් පටන්ගන්නා මාර්ගය කොංක්‍රීට් කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>

06-48. මාටුවාගල ගම්මැද්ද ප්‍රදේශයේ පවුල් 1200 ක පමන ජනතාවට අත්‍යවශ්‍ය කරුනක් වී ඇති ජල ගැටළුවට විසඳුමක් ලෙස ජල සම්පාදන දෙපාර්තමේන්තුව මගින් ජලය ලබාගැනීමට ඉල්ලීම්කිරීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතා</u>

මාටුවාගල ගම්මැද්ද ප්‍රදේශයේ පවුල් 1200 ක පමන ජනතාවට අත්‍යවශ්‍ය කරුනක් වී ඇති ජල ගැටළුවට විසඳුමක් ලෙස ජල සම්පාදන දෙපාර්තමේන්තුව මගින් ජලය ලබාගැනීමට ඉල්ලීම්කිරීමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතා</u>

පවුල් 1200 කට වතුර නෑ. ලොකු ගැටළුවක්. අවධානය දෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා -</u>

එතුමාගේ පලමු යෝජනාව අත්‍යවශ්‍යතාවක්. විසල් ජලය දීම මිල්ලකඩෙන් නතර වෙලා. කිරිඇල්ල ජනතාව භාවිතා කරන වතුරවල මිනිස් අපද්‍රව්‍ය පවා තියෙනවාළු. මීට පෙර ජල මණ්ඩලය එක්ක එකතු වෙලා ජල ව්‍යාපෘතියක් කරන්න ස්ථාන පරික්ෂා කලා. මාටුවාගල වත්තේ. ටැංකි හදලා කළු ගගේ වතුර දෙන්න. රජයේ ප්‍රතිපාදන දුන්නේ. කිරිඇල්ල මාටුවාගල බැකෝ පතල් ගහලා සති දෙකෙන් වතුර නැතිව ගියා. අපිට වෙන ජල පෝෂක ඇල දොල නෑ. රෙදි හෝදගන්න බෑ. පිල්ටර් ක්‍රමයකට වතුර දෙන්න පුළුවන්. ඉංජිනේරු තුමා කිව්වා පුළුවන් කියලා. රජය මැදිහත් වෙලා කරලා දෙන්න. විසල් ජලය රාහුල විද්‍යාලය ලගින් නතර වෙලා. කිරිඇල්ලට දැන් දෙන වතුර කිවුල් වගේ. ක්ලෝරින් අධිකව දාලා. කිරිඇල්ලට ප්‍රධාන ගැටළුවක්.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

ජල සම්පාදන දෙපාර්තමේන්තුව ට ඉල්ලීම යොමු කරලා ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතාගේ යෝජනාව අනුව මාටුවාගල ගම්මැද්ද ප්‍රදේශයේ පවුල් 1200 ක පමන ජනතාවට අත්‍යවශ්‍ය කරුනක් වී ඇති ජල

ගැටළුවට විසඳුමක් ලෙස ජල සම්පාදන දෙපාර්තමේන්තුව මගින් ජලය ලබාගැනීමට ඉල්ලීම ඉදිරිපත් කර ඉදිරි කටයුතු සිදු කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතා -</u>

06-49. මාටුවාගල 7 කණුව ප්‍රදේශයේ ප්‍රජා ශාලාවේ ඉතිරි වැඩ කටයුතු නිමකරගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතා -</u>

ගමේ පිරිසට රැස්වීමකට රැස්වෙන්න තැනක් නෑ. මේ ගැන අවධානය දෙන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතාගේ යෝජනාව අනුව මාටුවාගල 7 කණුව ප්‍රදේශයේ ප්‍රජා ශාලාවේ ඉතිරි වැඩ කටයුතු නිමකරගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතා -</u>

06-50. මුදුන්කොටුව ප්‍රධාන මාර්ගයේ පාලම සහිත මාර්ගය කැඩී ඇති හෙයින් එම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතා -</u>

මේ මාර්ගයේ යන්න අමාරුයි. 40000 විතර ජනතාවක් භාවිතා කරනවා. පාලම උඩ ගැලවිලා.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

මේ සම්බන්ධව අදාල අංශ දැනුවත් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතාගේ යෝජනාව අනුව මුදුන්කොටුව ප්‍රධාන මාර්ගයේ පාලම සහිත මාර්ගය කැඩී ඇති හෙයින් එම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට අදාල අංශ දැනුවත් කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා -</u>

06-51. කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් මාර්ග සකස් කිරීමට අවශ්‍ය භියුම්පයිප්ප ලබාගැනීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා -

කාලයක් මේ මාර්ග සංවර්ධනය අවශ්‍ය හියුම් පයිප්ප දුන්නා. දැන් නව මාර්ග රැසක් තියෙනවා. හියුම් පයිප්ප නව හා පැරණි මාර්ග සියල්ලට අවශ්‍යතාවය අනුව ලබාදිම වැදගත්.මේ බල ප්‍රදේශයේ මාර්ගවලට හියුම් පයිප්ප අවශ්‍යතාවය දැඩිව තියෙනවා.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතාගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් මාර්ග සකස් කිරිමට අවශ්‍ය තාවය අනුව හියුම්පයිප්ප ලබාගැනීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා

06-52. පොහොරබාව මොරගමුව මාර්ගය කොන්ක්‍රීට් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා

මේ මාර්ගය දැඩි ලෙස අබලන් වෙලා. ජනතා අවශ්‍යතාවක්.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතාගේ යෝජනාව අනුව පොහොරබාව මොරගමුව මාර්ගය කොන්ක්‍රීට් කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා

06-53. ඕවිටිගම දේවාලපාර කොන්ක්‍රීට් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා

මෙම මාර්ගයත් අබලන් වෙලා. පාර කැඩිලා. කොන්ක්‍රිට් කිරිම අත්‍යාවශ්‍යයි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතාගේ යෝජනාව අනුව ඕවිටිගම දේවාලපාර කොන්ක්‍රීට් කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා

06-54. කඳන්ගොඩ දකුන ග්‍රාමනිලධාරී වසමේ කඳන්ගොඩ තානායම් ගොඩැල්ල පාර මාර්ගය මීටර් 100 ක් කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා

කඳන්ගොඩ දකුන ග්‍රාමනිලධාරී වසමේ කඳන්ගොඩ තානායම් ගොඩැල්ල පාර මාර්ගය මීටර් 100 ක් කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩග්ලස් ප්‍රේමදාස මහතා-

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා

වැහි කාලෙට මේ මාර්ගයේ ගමන් කරන්න බෑ. මඩවෙනවා. මෙම කොටස කොන්ක්‍රීට් කිරීමට අවශ්‍යයි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතාගේ__යෝජනාව අනුව ඕවිටිගම දේවාලපාර කොන්ක්‍රීට් කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා -

06-55. විසල් ජලයෝජනා ක්‍රමය යටතේ දැනට බට එලා ඇති කඳන්ගොඩ තෙප්පනාව මාර්ගයේ පදිංචිකරුවන් සඳහා ජල සම්බන්දතා ලබාදීමට ජල සම්පත් මණ්ඩලය ට දැනුම්දීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා -

පසුගිය පාලන කාලේ කඳංගොඩ මල්වත්තඔිවිට දක්වා මාර්ගයේ බට දැම්මා. ඇතැම් තැවන්වල නල දැම්මට ජලය දිලා නෑ. මේ සම්බන්ධව කතා කරලා මැදිහත් විමක් දෙන්න. කඳංගොඩ, දෙග්ලමුව,මල්වත්ත ඕවිට ප්‍රෙද්ශවල ලිං සකස් කරන්න බෑ. කුඩා ඉඩම්ව විසිකිලියත් ලිඳත් දෙකම හදන්න දුර ප්‍රමාණ නෑ. මේ ජල ගැටළුව අදාල අංශය දැනුවත් කරලා විසඳන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

මේ විසල් ජලය ගලුකාගම, මෝල කැලය, කැන්ද ලන්ද ගම් වලටත් දීලා නෑ. පායනකොට බවුසර් ගෙනත් වතුර දුන්නා. සභාවෙන් බවුසර් දාලා.පාරවල් කපලා. නල දාලා තියෙන්නේ. මේ ගම්මාන උස් බිම්වල තියෙන්නේ. වගුර ගැටළුව තදින් තියෙනවා. ජල ප්‍රශ්නය විසඳලා දෙන්න. බටහිර කාහේන්ගම තේ කැල්ල ,ජනපදේ කොටස සෙoාහොන් කනත්ත අසල අඩි 8

පාර අහල් 5 ක් වත් නෑ. මාර්ගය දිගටම තීරුව. සභාව මරණාදාර සමිතියට පවරලලු. කාණු කපන්න දෙන්නෑ. මේ කොටස රජයේ දේපල වලට හානියක් නොවන විධිහට ඒ අයගෙන් ගන්නපුළුවන්. ඒ ගැන සොයාබලන්න.ආසන්න ඉඩමේ ඉන්න මම තමයි මේ අයට වතුර දෙන්නේ. මට ඒක හිරිහැරයක් නෑ. නමුත් කානු කපන්න දෙන්නෑ. මේ ගැටළුව විසඳන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩග්ලස් ප්‍රේමදාස මහතා</u>

දොරළුබඩවත්ත, පුංචිතැපැල්ගම, පුන්සිරිගම, ඇතුළු ආසන්න ප්‍රදේශ කීපයකට වතුර නෑ. ඒවාටත් ජලය දෙන්න.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා</u> -

විසල් ජලය සම්බන්ධ ගැටළු ප්‍රෙද්ශ ගනනාවක තියෙනවා. මම ජල සම්පාදන මණ්ඩලයට ගියා. අතුරු මාර්ග වලට වතුර දෙන්න කිව්වා. අපි බලාපොරොත්තු වෙනවා සෑම මාර්ගයකටම යම් දුරකට හෝ වතුර දෙන්න ජල සබඳතා අරන්. දීලා නැති තැන් දැනුම්දෙන්න. අපි ජල සම්පාදනය දැනුවත් කරමු. කුරුවිට නගරය හරහා ඉතා ඉක්මනින් ජල සබඳතා දෙනවා. ඒක කඩිනම්ව දෙයි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතාගේ_යෝජනාව අනුව විසල් ජලයෝජනා ක්‍රමය යටතේ දැනට බට එලා ඇති කඳන්ගොඩ තෙප්පනාව මාර්ගයේ පදිංචිකරුවන් සඳහා ජල සම්බන්දතා ලබාදීමට හා බල ප්‍රදේශයේ විසල් ජලය අවශ්‍ය අනෙකුත් ප්‍රෙද්ශවලටද ජල සබඳතා ලබාදෙන ලෙස ජල සම්පත් මණ්ඩලය ට දැනුම්දීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා -</u>

06-56. කඳන්ගොඩ දකුණ වසමේ මල්වත්තඹිවිට මාර්ගය කි.මී.1 ක් පමන තාර දමා ප්‍රතිසංස්කරනය කිරීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා -</u>

තාර පාරක්. දැන් කැඩිලා. වලවල් හැදිලා. ගම් කිපයක ජනතාව භාවිතා කරන මාර්ගය. ගමන් කරන්න බෑ. හැකි ඉක්මනින් හදලා දෙන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතාගේ_යෝජනාව අනුව කඳන්ගොඩ දකුණ වසමේ මල්වත්තඹිවිට මාර්ගය කි.මී.1 ක් පමන තාර දමා ප්‍රතිසංස්කරනය කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>

06-57. යටිපච්ච පාන් කඩය -හම්පලදෙනිය මාර්ගයේ ලෙයාරිස් මයාගේ නිවස අසල තුංමං හන්දියේ සිට පැලිකඩමුල්ල කුඹුරුයාය දක්වා කොන්ක්‍රිට් දමා සංවර්ධනය කිරීම හා වික්‍රම මයාගේ නිවස අසල සිට හියුම් පයිප්ප දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල  මහතා</u>

යටිපච්ච පාන් කඩය -හම්පලදෙනිය මාර්ගයේ ලෙයාරිස් මයාගේ නිවස අසල තුංමං හන්දියේ සිට පැලිකඩමුල්ල කුඹුරුයාය දක්වා කොන්ක්‍රිට් දමා සංවර්ධනය කිරීම හා වික්‍රම මයාගේ නිවස අසල සිට හියුම් පයිප්ප දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා</u>

එම යෝජනාව ස්ථිර කරමි.

මෙම මාර්ගය විශාල ජනතාවක් භාවිතා කරන මාර්ගයක්. මාර්ගය අබලන්. කොන්ක්‍රිට් දමා සංවර්ධනය කරලා වික්‍රම මහත්තයාගේ  නිවස අසල සිට හියුම් පයිප්ප දමා සංවර්ධනය කිරීමට අවශ්‍යයි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය  ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල  මහතාගේ_යෝජනාව අනුව යටිපච්ච පාන් කඩය -හම්පලදෙනිය මාර්ගයේ ලෙයාරිස් මයාගේ නිවස අසල තුංමං හන්දියේ සිට පැලිකඩමුල්ල කුඹුරුයාය දක්වා කොන්ක්‍රිට් දමා සංවර්ධනය කිරීම හා වික්‍රම මයාගේ නිවස අසල සිට හියුම් පයිප්ප දමා සංවර්ධනය කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල  මහතා -</u>

06-58. කැටකැඩැල්ල කොස්හේන මාර්ගයේ කැටකැඩැල්ල දෙසින් දැනට කොන්ක්‍රිට් කර ඇති ස්ථානයේ සිට ඉදිරියට කොන්ක්‍රිට් කිරීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල  මහතා -</u>

මෙම මාර්ගයේ කොන්ක්‍රිට් කර නැති ඉතිරි කොටස කොන්ක්‍රිට් කරගත යුතුයි. අත්‍යවශ්‍යතාවක්.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය  ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල  මහතාගේ_යෝජනාව අනුව කැටකැඩැල්ල කොස්හේන මාර්ගයේ කැටකැඩැල්ල දෙසින් දැනට කොන්ක්‍රිට් කර ඇති ස්ථානයේ සිට ඉදිරියට කොන්ක්‍රිට් කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා -

**06-59. ඇල්ලගාව අරුණ මාවත අක්කර අට කොස්වත්ත මාර්ගයේ දැනට කොන්ක්‍රීට් කර ඇති ස්ථානයේ සිට ඉදිරියට කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා

**එම යෝජනාව ස්ථිර කරමි.**

**ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතාගේ_යෝජනාව අනුව ඇල්ලගාව අරුණ මාවත අක්කර අට කොස්වත්ත මාර්ගයේ දැනට කොන්ක්‍රීට් කර ඇති ස්ථානයේ සිට ඉදිරියට කොන්ක්‍රීට් කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සිරිල් කරුණාරත්න මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සිරිල් කරුණාරත්න මහතා -

**06-60.කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉදිකිරීමට යෝජිත ආදාහනාගාරය ,කොළඹ රත්නපුර ප්‍රධාන මාර්ගයටත් ,රත්නපුර පානදුර ප්‍රධාන මාර්ගයටත් සම්බන්ධ වන මාටුවාගල හරහා දිවෙන ප්‍රධාන මාර්ගයට මුහුණලා පිහිටි කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් බලප්‍රෙද්ශය තුල මධ්‍යගතව පිහිටා ඇති මාටුවාගල ග්‍රාමනිලධාරී වසමේ අළුකැටිය සුසාන භූමිය තුළ ඉදිකිරීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ විජේසුන්දර මහතා -
**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සිරිල් කරුණාරත්න මහතා -
**මේ සුසානභූමිය මෙම ස්ථානයේ ඉදිකිරිම තුලින් වසම් 17 ක ජනතාවට පහසුවෙන් සේවය ලබාගත හැකියි. ඇහැළියගොඩ ඉංගිරිය ජනතාවටත් පහසුයි. සියළු ප්‍රදේශ වලට මධ්‍යගතව තියෙන්නේ. අළුකැටිය සුසාණභූමිය තුළ මේ කටයුත්ත සිදුකල හැකියි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා -
**මේ යෝජිත ආදාහනාගාරය සෝභිත හාමුදුරුවෝ කියපු එක.දන්නා තරමින් ප්‍රාදේශීය සභා නගරසභා බල ප්‍රෙද්ශයකට 1 ක් විතරයි දෙන්නේ. ආහනාගාරයක් යෝජනා උනාට කිරිඇල්ලට පුස්සැල්ල එක තියෙන නිසා දෙයි ද දන්නෑ. විස්තර ගන්න.**

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -

**අවශ්‍ය තොරතුරු ගෙන අදාල අංශ දැනුවත් කරමු.**

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරනය ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

**කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉදිකිරීමට යෝජිත ආදාහනාගාරය ,කොළඹ රත්නපුර ප්‍රධාන මාර්ගයටත් ,රත්නපුර පානදුර ප්‍රධාන මාර්ගයටත් සම්බන්ධ වන මාටුවාගල හරහා දිවෙන ප්‍රධාන මාර්ගයට මුහුණලා පිහිටි කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් බලප්‍රෙද්ශය තුල මධ්‍යගතව පිහිටා ඇති මාටුවාගල ග්‍රාමනිලධාරී වසමේ අළුකැටිය සුසාන භූමිය තුළ ඉදිකිරීම සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු ගෙන අදාල අංශ දැනුවත් කිරිමට මහා සභාවේ** ඒකමතිකව තීරණය විය.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සිරිල් කරුණාරත්න මහතා -**</u>

06-61 . බටහිර මුදුන්කොටුව දක්වා මාටුවාගල හරහා ඇහැලියගොඩ -ඉඩංගොඩ යන ස්ථාන කරා ධාවනය වූ රත්නපුර රත්නපුර ශ්‍රී ලංගම ඩිපෝවට අයත් බස්රථය 2024 ජනාධිපති මැතිවරණයෙන් පසු ඩිපෝ අධිකාරි විසින් අත්තනෝමතිකව අවලංගු කර ඇති අතර මෙම බස්රථය නොමැති විම නිසා ආර්ථික දුෂ්කරතා මැද ජීවත්වන දරුවන්ට පාසැල් යාමට හා ජනතාවට දැඩි දුෂ්කරතා වලට මුහුණ පා ඇති බැවින් බස් රථය නැවත ධාවනය කිරීම සඳහා අදාළ අංශ වලින් ඉල්ලීමක් කිරීමට යෝජනා කරමි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා -**</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සිරිල් කරුණාරත්න මහතා -**</u>

මේ බස්රථය අත්‍යාවශ්‍යයි. අඩු අදායම්ලාභි පවුල්වල දරුවන් රැසකට ගමන් පහසුව සපයපු බස් රථයක්. ඇහැලියගොඩ, ඉංගිරිය මාටුවාගල කිරිඇල්ල ජනතාවට එදිනෙදා කටයුතු වලට මේ බස් රථය පහසුවක් වෙලා තිබුණ. නමුත් මේ රථය අත්තනෝමතිකව අවලංගු කරලා. අදාල බලධාරින් එක්ක සාකච්චා කරලා මේ බස්රථය නැවත සේවය සදහා යොදවා දෙන්න.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

මුදුන්කොටුව බස්රථය පිලිබඳව කිව්ව කරුණ සත්‍යක්. මේ පිලිබඳව ප්‍රශ්න කල හැකියි.සම්බන්ධීකරණ කමිටුවට පෙර ගමනාගමන මණ්ඩලයෙන් විමසිමක් කරන්න. පාසැල් දරුවන් බහුතරයක් ගමන් ගන්නා බස් රථය අත්තනෝමතිකව නතර කරලා. ඩිපෝ අධිකාරි වෙතින්ද විමසන්න. ක්‍රියාවට නගමු.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

මේ සම්බන්ධයෙන් තොරතුරු ගෙන මැදිහත් විමක් සිදු කරමු. අදාල අංශ වෙතින් විමසිමක් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරනය ඒකමතිකව මහා සභාවේ සම්මත විය.

බටහිර මුදුන්කොටුව දක්වා මාටුවාගල හරහා ඇහැලියගොඩ -ඉඩංගොඩ යන ස්ථාන කරා ධාවනය වූ රත්නපුර රත්නපුර ශ්‍රී ලංගම ඩිපෝවට අයත් බස්රථය 2024 ජනාධිපති මැතිවරණයෙන් පසු ඩිපෝ අධිකාරී විසින් අත්තනෝමතිකව අවලංගු කර ඇති අතර මෙම බස්රථය නොමැති වීම නිසා ආර්ථික දුෂ්කරතා මැද ජීවත්වන දරුවන්ට පාසැල් යාමට හා ජනතාවට දැඩි දුෂ්කරතා වලට මුහුණ පා ඇති බැවින් බස් රථය නැවත ධාවනය කිරීම සඳහා අදාළ අංශ වලින් ඉල්ලීමක් කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා ගේ යෝජනා</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -</u>**

06-62. කරපිංච කන්ද උඩපාර කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -</u>**

කරපිංච කන්ද උඩපාර කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ඩග්ලස් ප්‍රේමදාස මහතා -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -</u>**

මේ මාර්ගයේ යන්න බෑ. මාර්ගයේ කොටසක් දේවින්ද මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයට අයත්. එතුමාත් දන්නවා. මේ පාර වර්ෂාව කාලේට ගමන් කිරීම දුෂ්කරයි. පුද්ගලිකව මිනිස්සු මේ පාර ඇතැම් තැන් අල්ලගෙන. ඒ කොටස් හරි කොන්ක්‍රීට් කරලා දෙන්න.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

මුදල් ප්‍රතිපාදන ඇති ආකාරයෙන් කරමු. පුද්ගලිකව මාර්ගය අනවසරයෙන් මිනිස්සු අල්ලගෙන නම් ඒක ලිඛිතව දෙන්න. කාර්මික නිලධාරි පරික්ෂා කරවා වාර්තා අරගෙන ඉදිරි කටයුතු කරමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>**

මාර්ගය භාවිතා කරන පවුල් 30 ක් 35 ක් ඉන්නවා. වාහන තියෙන පිරිස. මේ මාර්ගය හදලා දෙන්න කියනවා. අවස්ථා කීපයකදි මේ මාර්ගය නිරවුල් කරන්න හැදුවා. හිටපු කාර්මික නිලධාරි ගියා. අක්කර විස්සක් විතර තියෙන කෙනෙක් අඩි 6 ක් වත් නැති පාරේ මුල්ලක් අල්ලගෙන. ඉඩමට ආවොත් කපනවා කියනවා. කාර්මික නිලධාරිටත් බැන්නා. තර්ජනය කලා. මුළු ඉඩමම මැනගෙන එන්නලු. පාරේ අඩි 8 ක් පළල නෑ . ස්ථාන පරික්ෂාවක් කරන්න වෙයි. ඒ පුද්ගලයා ආයුධ අරන් එන්නේ. කරපිංච බස් නැවතුමේ කඩත් අල්ලගෙන. දමිළ ජනතාවට බනිනවා. බලපුළුවන් කාරකම් අනුමත කරන්නේ නෑ. කොහොම හරි මැණුම් කරලා පාර කොන්ක්‍රීට් කරන්න.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

මේ සම්බන්ධයෙන් මැදිහත්වීම් කරමු. ප්‍රතිපාදන ඇති අයුරින් මාර්ගය කොන්ක්‍රීට් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරනය ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතාගේ යෝජනාව අනුව** කරපිංච කන්ද උඩපාර ප්‍රතිපාදන ඇති අයුරින් කොන්ක්‍රීට් කිරීමට ත් මාර්ගය අනවසරයෙන් අල්ලාගෙන ඇති ස්ථාන සම්බන්ධයෙන් කාර්මික නිලධාරි වාර්තාගෙන ඉදිරි නීතිමය කටයුතු සිදු කිරීමටත් මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -</u>**

06 – 63. කරපිංච සමුපකාරය අසල මාවත ඉහලින් පිහිටි වතු නිවාස වලට ජල නල එලීම සඳහා මාර්ග පළුදු කිරීමට අවසර ලබාදීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ඩග්ලස් ප්‍රේමදාස මහතා -</u>**

එම යෝජනාව ස්ථිර කරමි. මේ වතුර ප්‍රශ්නය කරපිංච කොස්ගල ගබ්බෙල ප්‍රදේශ ගනනාවකට තියෙනවා. විසඳුමක් අවශ්‍යයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>**

ජල සම්පාදනයත් සමග කථා කරන්න.ලක්ෂ තුනක් ගෙවන්න තියෙනවා සභාවට . මේ මුදල ගැන කථා කරලා බලන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>**

මේ ශාන්ත ජෝකිම් වත්ත,කරපිංච වත්ත පේලි නිවාස පිහිටලා තියෙන්නේ උස් බිම් වල. එක දිගට තියෙන්නේ. මේ නිවාස වල ජනතාවට ගැටළු තියෙනවා. වතුර අවශ්‍ය උනත් නමුත් මේ මුදල ගෙවන්න හැකියාවත් නෑ.ඒ සියල්ලම අතරේ වත්තෙන් අවසර නැතුව කාණුවක් වත් කපන්න බෑ. වත්තේ මුරකරු ජන්දය ඉල්ලුවා. එයා ඉඩ දෙන්නෑ. මේ කටයුත්ත කරන්න. ඉඩමේ කාණු කපන්න දෙන්නෑ. පාර පළුදු කරන්න ගෙවන්න මුදල් නෑ මේ ජනතාවට. වෙනත් යම් ක්‍රමවේදයක් අනුව ජලය ගත්තට පස්සේ මාර්ගය සකසන ලෙස වගේ , යම් අඩු මුදලකට යන්න පුළුවන්ද? දුප්පත් ජනතාවගේ අත්‍යවශ්‍ය කටයුත්තක්. සභාපතිතුමණි මේ සම්බන්ධයෙන් හැකියාවක් ඇත්ද?

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

මේ සම්බන්ධව තව දුරටත් අදහස් ගමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා -</u>**

මේ නල එලීමට හැකි මැදිහත්වීමක් කරමු.මන්ත්‍රීතුමා කියන ආකාරයෙන් මාර්ගය පළුදු කලොත් රඳවුම් මුදල ගෙවන්න වෙනවා.එහෙම නැතිව කරන්න හැකි නම් ඒ අයට කරගන්න පුළුවන්. කාර්මික නිලධාරී ඇරලා වාර්තා ගමු.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u> -

දමිල ජනතාවට තියෙන ගැටළු පාරවල්, වතුර ප්‍රශ්න. වත්තෙන් පාරක් දෙන්නෑ. ආණ්ඩුවේ වතු අයිතිව තිබුණ කාලේට වඩා ගැටළු. කොම්පැණි කාරයෝ උදව් කරන්නෑ. සුභ සාධන නෑ. මාටුවාගල වත්තේ උඩ කොටසට වතුර නෑ.ඉන්න තැනකට අයිතියක් තහවුරු කරන්න බෑ. මිය ගියාම මිනිය තියන එකත් ගැටළුවක්. මරන පරික්ෂක මරණය ලියන්නෑ. පුළුවන් තරම් නීති තද කරනවා. වත්තේ ජීවිත් වෙන්න වෙලා තියෙන්නේ එහෙමයි. සුභසාධනයක් නෑ. වෘත්තිය

සමිති තියන්න හාම්පුතාලා දෙන්නේ නෑ. නිවසේ වහලය හදන්න බෑ. අවසර ගන්න ඕනි.වතුර නෑ. අපි තීන්දුවක් ගමු. පාරට අවම හානියක් වෙන විධිහට හෝ කටයුතු කරලා මේ ජල අවශ්‍යතාවය ලබා දෙමු. මේ වතු ජනතාවට අවම මුදලක් අය වෙන , හානිය අවම වන පරිදි මේ ජල නල එලීමේ කටයුත්තේදී පළාත් පාලන ආයතනයක් විධිහට අපි කටයුතු කරමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>**

වතු ජනතාවගේ මරණයක් උනාම මරන පරික්ෂක එනවා. ග්‍රාම නිලධාරි එන්නෑ. ග්‍රාමනිලධාරී අත්සන් කරලා මරණ සහතිකය ගන්න දින කීපයක් ඉන්න ඕනි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>**

අපේ කොට්ඨාශෙ පුද්ගලයෙක් එල්ලිලා මැරුණා. තවත් අයෙක් ලිඳට වැටිලා මැරුණා. පොලීසිය , මරණ පරික්ෂක ආවා.ග්‍රාම නිලධාරි ඉඳගෙන ඉන්නවා.එයාට පැය 2 ක් ට පස්සේලු යන්න තියෙන්නේ. ලිඳේ වැටිලා මරුණ මනුස්සයා වලෙන් ගොඩට ගන්න පැය 2 ක් බලන් ඉන්න ඕනි. මම තර්ක කරලා පොලිසියේ පැමිණිල්ලක් දාලා. වචන හුවමාරු උනා. පොලසියේදිත් කියලා දුන්නා. ළමයෙක් ලිඳට වැටුනාම ඇති වෙන තත්වය . මානුෂියව මේ ගැටළු දිහා බලන්නේ නෑ. මංගල මන්ත්‍රීතුමා කිව්ව කතාව ඇත්ත.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා -</u>**

පුස්සැල්ල වැවිලි සමාගමට අයත් වත්තේ පවුල් 80 ක් විතර ඉන්නවා. මරණයක් උනා. ආදාහනය නියමිත දිනට කරගන්න බැරිඋනා. ග්‍රානිලධාරි තමාගේ කටයුත්තතට නිසි වෙලාවේ සහාය නොදුන්න නිසා. ඒ වගේමයි ඒ ජනතාවට වැසිකිලිය , කුස්සිය වගේ අත්‍යවශ්‍ය දෙයක් හදිසියේ කැඩුනත් හදා ගන්න බෑ. බලධාරි අවසර ගන්න ඕනි. මේ වතු බලධාරින් එකතු කරලා සාකච්චාවක් තියන්න. මේ ගැටළු කතා කරන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂණ නාපාවල මහතා -</u>**

මගේ කොට්ඨාශයේ 40% ක් වතු ජනතාව ජීවත් වෙන්නේ. ඒ ජනතාවට ඉතා අඩු පහසුකම් යටතේ අසරනව ඉන්නේ. ඒවා විසඳා ගන්න සහායක් නෑ. මේ වගේ අවස්ථාවක මේ ගැටළු විසඳන්න අපි උදව්වෙමු. වතු ජනතාව වෙනුවෙන් මම ඉල්ලා සිටිනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍ර කුමාර් මහතා -</u>**

මේ ගැටළුව සම්බන්ධව දුන්න සහයෝගයට ස්තුතියි. වතු ජනතාවට මරණයක් උනාම දාන්න සුසානභූමියක් නෑ. ඒ කටයුතු කරන්න ගියාම ගැටළු. වත්තේ ජීවිත් විම අපායේ ඉන්නවා වගේ. වහලය කැඩුනත් හදන්න දෙන්නේ නෑ. වැසිකිලිය කැඩුනත් හදන්න පාලකයන් එනතුරු ඉන්න ඕනි. ගහක් කපන්න බෑ. යන එන ඇතැම් පාරවල් වහනවා.

ගාමන්ට් ගිහින් වැඩ ඇරිලා එන කෙනා හවස 6.30 ට ඇවිත් පල්ලමක් බැහැලා ගිහින් නාලා ආයෙත් අනිත් වැඩ වලට වතුර අරන් එන්න ඔිනි. මේ පළුදු කරන්න එපා කිවාට ඒ පාරත් ගොඩාක් අබලන් පාරක්. වසර 30 කට විතර කලින් කොන්ක්‍රිට් කරපු එකක්.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

කරපිංච සමුපකාරය අසල මාවත ඉහලින් පිහිටි වතු නිවාස වලට ජල නල එලීම සඳහා මාර්ග පළුදු කිරීමට අවසර ලබාදීම සම්බන්ධව කාර්මික නිලධාරී ඇරලා වාර්තා ගමු. ජනතාවට සහනයක් වෙන විදිහට අපි විශේෂ තීන්දුවක් ගමු. මේ වැඩේ ක්‍රියාත්මක කරන්න ක්‍රමවේදයක් හදමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>**

පාර නිරවුල් කිරිමයි ජල නලඑලීමේ කටයුත්ත පිලිබඳ වාර්තා ගැනිමයි දෙකම එකම දිනයේ

යොදාගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරනය ඒකමතිකව මහා සභාවේ සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතාගේ යෝජනාව අනුව** කරපිංච සමුපකාරය අසල මාවත ඉහලින් පිහිටි වතු නිවාස වලට ජල නල එලීම සඳහා මාර්ග පළුදු කිරීමට අවසර ලබාදීම සම්බන්ධව කාර්මික නිලධාරි මගින් වාර්තා ගෙන යම් සහනදායි ක්‍රමවේදයක් අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

06-64. මාටුවාගල වත්ත ක්‍රිඩාංගනය මායිමේ පිහිටි කාණු පද්ධතියේ අඩකට වැඩි ප්‍රමාණයකට බෝක්කු සවිකර ඇති අතර ඉතිරිය සම්පුර්ණ කර බෝක්කු යෙදීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -</u>**

මාටුවාගල වත්ත ක්‍රිඩාංගනය මායිමේ පිහිටි කාණු පද්ධතියේ අඩකට වැඩි ප්‍රමාණයකට බෝක්කු සවිකර ඇති අතර ඉතිරිය සම්පුර්ණ කර බෝක්කු යෙදීමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u> -

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

ප්‍රතිපාදන ඇති ආකාරයෙන් කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරනය ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතාගේ යෝජනාව අනුව** මාටුවාගල වත්ත ක්‍රිඩාංගනය මායිමේ පිහිටි කාණු පද්ධතියේ අඩකට වැඩි ප්‍රමාණයකට බෝක්කු සවිකර ඇති අතර ඉතිරිය සම්පුර්ණ කර බෝක්කු යෙදීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ටී.එම්.උමේෂා මල්කාන්ති මිය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ටී.එම්.උමේෂා මල්කාන්ති මිය -</u>**

06-65. දෙවිපහල ග්‍රාමනිලධාරී වසමේ කීරගල ප්‍රධාන පාරේ ට්‍රාන්ස්පෝමරය අසල සිට ගල්පොත්ත දෙසට ඇති මාර්ගය කොටසක් කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂන නාපාවල මහතා -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරනය ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ටී.එම්.උමේෂා මල්කාන්ති මිය ගේ යෝජනාව අනුව** දෙවිපහල ග්‍රාමනිලධාරී වසමේ කීරගල ප්‍රධාන පාරේ ට්‍රාන්ස්පෝමරය අසල සිට ගල්පොත්ත දෙසට ඇති මාර්ගය කොටසක් කොන්ක්‍රිට් කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ටී.එම්.උමේෂා මල්කාන්ති මිය -</u>**

06-66. දෙවිපහල පහල කීරගල පාර කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂන නාපාවල මහතා -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරනය ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ටී.එම්.උමේෂා මල්කාන්ති මිය ගේ යෝජනාව අනුව** දෙවිපහල පහල කීරගල පාර කොන්ක්‍රිට් කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ටී.එම්.උමේෂා මල්කාන්ති මිය -</u>**

06-67. කීරගල ග්‍රාම නිලධාරී වසමේ අගලවත්ත ප්‍රජාශාලාවේ වහලය අළුත්වැඩියා කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂන නාපාවල මහතා -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරනය ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ටී.එම්.උමේෂා මල්කාන්ති මිය ගේ යෝජනාව අනුව** කීරගල ග්‍රාම නිලධාරී වසමේ අගලවත්ත ප්‍රජාශාලාවේ වහලය අළුත්වැඩියා කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පී.කේ.ජයනෙත්ති මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා -</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පී.කේ.ජයනෙත්ති මහතා</u>**

**06-68. අංක 161/ඒ සූදාගල ග්‍රාමනිලධාරී වසමේ කුරුවිට -එරත්න ප්‍රධාන මාර්ගයේ මෝදර සිට කිරිගල දක්වා දිවෙන විකල්ප මාර්ගයේ ඇති පාලම ඉතා අබලන්ව ඇති බැවින් හා ඉතාමත් අනතුරුදායකව ඇති බැවින් එම අනාරක්ෂිත පාලම වෙනුවට නව පාලමක් ඉදිකිරිමට හෝ හෝ දැනට පවතින පාලම ඉතා කඩිනමින් අළුත්වැඩියා කරදීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලීන් අධිකාරම් මහතා</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පී.කේ.ජයනෙත්ති මහතා</u>**

**මෙම මාර්ගයේ පාසැල් ළමයිනුත් ගමන් ගන්නවා. පාලම තියෙන්නේ එක කණුවෙන් වගේ.**

**අනතුරක් විමට හැකියාව වැඩියි. සංඥා පුවරුවක් අවශ්‍යයි.**

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරනය ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පී.කේ.ජයනෙත්ති මහතා_ගේ යෝජනාව අනුව අංක 161/ඒ සූදාගල ග්‍රාමනිලධාරී වසමේ කුරුවිට - එරත්න ප්‍රධාන මාර්ගයේ මෝදර සිට කිරිගල දක්වා දිවෙන විකල්ප මාර්ගයේ ඇති පාලම ඉතා අබලන්ව ඇති බැවින් හා ඉතාමත් අනතුරුදායකව ඇති බැවින් එම අනාරක්ෂිත පාලම වෙනුවට නව පාලමක් ඉදිකිරිමට හෝ හෝ දැනට පවතින පාලම ඉතා කඩිනමින් අළුත්වැඩියා කරවා දීමට අවශ්‍ය පියවර ගැනීමට** මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පී.කේ.ජයනෙත්ති මහතා -</u>**

06-69. ඇදිරියන්වල වසමේ වැළිහිඳ මාර්ගය මිටර් 700 ක් කොන්ක්‍රිට් යොදා සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ආශා සමන් කුමාරි මිය -</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පී.කේ.ජයනෙත්ති මහතා -</u>**

මේ මාර්ගය සංවර්ධනය කිරිමට අත්‍යවශ්‍ය මාර්ගයක්. ජනතාවට ගමන්කිරිමට ඇති මාර්ගය සංවර්ධනය කර දෙන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරනය ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පී.කේ.ජයනෙත්ති මහතා_ගේ යෝජනාව අනුව** ඇදිරියන්වල වසමේ වැළිහිඳ මාර්ගය මිටර් 700 ක් කොන්ක්‍රිට් යොදා සංවර්ධනය කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පී.කේ.ජයනෙත්ති මහතා -</u>**

06-70. උතුරු එක්නැලිගොඩ වසමේ කන්ද උඩ සිට පන්නම දක්වා ඇති මාර්ගය මිටර් 600 ක් කොන්ක්‍රිට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පී.කේ.ජයනෙත්ති මහතා -</u>**

කොන්ක්‍රිට් යොදා සංවර්ධනය කිරීමටයි තියෙන්නේ. බෝපත් ඇල්ලටත් මේ මාර්ගයෙන් යනවා.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරනය ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පී.කේ.ජයනෙත්ති මහතා_ගේ යෝජනාව අනුව** උතුරු එක්නැලිගොඩ වසමේ කන්ද උඩ සිට පන්නම දක්වා ඇති මාර්ගය මීටර් 600 ක් කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.මහින්ද ජයලාල් මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා -</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.මහින්ද ජයලාල් මහතා -</u>**

06-71. බෙන්දළුව ප්‍රජාශාලාව පාර (වෙල පාර) කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලීන් අධිකාරම් මහතා</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.මහින්ද ජයලාල් මහතා -</u>**

මේ ප්‍රජා ශාලාව සභාවට පවරලා තියෙන්නේ. මාතෘ හා ළමා සායන පැවැත්වෙනවා. ජනතාව විකල්ප මාර්ගයක් විධිහට මේ මාර්ගය භාවිතා කරනවා.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරනය ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.මහින්ද ජයලාල් මහතා ගේ_යෝජනාව අනුව** බෙන්දළුව ප්‍රජාශාලාව පාර (වෙල පාර) කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.මහින්ද ජයලාල් මහතා -</u>**

06-72. බෙන්දළුව වත්ත (මැනේජර්වත්ත) නිවාස 12 ට පානීය ජලය ලබාදීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලීන් අධිකාරම් මහතා</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.මහින්ද ජයලාල් මහතා -</u>**

වැහි කාලෙට බැරල් තියලා මේ ජනතාව වතුර රැස් කරනවා. බොන්න සුදුසු වතුර නෑ. වතු ජනතාව වගේම තමා. පසුගිය සමයේ ජල ටැංකි හැදුවත් වතුර සැපයුමක් නෑ. මේ පිරිස එකතු වෙලා පොඩි ළිඳක් කපලා තියෙනවා. මෝටරයක් දමලා වතුර ගන්න විතරයි තියෙන්නේ. අත්‍යවශ්‍යතාවක්. මේ කටයුත්තට මැදිහත් වෙන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරනය ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.මහින්ද ජයලාල් මහතා ගේ_යෝජනාව අනුව** බෙන්දළුව වත්ත (මැනේජර්වත්ත) නිවාස 12 ට පානීය ජලය ලබාදීමට අවශ්‍ය පියවර ගැනිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.මහින්ද ජයලාල් මහතා -</u>**

06-73. බෙන්දළුව පීල්ල අසල රවන ඉදලහේන පාර කොන්ක්‍රිට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂන නාපාවල මහතා -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.මහින්ද ජයලාල් මහතා -</u>**

මේ පාරේ බයිසිකලයක්වත් යන්න බෑ. ජනතාවට යන්න පුළුවන් විධහට කොන්ක්‍රිට් යොදා සංවර්ධනය කර දෙන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරනය ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.මහින්ද ජයලාල් මහතා ගේ_යෝජනාව අනුව** බෙන්දළුව පීල්ල අසල රවන ඉදලහේන පාර කොන්ක්‍රිට් යොදා සංවර්ධනය කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.මහින්ද ගුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.මහින්ද ගුණසිංහ මහතා -</u>**

06-74. ර/ තලාවිටිය සිරිසමන් විද්‍යාලය පවත්වාගෙන ගිය පුවක්ගහදෙනිය භූමිය මෙම සභාවට පවරාගෙන සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.මහින්ද ගුණසිංහ මහතා -</u>**

මේ භූමිය අපේ දෙහෙරගොඩ මායිමේ තියෙන්නේ. මේ පාසැල තිබුණ බිම රජය සතු දේපලක්. මේ ආසන්නයේ ක්‍රිඩා පිටියක් නෑ. සභාවට පවරාගෙන ප්‍රෙද්ශයේ ජනතාවට අවශ්‍යතා සඳහා සංවර්ධනය කර දෙන්න. ඒ වගේම පසුගිය රජය සමයේ මේ ඉඩම ක්‍රිඩාපිටියක් ලෙස සංවර්ධනය කරනවා කියලා රජයේ ප්‍රතිපාදන වෙන් කරගෙන. තිබුන ගොඩනැගිලි විනාශ කරලා මේ වනවිට කිසිදු සංවර්ධනයක් නැතිව ඉබි යතුරු දාලා වහලා තියෙනවා. ජනතාවට වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයක් වගේ දෙයක් මේ ඉඩමේ හදන්න පුළුවන්. මේ වන විට ඒ ඉඩමට ආසන්නව පදිංචි හිටපු පළාත් සභා මන්ත්‍රි වරයෙක් මේ ඉඩමේ කොටසක් අල්ලාගෙන. අවභාවිතයක්. මේ ඉඩම සභාවට අරන් ජනතාවට වැඩක් ඇති කටයුතු වලට යොදවන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරනය ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.මහින්ද ගුණසිංහ මහතා ගේ යෝජනාව අනුව** ර/ තලාවිටිය සිරිසමන් විද්‍යාලය පවත්වාගෙන ගිය පුවක්ගහදෙනිය භූමිය මෙම සභාවට පවරාගෙන සංවර්ධනය කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.මහින්ද ගුණසිංහ මහතා -**

06-75. තලාවිටිය කොට්ඨාශයේ ජී.ඒ.පියදාස මහතාගේ නිවසට දෙසට යන මාර්ගයේ ආරම්භයේ සිට මූනංගල වත්ත කෝවිල දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරිමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂන නාපාවල මහතා -**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.මහින්ද ගුණසිංහ මහතා -**

මේ මාර්ගයේ කොටසක් කොන්ක්‍රිට් කරලා. මීටර් 600 ට වැඩියි. දුර ප්‍රමාණය. දුෂ්කර මාර්ගයක්. වතු නිවාස ජනතාව, ප්‍රෙද්ශ ගනනාවක ජනතාව මේ මාර්ගයේ ගමන් කරනවා. අත්‍යවශ්‍ය කටයුත්තක්.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරනය ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.මහින්ද ගුණසිංහ මහතා ගේ_යෝජනාව අනුව** තලාවිටිය කොට්ඨාශයේ ජී.ඒ.පියදාස මහතාගේ නිවසට දෙසට යන මාර්ගයේ ආරම්භයේ සිට මූනංගල වත්ත කෝවිල දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.මහින්ද ගුණසිංහ මහතා -**

06-76. තලාවිටිය එපිටගෙදර මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ජයලාල් පතිරණ මහතා -**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරනය ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.මහින්ද ගුණසිංහ මහතා ගේ_යෝජනාව අනුව** තලාවිටිය එපිටගෙදර මාර්ගය සංවර්ධනය කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා -**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා**

06-77. කුරුවිට නගර මධ්‍යයේ ඉදිකර ඇති වැඩ නිම නොකල සම්මන්ත්‍රණ ශාලාවේ ඉතිරි වැඩ නිම කිරිමට යෝජනා කරමි.

ගරු උපසභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා -**

කුරුවිට නගර මධ්‍යයේ ඉදිකර ඇති වැඩ නිම නොකල සම්මන්ත්‍රණ ශාලාවේ කටයුතු අධියර කීපයකින් කලේ. සභාව විසිරවිමට පෙර දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ණයක් අරන් ඉතිරි කටයුතු කරන්න හැදුවත් විසිරෙව්ව නිසා කරන්න බැරි උනා. පස්සේ ඒක අරගෙනත් නෑ.

මේ ස්ථානය ඵලදායී කටයුතු රැසකට යොදාගන්න පුළුවන්. සංවර්ධනය කරන්න. ලිෆ්ට් එකකුත් අවශ්‍ය වෙයි. ඒ දිනවල මම හිටපු ආණ්ඩුකාරතුමන්ගෙනුත් ඉල්ලීමක් කලා. එතුමාගේ නම උනත් දාන්න. මේ ස්ථානයේ ඉතිරි වැඩ කරන්න කියලා. මට එතුමාව අත්ත උඩ තියන්න එපා කිව්වා. ඇත්තටම මම කතා කලේ ජනතාවට වටිනා දෙයක් නිසා කුමන මාර්ගයෙන් හෝ සංවර්ධනය කර ගන්නයි. ගරු සභාපතිතුමා මැදිහත් වෙලා ගරු ජනාධිපතිතුමාට හෝ කියලා මේ ස්ථානය ඉතිරි කටයුතු සැලසුම් අවශ්‍ය පරිදි වෙනස් කරලා හෝ මේ කටයුත්ත සිදු කරන්න.ලබන අයවැයෙන් මේකට යම් ප්‍රතිපාදන මුදලක් වෙන් කරන්න. කාගේ හරි නමක් දැම්මත් කමක් නෑ. මේ කටයුත්ත ජනතාවට පලදායි ලෙස වැඩ නිම කරන්න.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -**</u>

මේ යෝජනාව සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරන්න පෙර සංවර්ධනය කරන්න පෙර ඉදිරි කටයුතු කලහැකි තත්වයක ඒ ඉදිකිරීම තියේද බලන්න. මීට පෙරත් විශාල ලෙස මුදල් වැයකල කර්මාන්තයක්. ඉරිතැලීම් පිපිරීම් තියෙනවළු. අපි ගිහින් බලමු. තාක්ෂනයේ දූර්වලතා ද දන්නේ නෑ. කාර්මික නිලධාරී එක්ක යමු. මුදලක් වැය කරලා කඩා වැටුනොත් .ඒ නිසා සංවර්ධනයට පෙර පරීක්ෂා කරන්නත බරක් රැඳවිය හැකි මට්ටමක තියේද කියලා. සුදුසුයි නම් අනුග්‍රහයක් අරගෙන හෝ මේක සංවර්ධනය කරමු.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

ඇහැලියගොඩ සිට රත්නපුර දක්වා තියෙන සංවර්ධනය කලහැකි එකම විශාල ගොඩනැගිල්ල. රත්නපුර නගර ශාලාවෙන් පස්සේ අපේ මේ තියෙන ගොඩනැගිල්ල. මේක විවිධ ජනතා අවශ්‍යතා වලට යොදාගන්න පුළුවන් විධිහට සංවර්ධනය කරමු. මේ ගොඩනැගිල්ල ගැන ඉදිකරීම් නිර්ණායක අවශ්‍ය නම් ඒවා ගන්න.මේ ඉදිකිරීම් කලේ ඒ අවශ්‍ය නිලධාරින්ගේ පූර්ණ අධීක්ෂනය යටතේ. තවත් අවශ්‍ය නම් ඒ වාර්තා නිර්දේශ ගන්න.සංස්කෘතික කලා කටයුතු වලට මේ ස්ථානය ඉතා සුදුසුයි. ඒ නිසා අවශ්‍ය නිර්දේශ අරගෙන මේ ශ්‍රවනාගාරය ජනතාවට ඵලදායි බවට පත් කරන්න.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී තනූජා දීපානි චන්දිකා මිය -**</u>

මේ ගොඩනැගිල්ලේ පාදම අනුව තට්ටු තුනකට යන්න බැරිලු. අත්තිවාරම තට්ටු තුනට ගැලපෙන ලෙස සකසලා නෑ කියලයි සමහර ජනතාවගේ අදහස්. ඒ නිසා සොයා බලන්න.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -**</u>

මම මේ ස්ථානයේ ඇතැම්විට පැය දෙකක් විතර ඉන්නවා. සම්මන්ත්‍රණශාලාවක අවශ්‍යතාවය තියෙනවා. හදපු බිල්ඩිමට විශාල මුදලක් වැය කලා. අන්තිමට මිළ ගනන් වැඩිවෙලා ඒවත් අනුමත කලා. මන්ත්‍රීතුමිය කිව්වා වගේ මටත් මතක තට්ටු දෙකකට වගේ තමා අත්තිවාරම දැම්මේ. වහලේ ගහන්න මුදල් මදි උන නිසා ස්ලැබ් එක දැම්මා.භූවිද්‍යා එකෙන් පරික්ෂා කලද? වාර්තා ඇති.ඒකට පිටවීමට දොරටුවක් අවශ්‍යයි. මනුස්සයෙකුත් මේ ස්ථානයේ මිය ගියා. වැසිකිලි, වායු සමිකරණ පහසකම් වගේ පහසුකම් මෙතැනට ඕනි. හදිසි දොරටු ඕනි. සංවර්ධනය කලාම 1000 ක් විතර දාන්න පුළුවන් හොඳ තැනක්. මුළු නගරේම ජේනවා එතැනට. අනවශ්‍ය වෙන අයට යන්න බැරිවෙන්න දොරක් ඕනි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා -</u>**

ඒ ඉදිකිරිම් සංවර්ධනය කරන්න පෙර අපි ඉදිකිරීමේ අත්තිවාරම තත්වය, සැලසුම් ආදිය සොයාගෙන සංවර්ධනය කරමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා -</u>**

විධායක ඉංජිනේරු කාර්යාලයේ නිරීක්ෂණය මතයි කටයුතු කලේ. සියයට ගානක් ගෙවීම් කලා. සැලසුම් ඇඳලා ,පළාත් සභාවෙන් බලලා කණු නග්ගලා බිත්ති බැඳලා නිසි පරිදි තමා කටයුතු කලේ. ඉරි තලලද දන්නේ නෑ. කෙසේ වෙතත් නිරීක්ෂනය කරන්න. අර මනුස්සයෙක් මැරුනේ මේ ඉදිකිරීමේ වරදින් නෙමේ. ඒක මේකට අදාල නෑ. මන්ත්‍රි තුමා මෙතැන ඉඳන් නගරේ සිරි නරඹනවා කිව්වා. මේ තැන කුරුවිටට වටින තැනක්. මේ ගැන පළාත් සභාවට කියලා ඉරි තලලා නම් ගැලපෙන ක්‍රමවේද විධායක ඉංජිනේරු මගින් යොදවල හෝ මේ ස්ථානය සංවර්ධනය කරන්න.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා-</u>

අපිට කුරුවිට සභා ප්‍රෙද්ශයේ ජනතාවට කලා කටයුතු සංස්කෘතික කටයුතු කරන්න සුදුසු ස්ථානයක් නෑ. අවශ්‍යතාවය තියෙනවා. සභා අරමුදල් යොදවලා දියුණු කරන්න සංවර්ධනය කරන්න තරම් හැකියාවක් නැති නිසා වෙන තැනකින් අරමුදල් ගන්න වෙනවා. මේ ඉදිකිරිම තව දුරටත් සංවර්ධනය කරන්න පුළුවන්ද පරික්ෂණ වාර්තා ගමු. වැරදි මත එපා. අදාල අවශ්‍ය ආයතන වලට දැනුම් දෙනවා. මේ ස්ථානය සංවර්ධනය කරන්න අහලා විවිධ ආයතන වලින් ඉල්ලීම් ලැබුණා. ලිඛිත ඉල්ලීම්. සිනෙවිල් පුද්ගලික සමාගමෙන් ඉල්ලීමක් තියෙනවා. මේ ගොඩනැගිල්ලේ තුන්වෙනි තට්ටුව මිලියන 20 කට ආයෝජනය කරලා මාසික කුලිය ලක්ෂ දෙකක් සභාවට ගෙවන්න අහලා තියෙනවා. අපි සොයා බලලා තීන්දු තීරණ පස්සේ ගමු. ඉදිරියේදි විශේෂයෙන් මේ අය කැඳවලා බලමු. මූලිකවම මේ ඉදිකිරිම් වලට සුදුසු තත්වයේ මේ ගොඩනැගිල්ල තියේද බලමු. අරමුදල් සපයා ගමු. මෙවැනි අනුග්‍රාහක ආයතන තව තියේද බලල කටයුතු කරමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා -</u>**

න්‍යාය පත්‍රයේ නොමැති ඉල්ලීමක් තියෙනවා. එම්.ජී.චන්ද්‍රෙසේන මයා, පොහොරබාව ,පරකඩුව මියණදෙනියේ මාර්ගයක් හදලා දෙන්නළු. හැකි දෙයක් කරන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරනය ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ_යෝජනාව අනුව** කුරුවිට නගර මධ්‍යයේ ඉදිකර ඇති වැඩ නිම නොකල සම්මන්ත්‍රණ ශාලාවේ ඉතිරි වැඩ නිම කිරීමට අවශ්‍ය වාර්තා ලබාගෙන ඉදිරි පියවර ගැනීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා -</u>**

06-78. කුරුවිට ප්‍රාදේශීය සභාව හා වලදූර බන්ධනාගාරය එක්ව ක්‍රියාත්මක කොම්පෝස්ට් ව්‍යාපෘතියේ විස්තර පිලිබඳ සභාව දැනුවත් කිරීමට යෝජනා කරමි.( පොහොර ව්‍යාපෘතිය

සිදුකරන භූමියේ සභාව සතු අයිතිය තහවුරුකිරීම/ගිවිසුම් , 2023 වසරේදී සභාව විසුරුවාට පසු ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා වැයකල මුදල් හා දැනට පවතින තත්වය)

<u>ගරු උපසභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා -</u>**

මම මේ යෝජනාව කලේ සභාවෙන් ලක්ෂ 35 ක් පමන ගෙවීම් කරලා පොහොරබාව ඉඩම සභාවට පවරාගන්න කටයුතු කරමින් හිටියේ. ඒකේ අවශ්‍ය සමහර ඉදිකිරීම් කරලා තිබුනේ. ගොඩනැගිලි දෙකක්, මාර්ගය,විදුලිය වගේ මූලික අවශ්‍යතා අරන් තිබුනේ. කෝටි දෙකකට වැඩිය වැය කලා මේ ව්‍යාපෘතියට.ඉස්සර අපි බන්ධනාගාරේ කසල ව්‍යාපෘතියක් පටන් ගත්තා. පොහොරත් අලෙවි කලා. රැඳවියන් කසල කලමණාකරන කටයුතු කලා. ලාභය දෙකට බෙදාගෙන ඒ අධිකාරීවරුන් එක්ක සහයෝගයෙන් කටයුතු කලා. නමුත් ඒ අධිකාරිවරුන් වෙනස් උනා. ඒ එක්ක මේ කටයුතු වෙනස් උනා. අපි සභාවේන් මේ කටයුතු වලට අවශ්‍ය සබන් වගේ ද්‍රව්‍ය දුන්නා. නමුත් පසුව මේ කටයුතු වෙනස් වෙලා කසළ නැවත සභාවට ගෙන එන්නත් උනා. ඒ අය එකඟ උනෙත් නෑ ඒ ඉඩම සංවර්ධනය කරනවට. ලොකු සංවර්ධනයක් කලෙත් නෑ ඒනිසා. සාකච්ජාතලත් නිලධාරීන් එකඟ උනේ නෑ. මේ පොහොරබාව ව්‍යාපෘතිය සංවර්ධනය කරලා 20 කට 25 කට රැකියා දෙන්න පුළුවන්. ගමේ විරුද්ධතාවක් තිබිලා නඩුවක් දැම්මා මේ ව්‍යාපෘතියට සිරිපාල කිරිඇල්ල මන්ත්‍රී තුමා. නඩුවේ තීන්දුව අනුව ක්‍රෙවිදයකට කරන්න ඕනි. අපිට අයිති නැති බිමක බන්ධනාගාර බිමේ මුදල් යෙදවීමට එකඟ නෑ.පසුගිය කාලේ ඒ වියදමු විස්තර ඕනි. අපිට පොහොරබාවේ තැනක් තියෙද්දි බන්ධනාගාර යට අයිති ඉඩමේ වියදම් කලේ කොහොමද? රටේ තත්වය අනුව ටැක්ටර් ඇතුල් කරන්න එපා කිව්වොත් ඒක සභාවට ප්‍රශ්නයක්. කතාවක් තියෙනවා මේ කිට්ටුව හෝටලයක් තියෙනවළු. ඒ නිසායි පෝර ව්‍යාපෘතිය එතනින් ඉවත් කරන්න ඕනි කියලා කතාවක් තියෙනවා. තව වසර දහයක් පහලොවක් යනකොට පොහොරබාව ඉඩමේ තමා කරන්න වෙන්නේ කසළ කටයුතු. අපේ සභාවේ රථගාලේ ගලවපු ලී තහඩු ආදිය ගෙනිච්චද මේ බන්ධනාගාරේ කටයුත්තට. නැත්නම් ඒ ටික තියෙනවද? සොයා බලන්න. බෝපත් ඇල්ල ලොකු වැසිකිලියේ ගලවපු කොමඩ් එක කෝ?. ඉදිරියේදී මෙවැනි දේ නොවිය යුතුයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගනාත් විජේසුන්දර මහතා -</u>**

මේ ව්‍යාපෘතියේ වැඩිම බලපෑම දෙහෙරගොඩට තියෙන්නේ. ලඟම පාසැල. පාසැලේ නිල මැස්සෝ පිරිලා. පාණීය ජල ලිඳේ වතුර බොන්න බෑ. පරික්ෂා කලාම වතුර දූෂිත වෙලාලු. ව්‍යාපෘතියේ අඩුපාඩු තියෙනවා. ගමේ ලොකු විරෝධතාවක් තියෙනවා මේක මෙතැනින් ඉවත් කරන්න කියලා. ඉතා ඉක්මනින් නිසිපරිදි මේකටයුතු කලේ නැත්නම් වැඩිකාලයක් කරන්න බැරිවෙයි. පොහොරබාවට කසල ටැක්ටර් කනුග්ගල්ල හරහා යනවා. නිතරම කසළ ගෝනි වැටිලා පාරේ. මේ මග දෙපස ඉන්න ජනතාවගෙන් කසල ගන්නේ නෑ. යම් යම් චෝදනාත් තියෙනවා සේවකයින් ගැන. ගමේ අයටත් කසල දෙන්න අවස්ථාවක් දෙන්න.විරෝධතාවය යම් පමනකින් අඩු වෙයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>**

වලදූරේ බන්ධනාගාරේ පෝර ව්‍යාපෘතිය හැදුවා. වලදූර ඇළ සවුත්තු වෙලා. මලංගම ඇලටත් එහෙමයි. කුරුවිට කුනු දාන්න තැනක් තිබුනේ නෑ. බන්ධනාගාරේ සේවක ප්‍රශ්න නෑ. කසළ වර්ග කරනවා ඒ අය. පෝර විකුනලා බාගෙට බාගේ ගත්තා. හිටපු සභාපතිතුමා මැදිහත්වෙලා පොහොරබාව ඉඩම ගත්තා. ඒකේ වලවල් හාරලා කසළ දැම්මා. නමුත් ක්‍රමවේදයකට යා යුතුයි. පරිසර හිතකර ව්‍යාපෘතියක් බවට මේක පත් කල යුතුයි. හැමෝම සහායෙන් මේ කටයුත්ත කරමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා</u>**

සභාවේ කසළ අදින සේවක මහතුන් විශාල කැපවීමක් කරනවා. ඒ කසල අතපත ගාලා ඒ කටයුතු කරන්න අපි කාටවත් බෑ. සමහර අය තේ එකක්, කන්න දෙයක් කැමැත්තෙන් දුන්නට ඒකට චෝදනා කරන්න එපා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -</u>**

නඩුකාරදෙනිය, වලදූර ගම්මාන වලට යම් ගැටළු තියෙනවා. මේ සම්බන්ධව. දුගඳයි වගේම මැසි කරදරය තියෙනවා. වලදූර ඇළ දූෂනය වෙලා. අප දියර එක් වෙලා. හයිඩ්‍රාමණියත් ඇළට අපද්‍රව්‍ය මුදා හරිනවා. මේක ජනතාව පීඩාවට පත් කිරීමක්. මේ පීඩාව ඉවත් කර දෙන්න.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

දෙහෙරගොඩ ගැන කියපු දේ සත්‍යයක්. සභාවට තියෙන කාර්යන් අතර මේ කසළ ඉවත්කිරිම ප්‍රධාන කරුණක්. දින දෙකක් කසළ ඉවත් කලේ නැත්නම් විශාල ගැටළුවක්. වලදූරේත් මේ ව්‍යාපෘති ගැන විරෝධතා ආවා. පොහොරබාවෙත් ආවා. පාසැල කුඹුර ගැන කිව්වා. තේරුම් ගත යුතු දේ මේ ක්‍රියාවලිය අපි කළ යුතුම දෙයක් වෙන අතරේ අනිවාර්යෙන් නිසි ක්‍රමවේදයකට කල යුතුයි. බන්ධනාගාරය ඒ දේ හරියට කලා. කසල තෝරලා පෝර බවට පත් කළා. අලෙවි කලා. රැඳවියන් තමා මූලික ප්‍රතිලාභය උනේ. නමුත් අධිකාරිවරුන් වෙනස් වෙන කොට මේ තත්වය වෙනස් උනා. ගිවිසුමක් ඇති. ඒ අවධියේ මේ ගැටළුවට සියයට හැටක් විසඳුම දුන්නේ බන්ධනාගාරය තමයි. මේ කසළ ප්‍රමාණය අධික වෙලා ධාරිතාවය ඉහල යනකොට අපි පොහොරබාව ඉඩම ගත්තේ තවත් මේ කටයුතු විධිමත් හා පුළුල් කරන්න. නමුත් ඒ කටයුත්ත විධිමත්ව කලේ නෑ. බිම පුරා වලවල් හාරලා කසළ දාලා. ක්‍රමවේදයකට ඒ කටයුතු කරන්න වෙනවා. කසළ කළමණාකරන කටයුතු කරන සියළු දෙනා ඒ පිලිබඳව වගකීමෙන් කටයුතු කරන්න ඕනි. සභාවේ සේවකයින් ,ඒ සම්බන්ධ සියළු දෙනා. කව්රු පාලකයින් උනත් මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න වෙනවා. ඉස්සර හිටිය සුප්පරේ, මුණියන්ඩි වගේ සෞඛ්‍ය කම්කරු මහතුන් ඔවුන්ගේ සේවය උපරිමයෙන් කලා. නාමිකව පමනක් හිටියට වැඩක් නෑ. කැපවී කටයුතු කල යුතුයි. නමුත් මේ වෙන කොට මේ කටයුතු කරන්න ඉදිරිපත් වෙන අයත් නෑ. නවින තාක්ෂනය භාවිතයෙන් දුගඳ අඩු කරලා පරිසරයට හානියක් නොවන ආකාරයෙන් කටයුතු කරන්න වෙනවා. පාසැල් සංවර්ධන සමිතිය නඩුවක් දැම්මමොත් ඒක විශාල ගැටළුවක්. මේක සරලව හිතන්න එපා. නාමල්දෙනිය ගිමන්හලේ වැසිකිලිය උතුරලා නඩු දැම්මත් විද්‍යාත්මක ක්‍රමවේද වලින් ඒක හැදුවා. මේවා ගැටළු සාමුහිකව මේ ගැටළු විසඳමු. පාසැලට තියෙන ප්‍රශ්න අපි කසළ කලමණාකරණ ආයතන වලින් උපදෙස් අරන් විසඳමු. විධිමත් ලෙස කසළ එකතු කරන්න. සමහර කාන්තාවෝත් මේ කටයුතු පිලිවෙලට කරනවා. පොහොරබාව අක්කර ගානක කසල. වැඩි ප්‍රමාණයක් පොලිතීන්. ඒවාට විධිමත්ව

ක්‍රමවේද හදලා වෙනම එකතු කරන්න. සේරම පොහොරබාවට අරින්න එපා. ඔය ඉඩම නැති උනොත් කසළ දාන්න තැනක් නෑ. කසළ ආයෙත් දාන්න වෙන්නේ සභාවේ. විවේචන වැදගත්. නමුත් ඒවාට ක්‍රමවේදත් කියන්න. මේ කටයුත්ත හරියට කරගන්න බැරිඋනොත් සභාව පේල්. මේ තාක් කල් පොහොරබාවේ පොහොර හැදුවාද? හැදුවානම් පෙන්නන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලීන් අධිකාරම් මහතා -</u>**

මමත් පරිසර කමිටුවේ ඉන්නවා. මේ කසළ වලින් ආර්ථික වටිනාකමක් ගමු. මේ කසල කටයුතු වර්ගීකරණයේ සිටම විධිමත් විය යුතුයි. කසළ එකතු කරන කම්කරු සහෝදර වරු අගය කල යුතුයි. මේ කසළ පිලිබඳව සභාවේ දත්ත පද්ධතියක් නෑ. වීදි ලාම්පු වගෙයි. ප්‍රජාව, පාසැල් පන්සල් දැනුවත් කරලා මේ කටයුතු විධිමත් කරමු. එකතු වෙලා කැප වෙලා මේ ගැටළු විසඳමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා -</u>**

දෙරෙගොඩ මන්ත්‍රි තුමා කීවේ ඇත්තක්. පාසැලට මීටර් 500 වගේ දුරයි. ඒකාලේ මැසි ප්‍රශ්ණය ඇවිත් අපි මැසිනාෂක භාවිතා කරලා ගැටළුව විසඳුවා. ජලයට කසල එකතු වීමේ ගැටවවක් තිබුනේ නෑ. කන්ද උඩ කොටසේ කසළ දාලා නිසි ලෙස වැහුවා. වැලිගම සභාව කසළ එලිමහනේ දාලා කටයුතු කරන්නේ. අවිස්සාවේල්ල පාරට උඩින් කසල කටයුතු කරන්නේ. අපිට පළාත් පාලන ආයතනයක් ලෙස කසළ කටයුතු විසඳන්න වෙනවා. කඩිනමින් කසළ පෝර කරන්න ක්‍රමවේද හොයමු. බේල් මැෂින්,කසළ වර්ගීකරන විධි මේවා ක්‍රියාත්මක කරමු. උපදෙස් ගමු. දේවින්ද මන්ත්‍රි තුමා කිව්වා වගේ කසල කම්කරු පිරිස අගය කල යුතුයි. ඔවුන්ගේ සුළු සුළු අඩුපාඩු ඇති. නමුත් ඔවුන් කරන මේ කටයුත්ත අගය කලයුතුයි. ඒ වගේම මේ ඉඩම විතරයි කසල කටයුතු වලට සභාවට තියෙන්නේ. ඒ නිසා ඒ සම්බන්ධව අවධානය දෙන්න. වෙන තැන් තියේ නම් හොඳයි. නමුත් මේ කටයුත්තට දැනට තියෙන්නේ මේ ඉඩම විතරයි.

ගරු සභාපතිතුමා විසින් මෙම අවස්ථාවේදි වළදුර බන්ධනාගාරයේ ඉදිකර ඇති පොහොර ව්‍යාපෘතියට අදාල විස්තර සභාවට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව 2024 සභා අරමුදල් වලින් වළදුර කසළ කලමණාකරන තනි මහල් ගොඩනැගිල්ල ප්‍රති සංස්කරනය හා පුළුල් කිරිමට කොන්ත්‍රාත් කරුවන එල්.පී. කන්ස්ට්‍රක්ෂන් , එක්නැලිගොඩ වෙත ගෙවීම් බිල්පත් දෙකකින් සිදු කර ඇති අතර පළමු කොටස් බිල්පත 2024.09.12 දින රු.3058875.90 ක්ද දෙවන කොටස් බිල් පත 2024.11.11. දින රු.1750590.00 ලෙසද ගෙවීම් කර ඇත. එසේම 2025 වසරේ සභා අරමුදලෙන් වළදුර කසළ කලමණාකරන තනි මහල් ගොඩනැගිල්ල වැඩිදියුණු කිරිම - 2 අධියර සඳහා කොන්ත්‍රාත්කරු වන එකමුතු මරණාධාර සමිතිය, වලදුර, කුරුවිට වෙත වැඩ අවසන් බිල්පත සඳහා 2025.05.30 දින රු.1630213.33 ක් ද 10% රඳවුම් මුදල වන රු.181134.81 ක මුදල ගෙවීම් අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. එසේම 2005.11.25 දිනැතිව අංක 19226 යටතේ කුරුවිට ප්‍රාදේශීය සභාව වෙනුවෙන් එහි ගරු සභාපතිවරයාද බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල් තුමා වෙනුවෙන් කුරුවිට බන්ධනාගාරයේ සහකාර බන්ධනාගාර අධිකාරී තුමාද එක්ව කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතිය වෙනුවෙන් ගිවිසුමක් අත්සන් නොට ඇත. එම ගිවිසුමේ පිටපත ඉදිරිපත් කරන ලදී.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -

මම පසුගිය දිනෙක බන්ධනාගාරභූමියේ ඇති ව්‍යාපෘතිය බලන්න ගියා. පොලිතීන් ඇතුළු නොදිරන ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් තිබුණ. රැඳවියන් 15 ක් විතර වැඩ කළා. බන්ධනාගාර අධිකාරිතුමා සමගත් කථා කලා. සභාවෙන් පහසුකම් ලබා දීලා. මේ කටයුතු පරිසර කමිටුවේත් කතා කලා. විශේෂත්වය පොහොරබාවේ කසළ අංගන ගොඩනැගිල්ල ප්‍රයෝජනයට අරන් නෑ. දැනට වලවල් කපලා කසළ වල දානවා. පළාත් පාලන කොමසාරිස් එක්කත් පළාත් සභාව එක්කත් කතා කලා. ඒ අය එකඟයි වැඩි දියුණු කළ තාක්ෂනය සඳහා ප්‍රාග් ධනය දෙන්න. මේ ඉඩමේ අයිතිය නිසි අරන් නෑ. අයිතිය කඩිනමින් ගන්න ඕනි. මේ ස්ථාන දෙකේම ගැටළු විසඳගන්න ඕනි. වෙනත් ගම් වල කසළ අපිට එපා කිව්වට බෑ. අපි නිසි ක්‍රමවේද වලට යමු. අපහසුතා ඇති නොවන ලෙස මේ කටයුතු කරමු. සැළසුම්, යෝජනා හදලා නිසි උපදෙස් අරන් ඉදිරි සභාවට ඉදිරිපත්කරනවා. මේ ස්ථාන දෙකේම තියෙන කසළ සම්බන්ධ ගැටළු අපි එකතු වෙලා උපරිමයෙන් විසඳමු. මන්ත්‍රීතුමාට තව දුරටත් වලදූර කසළ ව්‍යාපෘතිය ලිපිබඳ තොරතුරු අවශ්‍ය වේ නම් අදාළ ගොණුව ඉදිරිපත් කර ඇත.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභාවේ සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතාගේ යෝජනාව අනුව** කුරුවිට ප්‍රාදේශීය සභාව හා වලදූර බන්ධනාගාරය එක්ව ක්‍රියාත්මක කොම්පෝස්ට් ව්‍යාපෘතියේ විස්තර පිලිබඳ සභාව දැනුවත් කල අතර වලදූර බන්ධනාගාරය එක්ව ක්‍රියාත්මක කොම්පෝස්ට් ව්‍යාපෘතියේ හා පොහාරබාව කසළ ව්‍යාපෘතියේ ඇති ගැටළු විසඳීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා -**

06-79. මෙනේරිපිටිය වසම පහලකන්ද වඩිගෙවත්ත මාර්ගයේ පිහිටි ගල් කඩා ඉවත්කර මාර්ගය සකසා මීටර් 200 පමන කොන්ක්‍රීට් කිරිමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා -**

ගෙවල් 30 ක් විතර ජනතාවක් භාවිතා කරන මාර්ගයක්. ගල කඩා කොන්ක්‍රිට් කල යුතුයි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභාවේ සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතාගේ යෝජනාව අනුව** මෙනේරිපිටිය වසම පහලකන්ද වඩිගෙවත්ත මාර්ගයේ පිහිටි ගල් කඩා ඉවත්කර මාර්ගය සකසා මීටර් 200 පමන කොන්ක්‍රීට් කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.දේවින්ද කුමාර මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.දේවින්ද කුමාර මහතා -**

06-80. ගලුකාගම කොට්ඨාශයේ ගලුකාගම ගුලනගොඩ ගම්මානයේ අතුරු මාර්ගය සම්බන්ධව පැනනැගී ඇති ගැටළු විසඳීමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා සම්පත් බොතේජු මහතා**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.දේවින්ද කුමාර මහතා -**

යහපාලන සමයේ කෝටි 40 කට වඩා මුදලක් වැය කරලා සංවර්ධනය කලා. මේ මාර්ගය කොන්ත්‍රාත් කටයුතු කලේ තෙප්පනාව පැත්තේ අයෙක්. මුලින් වැඩය නිසි අයුරින් සැලසුම් කරලා අධික්ෂනය කරලා තිබුනා. නමුත් මේ මාර්ගය වැඩ පටන් අරන් පැය 1 වත් ගියේ නෑ මීටර් 20 කට වඩා කොන්ක්‍රීට් කරලා. මම සොයා බැළුවා. පාරේ අඟල් දෙකක් නෑ. කොන්ක්‍රීට් එක. ලෑල්ල උස්සලා අඟල් 5ට හැදෙව්වා. ගම මැද හෝටලයක් තියෙනවා. ඉංජිනේරු වරයෙක් ගේ. ජන්දය දෙන්න ඇත්තෙත් මට. ලක්ෂ 15 ක් වැය කරලා සංවර්ධනය කල පාර . අර හෝටලයේ වැඩ වලට ගෙනාපු බැකෝ එකෙන් අර මාර්ගය අඟල් දෙකේ තුනේ කෑලි වලට පාර කැඩිලා.

මේ ගැන සොයා බලන්න.වෙල් යායට තියෙන පාර ලක්ෂ 5 ක් යොදවලා මම හැදුවා. ඒ පාර ත් ගොඩනැගිල්ල ට කපපු පාරට අරන් පුළුල් කරලා. පුද්ගලික දේපලක් වගේ .ලක්ෂ 20 ක් අවභාවිතයි. ඒතුමාට පුළුවන්ද ඒ පාර ගොඩ කරන්න. ක්‍රමවේදයක් තියේද? හැකි ඉක්මනින් සොයා බලන්න. එතන තිබුන දැන්වීම් පුවරුවත් ගලවලා. මගේ නම, ආයතනය, මුදල සඳහන් පුවරුව. කාර්මික නිලධාරි, ලේකම්, සභාපතිතුමා යමු. මාත් එන්නම්. අවිධිමත් ලෙස කළ කටයුත්ත සොයා බලා නිවැරදි කරන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභාවේ සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.දේවින්ද කුමාර මහතා ගේ යෝජනාව අනුව** ගලුකාගම කොට්ඨාශයේ ගලුකාගම ගුලනගොඩ ගම්මානයේ අතුරු මාර්ගය සම්බන්ධව පැනනැගී ඇති ගැටළු විසඳීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.දේවින්ද කුමාර මහතා -**

06-81. ගලුකාගම ගබ්බෙල ගම්මානයේ අතුරුමාර්ගය සම්බන්ධව පැනනැගී ඇති ගැටළු විසඳීමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා කැළුම් ධර්මදාස මහතා**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.දේවින්ද කුමාර මහතා -**

රුවන් මන්ත්‍රි තුමා, ගුණවර්ධන සභාපතිතුමා, මල්කැකුළ සභාපතිතුමා මේ පාරේ කොටස් කිපයක් සංවර්ධනය කලා. මමත් කොටසක් සංවරධනය කලා. ආණ්ඩුවට හිතවත් අයෙක්

ගබ්බෙල බැකෝ'දාලා පතල් කැපුවා. දේශපාලන බලය මත. ඒ පතලෙට බැකෝ එකක් පටවාගෙන ගිය වාහනෙන් අර පාර කැඩුනා. මට ජනතාව මේ ගැන කිව්වාම මම කිව්වා ආයෙත් මේ වගේ වැඩ කරන්න එපා කියලා. ඒත් ඒ අය ආණ්ඩුව ඒ අයගේ හින්දා අර බැකෝ එක ඒ විධිහටම පාරේ ගෙනිච්චා. ඊට පස්සෙත් ලොරියක් ගෙනාවා. ලොරිය ලොකු හින්දා පාර ආයෙත් කැඩුනා. අපි පොලිසි ගියාම ලේකම් තුමිය කාර්මික නිලධාරි මගින් ඇස්තමේන්තු හැදුවා ලක්ෂ 55 ක්. නමුත් පැමිණිල්ලට ලේකම්තුමියත් කාර්මික නිලධාරීත් ආවේ නෑ. ඒකට වෙච්ච දෙයක් නෑ. පවුල් 100 ක් විතර භාවිතා කරන පාර. විධිමත් ක්‍රියාමාර්ගයක් ගන්න. මේ කටයුත්තට මහාචාර්ය කෙනෙක් හවුල්. ගිය අප්‍රියෙල් 08 වෙනිදා පැමිණිල්ල දැම්මේ. කාර්මික නිලධාරී වාර්තා ඇති ලක්ෂ 55 ක් ඇස්තමේන්තුව. පොලිසියෙන් ගමේ අයට කියනවා මේ කට සම්බන්ධ අයගේ නම් ගම් හොයලා දෙන්නළු. ඒ තොරතුරු පොලිසියෙන් හොයාගන්න ඕනි. පැමිණිලි අංකය තියෙනවා. තොරතුරු අරන් ඒ කටයුත්ත නිම කරන්න. ජනතාව වෙනුවෙන්

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

ගිය වසරේ අප්‍රේල් වන විට අපි බලයේ හිටියේ නෑ. නමුත් ගැටළුවක් නෑ. තොරතුරු දෙන්න. නිශ්චිත ක්‍රියාමාර්ග ගත හැකියි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.දේවින්ද කුමාර මහතා -</u>**

ගමේ අයගෙනුත් විස්තර ගන්න. පැමිණිලි අංකය, දිනය දෙන්නම්. ඉදිරි කටයුතු කරන්න.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

මේ වගකීම් නිලධාරී දැරුවේ නැත්නම් අධිභාර වෙනවා. අපේ ගමේත් මේ වගේ දෙයක් උනා. ලියුමක් වත් නෑ. පණත අනුව කටයුතු නොකලොත් ඒක වැරුද්දක්. පැමිනිල්ලක් කලොත් අන්තිමට අහිංසක මිනිහා කොටු වෙන්නේ. මේ වගකීම් දරලා කටයුතු කරලා පනතේ ජීවමාන කම රකින්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>**

වලදූර පාරේ අනවසරයෙන් දැව ප්‍රවාහනක් උනා. කම්පැනියක් කොන්ත්‍රාත් අරන් කපපු දැව පාරේ ගෙනිච්චා. අපේ නිලධාරී ගියාට අයිතිකාරයෙක් හොයාගන්න බෑ කියලා ආපහු ආවා. වළදූර පාරේ කැඩුන තැන්වලට පැච් දැම්මා ට පාර පළුදු උනා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.දේවින්ද කුමාර මහතා -</u>**

අප සභාපතිතුමා කිව්වා වගේ මටත් පොලිසිය සද්දේ දැම්මා. පැමිනිල්ල දාපු අය බය උනා. ඒ මිනිස්සු කුඩු කරන තත්වෙට පත් උනා. මාර්ගය සැල්ලඩ වෙලා ඉවරයි. මම මේ සිද්ධිය සභා දෙකක කිව්වා. මෙවරත් ක්‍රියාත්මක නොවුනොත් මම සභාවට විරුද්ධව නීති පියවර ගන්නවා.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

විස්තර දෙන්න. මේ කටයුත්තට මාදිහත් අන අය සොයා බලලා ක්‍රියා මාර්ග ගන්නවා. ඇස්තමේන්තුවත් ගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභාවේ සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.දේවින්ද කුමාර මහතා ගේ යෝජනාව අනුව** ගලුකාගම ගබ්බෙල ගම්මානයේ අතුරුමාර්ගය සම්බන්ධව පැනනැගී ඇති ගැටළු විසඳීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි කේ.කේ.දයාවතී මිය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා -</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි කේ.කේ.දයාවතී මිය -</u>**
06-82. කඳන්ගොඩ සුමග මාවත පාර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි කේ.කේ.දයාවතී මිය -</u>**
ඔබ තුමාත් මේ මාර්ගයේ තත්වය දන්නවා. අත්‍යාවශ්‍ය කටයුත්තක්.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභාවේ සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි කේ.කේ.දයාවතී මිය ගේ යෝජනාව අනුව** කඳන්ගොඩ සුමග මාවත පාර සංවර්ධනය කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි කේ.කේ.දයාවතී මිය -</u>**
06-83. වතුයාය රේල්පාර වාලට් මහත්මිය ඇතුළු නිවාස කීපයකට පිවිසෙන මාර්ගය අබලන් වූ කොටස් සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභාවේ සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි කේ.කේ.දයාවතී මිය ගේ යෝජනාව අනුව** වතුයාය රේල්පාර වාලට් මහත්මිය ඇතුළු නිවාස කීපයකට පිවිසෙන මාර්ගය අබලන් වූ කොටස් සංවර්ධනය කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි කේ.කේ.දයාවතී මිය -</u>**

06-84. පැරඩයිස් ලේක්සයිඩ් ළමා ක්‍රීඩාංගනය බැකෝ රථය මාර්ගයෙන් සුද්ධ පවිත්‍රකිරිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි කේ.කේ.දයාවතී මිය -</u>**
ළමයින්ට සෙල්ලම් කරන්න තියෙන පිට්ටනිය. විශාල කැලයක් හැදිලා. බැකෝ එකකින් තමා සුද්ද කරන්න වෙන්නේ.ඉඩමට යන්න අමාරුයි. තනි පුද්ගලයෙක් මේක භුක්ති විඳලා අපි ඒක සභාවට අත්පත් කර ගත්තා. නමුත් මිනිස්සු යන්න බයයි. ඒ නිසා සභාව මගින් කරලා දෙන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභාවේ සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.කේ.දයාවතී මිය ගේ යෝජනාව අනුව** පැරඩයිස් ලේක්සයිඩ් ළමා ක්‍රීඩාංගනය බැකෝ රථය මාර්ගයෙන් සුද්ධ පවිත්‍රකිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා -</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -</u>**

06-85. පරකඩුව ප්‍රදේශය දක්වා පාණීය ජලය ලබාදීමට ජලනල එලා ඇති විසල් රත්නපුර ජලයෝජනා ක්‍රමයේ ඉතිරි වැඩ නිමකිරිමට අදාළ අංශ දැනුවත් කර පරකඩුව ගිනිදමන ගම්මානය ප්‍රදේශයේ ජනතාවට පානීය ජලය ලබාදීමට කටයුතු කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මහේෂ් නිරෝෂන නාපාවල මහතා</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -</u>**

දැඩි අවශ්‍යතාවක් මේ. 73 කණුව දක්වා නල එලලා. නමුත් මේ ප්‍රෙද්ශයට තව දුරටත් නළ එලලා වතුර දීම කල යුතුයි. ලිං වල වතුර නෑ. කාලින අවශ්‍යතාවක්. ජාතික ධනය කෝටි ගානක් වැය කරලා තියෙන ව්‍යාපෘතියක්. පරකඩුව ගිනිදමන ගම්මානය ප්‍රදේශයේ ජනතාවට පානීය ජලය ලබාදීමට කටයුතු සලසන්න.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

අදාළ අංශ දැනුවත් කරමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මහේෂ් නිරෝෂන නාපාවල මහතා</u>**

මේ පැත්තේ බොහෝ විට කුඹුරු පුරවලා ගොඩ කරපු ප්‍රදේශ. ලිං කැපුවට මඩ තියෙන්නේ. ග්‍රාමීය ප්‍රජා ජල එකටත් යොමු කලා. අපි මැදිහත්වෙමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභාවේ සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා ගේ යෝජනාව අනුව**_පරකඩුව ප්‍රදේශය දක්වා පාණීය ජලය ලබාදීමට ජලනල එලා ඇති විසල් රත්නපුර ජලයෝජනා ක්‍රමයේ ඉතිරි වැඩ නිමකිරිමට අදාළ අංශ දැනුවත් කර පරකඩුව ගිනිදමන ගම්මානය ප්‍රදේශයේ ජනතාවට පානීය ජලය ලබාදීමට අවශය මැදිහත්වීමේ කටයුතු කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -</u>**

06-86. අපි 20 ප්‍රජා මණ්ඩලයේ බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිමකිරීමට රු.200000.00 ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා**

මේක ප්‍රජා මණ්ඩල බහුකාර්ය ගොඩනැගිල්ල. පෙර පාසැලකුත් හදනවා.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභාවේ සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා ගේ යෝජනාව අනුව** අපි 20 ප්‍රජා මණ්ඩලයේ බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිමකිරීමට රු.200000.00 ක ප්‍රතිපාදන ලබාදීමට_මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -**

06-87. බටහිර පත්බේරිය වැටුම්මල පදිංචි කේ.ඩී.නිරෝෂණ දේශප්‍රිය මහතා පිළිකා රෝගයෙන් පෙලෙන අතර ඔහුගේ දරුවාද හදවත් රෝගයෙන් පෙලෙන බැවින් ආර්ථික දුෂ්කරතා මැද ජීවත්වන ඔහුට ප්‍රතිකාර ගැනීමට මෙම සභාවෙන් කරුණාසහගත දීමනාවක් ලබාදීමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂණ නාපාවල මහතා -**

එම යෝජනාව ස්ථිර කරමි. බායිගෙවත්තේ ජීවත් වෙන්නේ. දරුවනුත් හෘද රෝගීන්. පියාටත් පිලිකාවක්. හැකි උපරිමය කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා**

අසරණ පවුලක්. රු.15000.00 ක කරුණාසහගත දීමනාවක් දෙමු. විස්තර ඉදිරිපත් කරලා තියෙනවා.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -

අදාළ ක්‍රමවේදය අනුව කටයුතු කරමු.

ඒ අනුව මහ සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව මහා සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතාගේ යෝජනාව අනුව** බටහිර පත්බේරිය වැටුම්මල පදිංචි කේ.ඩී.නිරෝෂණ දේශප්‍රිය මහතා පිළිකා රෝගයෙන් පෙලෙන අතර ඔහුගේ දරුවාද හදවත් රෝගයෙන් පෙලෙන බැවින් ආර්ථික දුෂ්කරතා මැද ජීවත්වන ඔහුට ප්‍රතිකාර ගැනීමට මෙම සභාවෙන් රු. 15000.00 ක කරුණාසහගත දීමනාවක් ලබා දීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.දමින්ද නලීන් අධිකාරම් මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.දමින්ද නලීන් අධිකාරම් මහතා -**

06-88. ලෙල්ලගොඩ LAP ස්ටෝර්ස් එක අසලින් ගඟ දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා -</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.දමින්ද නලින් අධිකාරම් මහතා -</u>**

මේ මාර්ගය ගමන් කිරිමට අපහසු තත්වයට පත් වෙලා. වලවල් වහලා සංවර්ධනය කරන්න ඕනි. පවුල් 30 ක් විතර ඉන්නවා. කඩිනම් කල යුතු කටයුත්තක්.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා -</u>**

ඔය ප්‍රදේශයේම මිල්ලවිටිය ඒ මාර්ගය කිට්ටුව වැටක් ගහලා. විසඳාගන්න පුළුවන් වෙයි.අඩි 12 ට පාර තියෙන්නේ. කාර්මික නිලධාරි මගින් ගැටළුව විසඳමු.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

කාර්මික නිලධාරි අරිමු.

ඒ අනුව මහ සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව මහා සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.දමින්ද නලින් අධිකාරම් මහතා ගේ යෝජනාව අනුව** ලෙල්ලගොඩ LAP ස්ට්‍රෝර්ස් එක අසලින් ගඟ දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.දමින්ද නලින් අධිකාරම් මහතා -</u>**

06-89. කොක්ඕවිට බටහිර මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා -</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.දමින්ද නලින් අධිකාරම් මහතා -</u>**

පාසල් ලමයින්ට පහසුවක්. දුෂ්කර මාර්ගයන් නිසා ඒක හදා දෙන්න.

ඒ අනුව මහ සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව මහා සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. දමින්ද නලින් අධිකාරම් මහතා ගේ යෝජනාව අනුව** කොක්ඕවිට බටහිර මාර්ගය සංවර්ධනය කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩග්ලස් ප්‍රේමදාස මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>**

06-90. කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් කොස්ගල කිතුල්පෙ ප්‍රධාන මාර්ගය සම්බන්ධයෙන් ඇති ගැටළු විසඳීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩග්ලස් ප්‍රේමදාස මහතා -</u>**

කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් කොස්ගල කිතුල්පෙ ප්‍රධාන මාර්ගය සම්බන්ධයෙන් ඇති ගැටළු විසඳීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩග්ලස් ප්‍රේමදාස මහතා -

ළමයි 100 ක් විතර පාසැල් යන මාර්ගයක්. නමුත් මේ පාර සංවර්ධන කටයුතු වලට කියලා වහගෙන ඉන්නේ. අඩු සේවක පිරිසක් දාලා වැඩ කරන්නේ. කටයුතු කඩිනම් කරලා පාර අරින්න. දෙපස නිවාස වල ඇතැම් බැම් කඩන කොට හදලා දෙනවා කියලා . නමුත් හැදුවේ නෑ. අදාළ අංශ දැනුවත් කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

මටත් මේ සම්බන්ධව අවස්ථා ගනනාවකදි කිව්වා. මේ ගැන සොයා බලන්න කිව්වා. මේ වන විට කොස්ගල ,කිතුල්පෙ ,කරපිංච බස් වලට එන්න බෑ. මාර්ගයේ. කහංගම මාර්ගයත් සංවර්ධනය කරනවා. මේ වැඩේ පිලිවෙලට හරියට කරනවා. කලින් හදන්න බැරිඋන කොටස. උල්දිය උල්පත් මාර්ගයේ. කාණු නැතිව බෑ. වරින්වර මැණික් ගරලා. කාණු පද්ධතිය හදනවද? කාණු නැතිව වැඩක් නෑ. ප්‍රජාවට අවැඩත් වෙනවා. මම ඒ ස්ථානයට ගියා. ඉවුර කපලා. අඩි 4 ක පැතිබැම්මක් අනුමත වෙලා. නමුත් ආයේ කියලා එතන නාය යන්නෑළු. අනාරක්ෂිත නෑළු. මෙවැනි අකටයුතු සුදුසු නෑ. ජනතාවට තර්ජනය කිරිම හරි නෑ. ඒ තැන අනතුරුදායකයි. තැපැල් කන්තෝරුවේ වැසිකිලිය පාරට කැඩිලා. මම මගේ ඉඩමෙනුත් අඩි 3 ක් දෙනවා. බැම්ම කඩලා මමමයි හදන්නේ. විශාල සංවර්ධන කටයුත්තක් පුංචි දේවල් නිසා විනාශ කරන්න එපා. කරන වැඩේ හොඳ වුනාට ජනතාවට තර්ජනය කිරීම හරි නෑ. ගිය ආණ්ඩු දෙකෙන්ම නොකල දෙයක් කරන්නේ. නමුත් තර්ජන හරි නෑ. මම ඔප්පු කරලා පෙන්නනවා. අර ගල් දෙක ගලවලා පාර හදන්න ඕනි. නමුත් අනතුර ඉවත් වෙන්න ඒ කෙටි දුර කාණුව හදලා දෙන්න. අපි සහාය දෙනවා සියළු කටයුතු වලට. විනිවිදව කරන සියළු කටයුතු වලට සහාය දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජස්ටින් රණවීර මහතා -

**මාත් කාර්මික නිලධාරීත් ගිහින් කතා ගලේ. මේ කටයුත්ත සම්බන්ධව. පාර හැදෙන කොට අඩි 3 ක් ගන්න අපි කතා කලා. එයාලා මුලින්ම විරුද්ධ උනා. පස්සේ ලිපියක් දෙන්න කිව්වා. හැමතැනම බැම් ගහන්නේ නෑ. ගෙදර ඉඳන් අඩි 70 ක් දුරයි පාරට. අපි තර්ජනය කලේ නෑ. ඉල්ලිමක් කලේ. මිනිස්සුන්ව පොළඹවන්න එපා. මේ කටයුතු වලට විරුද්ධව. පොදු මාර්ගයයි හදන්නේ. හැකි තැන්වල අවම හානි වන විධිහට වැඩ කලේ. පාරේ කටයුතු පරක්කු උනේ හැමතැනම පාරවල් වල වැඩ පටන් අරන්. මාර්ගය සම්බන්ධ ප්‍රමිතිය ගන්න තාක්ෂනික ගැටළු වගේ දේ නිසා ප්‍රමාද වුනේ. කළුගල් ගන්න තිබුනේ නෑ. වාහන නෑ. ප්‍රවාහන ගැටළු. අපේ මොන ගැටළු තිබුනත් ජනතාව වෙනුවෙන් කරන කටයුතු වලට සහාය වෙන්න.මට මරන තර්ජනත් ආවා. මාර්ගය හදන්න විතරයි මුදල් පාස් උනේ. මේ පාර හදනවට විරුද්ධ වෙන්න එපා. බාධා කරන්න එපා.**

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

ඉහල ප්‍රමිතියක් සහිතව මාර්ගය සැකසීම වැදගත් ආදර්ශයක්. ප්‍රජාව වෙනුවෙන් කරන කටයුත්ත විධිමත් විම වැදගත්.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජස්ටින් රණවීර මහතා -</u>**

මේ සම්බන්ධව කලින් නීතිමය කටයුතු වලටත් ගිහින්. යම් පුද්ගලයෙකුගේ උවමනාවක් ඉටු කරන්න ගිහින් ඉංජිනේරුවරයා ත් වගකීම භාරගන්න වෙනවා මේ පාර ගංවතුරට යට උනොත්. ගංවතුර අවම කරන්න කාණු දාන්න කිව්වම ඒ ගම්වල ඉන්න අයගේ කීමත් සලකලා බලන්න ඕනි. ඒ අය දන්න නිසයි කියන්නේ. ගෙවලි වලටත් වතුරෙන් බලපෑම් වෙයි. ඒවට වගකියන්න වෙන්නේත් නිලධාරින්ට තමයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩග්ලස් ප්‍රේමදාස මහතා -</u>**

මේ මාර්ගයේ බෝක්කු ව සම්බන්ධව ත් ගැටළු. ඒ ගැටළු නිරාකරනය කරලා දෙන්න.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

මේ මාර්ගය බලන්න ගියා. මාර්ග කටයුතු වලට වෙන්කල මුදල් ප්‍රමාණයක්, දුර ප්‍රමාණයක් ,තියෙනවා. අපි මාර්ගය දෙපස අයවත් හමු උනා.ඒ නිලධාරින්ව කාර්මික නිලධාරිව ,ඉංජිනේරු වරයාව දැනුවත් කලා. කිසිදු ගැටළුවක් නොවන විධිහට පාර හදනවා කිව්වා. වතුර බැස යාම, පළල,හානි අවම වන විධියට කරන්නේ කිව්වා. ඒ කණ්ඩිය ලඟ පාර පටුයි. බස් එක යනකොට කණ්ඩිය උඩ වගේ යන්නේ. ඇල වෙනවා. පාර පළල මදි. අදාළ ප්‍රමාණයෙන් බැම්ම බැන්දාම ඇති කිව්වා. මොන දේ කළත් ගැටළුත් තියෙනවා. නමුත් මේ ප්‍රතිලාභය ජනතාවටමයි. මේ කටයුත්ත නිසි ප්‍රමිතියෙන් කරන්න අවශ්‍ය සහාය දෙන්න. අවශ්‍ය මැදිහත් විම් කරමු.

ඒ අනුව මහ සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිකව මහා සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩග්ලස් ප්‍රේමදාස මහතා ගේ යෝජනාව අනුව**_කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් කොස්ගල කිතුල්පෙ ප්‍රධාන මාර්ගය සම්බන්ධයෙන් ඇති ගැටළු විසඳීමට මැදිහත්විමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි එම්.ඒ.ඉනෝකා මල්ලව ආරච්චි මිය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි එම්.ඒ.ඉනෝකා මල්ලව ආරච්චි මිය -</u>**

06-91. කිරිඇල්ල නගරය විධිමත් ලෙස නගර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි එම්.ඒ.ඉනෝකා මල්ලව ආරච්චි මිය</u>**

ගරු උප සභාපතිතුමා නගර ගැන කියද්දි මේ සම්බන්ධවත් කතා කලා. කිරිඇල්ල නගරයට වැසිකිළියක් නැති ගැටළුව ප්‍රධාන අවශ්‍යතාවක්. කාන්තාවන්ට මේ ගැටළුව තදින්ම දැනෙනවා. කඩිනමින් කිරි ඇල්ල නගරයේ සංචාරයක් සිදුකර සංවර්ධනය කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු කරන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව මහා සභාවේ සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එම්.ඒ.ඉනෝකා මල්ලව ආරච්චි මියගේ යෝජනාව අනුව** කිරිඇල්ල නගරය විධිමත් ලෙස නගර සංවර්ධනය කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එම්.ඒ.ඉනෝකා මල්ලව ආරච්චි මිය</u>**

06-92. බොරලැස්සවත්ත අඩි 100 ක් පමණ බොරළු පාර කොන්ක්‍රීට් කිරිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව මහා සභාවේ සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එම්.ඒ.ඉනෝකා මල්ලව ආරච්චි මියගේ යෝජනාව අනුව** බොරලැස්සවත්ත අඩි 100 ක් පමණ බොරළු පාර කොන්ක්‍රීට් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එම්.ඒ.ඉනෝකා මල්ලව ආරච්චි මිය -</u>**

06-93. හාන්දුකන්ද ප්‍රධාන මාර්ගයේ පිට්ටනිය අසල මාර්ගයේ කැඩී ඇති ස්ථානය ගිලාබසිමින්

පවතින නිසා පැතිබැම්ම සකසා මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එම්.ඒ.ඉනෝකා මල්ලව ආරච්චි මිය</u>**

මේ මාර්ගයේ යන බස්රථ, පාසැල් සේවය රථ වගේ ගංවතුර කාලෙට විකල්ප ලෙස භාවිතා කරන්නේ මේ මාර්ගය. ලොකු පල්ලමකුත් තියෙනවා නිතර නාය යාමට ලක්වෙන.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා -</u>**

දැනටමත් කිරිඇල්ල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට මේ කටයුතු සම්බන්ධව යොමු කරලා තියෙන්නේ. එකතු වෙලා මේ කටයුතු ටික කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව මහා සභාවේ සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එම්.ඒ.ඉනෝකා මල්ලව ආරච්චි මියගේ යෝජනාව අනුව** හාන්දුකන්ද ප්‍රධාන මාර්ගයේ පිට්ටනිය අසල මාර්ගයේ කැඩී ඇති ස්ථානය ගිලාබසිමින් පවතින නිසා පැතිබැම්ම සකසා මාර්ගය සංවර්ධනය කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා විසින් ඉදිරිපත්කරනු ලබන යෝජනා-</u>

**06-94. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 78 වන වගන්තිය යටතේ සඳහන් කුරුච්ට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මහජන සෞඛ්‍යයට අදාල ව ප්‍රරෝහණය හා ආරක්ෂා කිරීමේ කාර්ය සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ සදහන් විධිවිධානයන්ට හෝ වෙනත් කවර හෝ ලිඛිත නීතියක් යටතේ සඳහන් විධිවිධානයන්ට පටහැණිව හෝ නොසලකා හැර**

කටයුතු කිරීමෙන් කිසියම් පීඩාවක් වන ආකාරයට කටයුතු යෙදි තිබේද යන්න පරික්ෂා කිරීම සඳහා දවසේ සාධාරන වේලාවක් තුළ කිසියම් වූ පරිශ්‍රයකට ඇතුල්වී පරීක්ෂා කිරීම සඳහා වන කාර්යය කාර්මික නිලධාරින් හා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් වෙත එක්ව හෝ වෙන් වෙන්ව ක්‍රියාත්මක කිරිමට හැකිවන පරිදි 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 216 වන වගන්තිය සමග කියවිය යුතු 100 වන වගන්තියේ විධිවිධාන අනුව සභාපතිවරයාගේ පොදු පරිපාලනයට යටත්ව අධිකාරිය දිය යුතුය යන්න සභාවට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

මෙය නීතිමය අවශ්‍යතාවක්. මේ වන විට මෙම බලය පැවරීම කාර්මික නිලධාරී ටී.ආර්.රංජන් කීර්ති මයා,කාර්මික නිලධාරී ටී.ටී.මනමේන්ද්‍ර මිය, මහජන සෞඛ්‍ය පරික්ෂක (එරත්න) කේඑන්.ආර්.රූපසිංහ මයා, මහජන සෞඛ්‍ය පරික්ෂක ( කීරගල ) පී.එන්.කුමාරසිංහ මයා, මහජන සෞඛ්‍ය පරික්ෂක (කුරුවිට,වැඩ බලන කිතුල්පෙ) එල්.ජී.පී.ජේ.කේ.ද සිල්වා මයා, මහජන සෞඛ්‍ය පරික්ෂක (පුස්සැල්ල) ආර්.එම්.එන්.එල්.පී.රාජපක්ෂ මයා, මහජන සෞඛ්‍ය පරික්ෂක (තලාවිටිය) එඩ්.එම්.ඒ.ඩී.වික්‍රමසිංහ මයා, මහජන සෞඛ්‍ය පරික්ෂක (තෙප්පනාව ) කේ.ජී.ආර්.වීරසිංහ මයා, සහ සැලසුම් ශිල්පී එම්.එස්.ඩී.එච්.ජයවර්ධන මිය වෙත සිදුකිරිමටද මෙම නිලධාරීන් ස්ථාන මාරු ලබා ගියහොත් ඔවුන්ගේ අනුප්‍රාප්තික නිලධාරින් වෙතද ඇතුළුව බලය පැවරීම සිදු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 78 වන වගන්තිය යටතේ සඳහන් කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මහජන සෞඛ්‍යයට අදාල ව ප්‍රරෝහණය හා ආරක්ෂා කිරීමේ කාර්ය සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ සඳහන් විධිවිධානයන්ට හෝ වෙනත් කවර හෝ ලිඛිත නීතියක් යටතේ සඳහන් විධිවිධානයන්ට පටහැණිව හෝ නොසලකා හැර කටයුතු කිරීමෙන් කිසියම් පීඩාවක් වන ආකාරයට කටයුතු යෙදි තිබේද යන්න පරික්ෂා කිරීම සඳහා දවසේ සාධාරන වේලාවක් තුළ කිසියම් වූ පරිශ්‍රයකට ඇතුල්වී පරීක්ෂා කිරීම සඳහා වන කාර්යය කාර්මික නිලධාරින් හා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් වෙත එක්ව හෝ වෙන් වෙන්ව ක්‍රියාත්මක කිරිමට හැකිවන පරිදි 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 216 වන වගන්තිය සමග කියවිය යුතු 100 වන වගන්තියේ විධිවිධාන අනුව සභාපතිවරයාගේ පොදු පරිපාලනයට යටත්ව අධිකාරිය දිය යුතුය යන්නත් මේ වන විට මෙම බලය පැවරීම කාර්මික නිලධාරී ටී.ආර්.රංජන් කීර්ති මයා, කාර්මික නිලධාරී ටී.ටී.මනමේන්ද්‍ර මිය, මහජන සෞඛ්‍ය පරික්ෂක (එරත්න) කේඑන්.ආර්.රූපසිංහ මයා, මහජන සෞඛ්‍ය පරික්ෂක ( කීරගල ) පී.එන්.කුමාරසිංහ මයා, මහජන සෞඛ්‍ය පරික්ෂක (කුරුවිට,වැඩ බලන කිතුල්පෙ) එල්.ජී.පී.ජේ.කේ.ද සිල්වා මයා, මහජන සෞඛ්‍ය පරික්ෂක (පුස්සැල්ල) ආර්.එම්.එන්.එල්.පී.රාජපක්ෂ මයා, මහජන සෞඛ්‍ය පරික්ෂක (තලාවිටිය) එඩ්.එම්.ඒ.ඩී.වික්‍රමසිංහ මයා, මහජන සෞඛ්‍ය පරික්ෂක (තෙප්පනාව ) කේ.ජී.ආර්.වීරසිංහ මයා, සහ සැලසුම් ශිල්පී එම්.එස්.ඩී.එච්.ජයවර්ධන මිය වෙත සිදුකිරිමටද මෙම නිලධාරීන් ස්ථාන මාරු ලබා ගියහොත් ඔවුන්ගේ අනුප්‍රාප්තික නිලධාරින් වෙතද ඇතුළුව බලය පැවරීම සිදු කිරිමටත් මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -

06-95. 2025.04.10 දිනැතිව මෙම සභාවේ පවත්වන ලද විගණන කමිටු තීරණය අනුව කුරුවිට ප්‍රාදේශීය සභා සීමාව තුළ හඳුනාගැනීමට නොහැකි වරිපනම් දේපල සම්බන්ධ කටයුතු කිරීමේ කමිටු සාමාජිකයින් පත්කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා-

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -

වරිපනම් දේපල සම්බන්ධ කටයුතු කිරීමේ කමිටු සාමාජිකයින් ලෙස අදාල සංයුතිය අනුව ගරු සභාපතිවරයා හා සභාවේ ලේකම් වරයා ඇතුළුව ආදායම් පරීක්ෂක ආර්.ඒ.පී.ප්‍රේමලාල් මහතා, ආදායම් පරීක්ෂක ඩබ්.ඩී.එම්.හාෂිත මයා, කිරිඇල්ල උප කාර්යාලයේ කාර්යභාර නිලධාරි දීපා රුවන්තිකා මිය, එල්ලාවල උප කාර්යාලයේ කාර්යභාර නිලධාරි එම්.වීරවර්ධන මයා, විෂය භාර නිලධාරී පි.එම්.ජේ.සල්මියා මිය, විෂය භාර නිලධාරී කළණි ලෙල්ලපිටිය මිය, රසික ලක්මාල් මයා (කම්කරු) (ආදායම් පරීක්ෂක කටයුතු සිදුකල) යන කමිටුව හඳුනාගෙන ඇත. ඒ අනුව එම පිරිස අදාල කමිටු සාමාජිකයින් ලෙස පත් කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-

සභාවේ විගනන වාර්තාව අප වෙත ලබා දෙන්න.
ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.
2025.04.10 දිනැතිව මෙම සභාවේ පවත්වන ලද විගණන කමිටු තීරණය අනුව කුරුවිට ප්‍රාදේශීය සභා සීමාව තුළ හඳුනාගැනීමට නොහැකි වරිපනම් දේපල සම්බන්ධ කටයුතු කිරීමේ කමිටු සාමාජිකයින් ලෙස ගරු සභාපතිවරයා හා සභාවේ ලේකම් වරයා ඇතුළුව ආදායම් පරීක්ෂක ආර්.ඒ.පී.ප්‍රේමලාල් මහතා, ආදායම් පරීක්ෂක ඩබ්.ඩී.එම්.හාෂිත මයා, කිරිඇල්ල උප කාර්යාලයේ කාර්යභාර නිලධාරි දීපා රුවන්තිකා මිය, එල්ලාවල උප කාර්යාලයේ කාර්යභාර නිලධාරි එම්.වීරවර්ධන මයා, විෂය භාර නිලධාරී පි.එම්.ජේ.සල්මියා මිය, විෂය භාර නිලධාරී කළණි ලෙල්ලපිටිය මිය, රසික ලක්මාල් මයා (කම්කරු) (ආදායම් පරීක්ෂක කටයුතු සිදුකල) යන පිරිස පත්කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -

06-96. කුරුවිට ප්‍රාදේශීය සභාව සඳහා කාන්තා හා ළමා කටයුතු සම්බන්ධව ක්‍රියාත්මක විමට කාන්තා හා ළමා කටයුතු පිළිබඳ කමිටුවක් පිහිටුවිමට හා සාමාජිකයින් පත්කිරීමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -
එම යෝජනාව ස්ථිර කරමි. වඩා වැදගත් වෙයි මේ කමිටුවට කාන්තා නියෝජිත වරියන් යොමු කරමු. නයනා මන්ත්‍රි තුමියත් දමමු. මේ කටයුත්ත අවශ්‍යයි කියලා මේ කටයුත්තට කමිටුවක් පිහිටුවන්න කියලා ඉල්ලුවේ. දයා කස්තුරි මන්ත්‍රි තුමියත් දමමු. ඇයත් මේ කටයුතු පිලිබඳව අත්දැකීම් තියෙන අයෙක්. ඉනෝකා මන්ත්‍රි වරියත් යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා-

අනෙක් කමිටු වලට නැති අය දාන්න. ඒ අයටත් අවස්ථාවක් දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නයනා ජීවනී අතුකෝරළ මිය -

ගරු සභාපතිතුමාට මේ කමිටුව පත් කරමු කීවේ මමයි. අනෙක් කමිටුවක මම ඉන්න එක ගැටළුවක් නම් මාව මේ කමිටුවට දාන්න එපා. නමුත් මේ කමිටුව පත් කරමු කියලා මම කිව්වේ පණත අනුව අපිට පැවරිලා තියෙන වගකීම් ටිකක් ඉටු කරන්නයි. මාතෘ දාරක සුභ සාධනය, සායනයේ දරුවන් එක්ක සියල්ලට මුහුණ දෙන්නේ කතුන්. ප්‍රදේශයේ විසල් ගැටළුවන් වන කසළ කලමණාකරනයේදී මූලික කාර්යභාරයක් ඉටු කරන්න කාන්තාවට පුළුවන්. ගෘහ පාලනයේදි කසල කලමණාකරණය නිසි ලෙස ඉටු කලොත් විතරයි, වෙන් කල කසළ තුලින් විතරයි නිසි ක්‍රමවේදයකට මේ සම්බන්ධව ඉදිරියට යන්න පුළුවන්. ඒ කටයුත්ත මුලින් ම කල හැක්කේ කාන්තාවකටයි. ඒ වගේම තමන්ගේ වත්ත තුලම දිරණ කසල ටික පෝර බවට පත් කර ගන්න මේ කාන්තාවට මුල් විය හැකියි. කාන්තාවක ලෙස කාන්තාවකගේ ගැටළු සමීපව අහන්න පුළුවන් තවත් කාන්තාවකටයි. මුල් ළමා විය සංවර්ධනය, කාන්තා ස්වයං රැකියා උත්පාදනය, අතට මුදලක් ලබාගන්න හැකි ක්‍රමවේද , ඇයට හඳුන්වා දෙන්න, උපදෙස් දෙන්න මේ කමිටුව මගින් පුළුවන්. ඉතින් මම හිතනවා මම මේ කමිටුවේ නැතත් මේ කටයුත්ත උපරිමයෙන් කරන්න කමිටුවට හැකි වෙයි කියලා.

මෙම අවස්ථාවේදී මෙම කමිටුවට සාමාජිකයින් පත් කිරිම සම්බන්ධව දිර්ඝ ලෙස සාකච්චා කෙරුණු අතර විවිධ නම් යෝජනා විය.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -

මෙම කමිටුවට සාමාජිකයින් පත් කිරීමේදි සියළු මන්ත්‍රි වරියන් නියෝජනයක් ගමු. සභාපතිවරයා, ලේකම්වරයා , කමිටුවේ සිටිය යුතුයි. මෙම සභාවේ 11 ක් ඉන්නවා කාන්තා නියෝජිත වරියන්. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී දයා කස්තුරි මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සුධීරා සේමිණී ලියනගේ මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී උමේෂා මල්කාන්ති මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී චූලා ශාන්ති මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සශිකලා මධුභාෂිනී මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලව ආරච්චි මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉරෝෂා උදයංගනි මිය ,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආශා සමන් කුමාරි මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී තනූජා දීපානි මිය, ඇතුළු සියළු මන්ත්‍රිණී නියෝජනය ගමු. මෙම සියළු දෙනාගේ දායකත්වයෙන් හැකි උපරිම සේවයක් ලබාදීමට හැකියාව ලැබෙනවා.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

කුරුවිට ප්‍රාදේශීය සභාව සඳහා කාන්තා හා ළමා කටයුතු සම්බන්ධව ක්‍රියාත්මක විමට කාන්තා හා ළමා කටයුතු පිළිබඳ කමිටුවක් පිහිටුවිමට හා එම කමිටුවේ සාමාජිකයින් ලෙස ගරු සභාපතිතුමා, සභාවේ ලේකම් වරයා, ඇතුළුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී දයා කස්තුරි මිය,

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සුධීරා සේමිණී ලියනගේ මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී උමේෂා මල්කාන්ති මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී චූලා ශාන්ති මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සශිකලා මධුභාෂිනී මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලව ආරච්චි මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉරෝෂා උදයංගනි මිය ,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආශා සමන් කුමාරි මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී තනූජා දීපානි මිය, ඇතුලත්ව මෙම කමිටුව පිහිටුවීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

06-97. විහාරාධිපති,ශාස්ත්‍රපති පූජ්‍ය කුරුවිට අනුරුද්ධ ස්ථවිර ස්වාමීන්වහන්සේගේ 2025.03.20 දිනැති ඉල්ලීම අනුව ශ්‍රී දළදා මාවත හා ශ්‍රී සද්ධාතිස්ස මාවත තුළ ඇති නම් කිරීමකින් තොරව පවතින පටුමහවල් නම්කිරීම සම්බන්ධව ඉදිරි කටයුතු කිරීමට සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

ශාස්ත්‍රපති පූජ්‍ය කුරුවිට අනුරුද්ධ ස්ථවිර ස්වාමීන්වහන්සේගේ ලිපියේ මෙම අවශ්‍ය මාර්ග සම්බන්ධ විස්තර දක්වා තියෙනවා. ඒ අනුව ශ්‍රී දළදා මාවත හා ශ්‍රී සද්ධාතිස්ස මාවත තුළ ඇති පටුමගවල් මේවන විට කිසිදු නම් කිරීමකින් තොරව පවතින අතර එම පටුමගවල් හේමමාලි පටුමග, විපුලතිස්ස නාහිමි පටුමග, හිරිපිටිය පටුමග, මායාදුන්න පටුමග, රාජසිංහ පටුමග, සීතාවක පටුමග, නිශ්ශංකමල්ල පටුමග, කීරවැල්ල පටුමග, දන්ත කුමර පටුමග, කොත්දෙනිය පටුමග, කුරුවිටරාළ පටුමග, පුඤ්ඤානන්ද නාහිමි පටුමග, විමලධර්මසූරිය පටුමග,මිහිඳුලකර පටුමග, යන යන නම් වලින් එම පටුමගවල් නම් කිරීමට අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා. පනතේ බලතල ප්‍රකාරව නීත්‍යානුකූල ක්‍රමවේදය අනුව කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

විහාරාධිපති,ශාස්ත්‍රපති පූජ්‍ය කුරුවිට අනුරුද්ධ ස්ථවිර ස්වාමීන්වහන්සේගේ 2025.03.20 දිනැති ඉල්ලීම අනුව ශ්‍රී දළදා මාවත හා ශ්‍රී සද්ධාතිස්ස මාවත තුළ ඇති නම් කිරීමකින් තොරව පවතින පටුමහවල් වන ,දැනට භාවිතයේ ඇති නමින්වන හේමමාලි පටුමග, විපුලතිස්ස නාහිමි පටුමග, හිරිපිටිය පටුමග, මායාදුන්න පටුමග, රාජසිංහ පටුමග, සීතාවක පටුමග, නිශ්ශංකමල්ල පටුමග, කීරවැල්ල පටුමග, දන්ත කුමර පටුමග,කොත්දෙනිය පටුමග, කුරුවිටරාළ පටුමග, පුඤ්ඤානන්ද නාහිමි පටුමග, විමලධර්මසූරිය පටුමග, මිහිඳුලකර පටුමග, එම නමින් නම්කිරීම සඳහා පනතේ බලතල ප්‍රකාරව නීත්‍යානුකූල ක්‍රමවේදය අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

06-98. 2025.07.16 දිනැති මෙම සභාවේ මුදල් කමිටුවේ නිර්දේශ අංක 05 අනුව නාමල්දෙනිය සංචාරක ගිමන්හල ගිවිසුම් කාලය 2025.07.24 දිනෙන් අවසන් වූ බැවින් බදුකරු සමඟ ඉදිරියට මාස 01 ක කාලයක් සඳහා ගිවිසුම්ගත වීමටත් ඉන්පසු ඉදිරි වසරවල් සඳහා ටෙන්ඩර්කිරිම සඳහා මහා සභාතීරනයක් ගැනීමට යෝජනා කරමි.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

2025.07.16 දිනැති මෙම සභාවේ මුදල් කමිටුවේ නිර්දේශ අංක 05 අනුව නාමල්දෙනිය සංචාරක ගිමන්හල ගිවිසුම් කාලය 2025.07.24 දිනෙන් අවසන් වූ බැවින් බදුකරු සමඟ ඉදිරියට මාස 01 ක කාලයක් සඳහා ගිවිසුම්ගත වීමටත් ඉන්පසු ඉදිරි වසරවල් සඳහා ටෙන්ඩර් කිරීම සඳහා මහා සභා තීරනයක් ගැනීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා -
ගියවර කමිටුවේ මේගැන කතා කලා . නමුත් මෙවැනි තීන්දුවක් ගත්තේ නෑ. පසුව සාකච්ඡා කර තීරණයක් ගමු කීවා.වසර 5 කට බදු දුන්න ගිමන්හල කොරෝනා නිසා වසර 2 ක් පමනයි කටයුතු සිදු උනේ. මෙහි යතුර ගත්තෙත් 2023 වර්ෂයේදී.මුදල් කමිටුවේ කතා කලාට මෙවැනි තීරනයකට එළඹුනේ නෑ.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -
එදාත් කීවා. මේ ගිමන්හල ගිමන්හලක් ලෙස තියමු.මෙම ස්ථානය ආදායම් ප්‍රවේශ මාර්ගයක් කරගෙන මේ වන විට ඉතාමත් ගෝෂාකාරී තැනක් වෙලා.ප්‍රදේශවාසින්ට හානිදායක වෙලා.ගිමන්හල ටෙන්ඩර් කරනවාට මම එකඟ නැතත් විරුද්ධ උනාට වැඩක් නෑ. ගමට කරදරයක් නොවී කොන්දේසි දාලා මේක පවත්වාගෙන යන ලෙස දැනුම් දෙන්න.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මහින්ද ජයලාල් පතිරණ මහතා -

උප සභාපතිතුමා මීට පෙරත් මෙය අවධාරණය කලා.එම ස්ථානයේ තත්වය.සභාව සතු දේපල පිලිබඳව නීතියට අනුව කටයුතු නොකර අයථා භාවිත වෙනවා නම් අධිභාර වෙනවා. දේවින්ද මන්ත්‍රි තුමාත් ගියවර රැස්වීමේදි කිව්වා ඒක අත් විඳලා ගෙව්ව හැටි.නීතිය,චක්‍රෙල්ඛ අනුව වසර 03 කට වඩා බදු දෙනවා නම් ගරු අමාත්‍යවරයාගේ ලිඛිත අවසරය ගත යුතුයි.ඒක කඩ කලොත් අධිභාර වෙනවා.මුදල් කමිටුවේදි කිව්වා මේක ඔඩිට් වාර්තාවේත් තියෙනවා කියලා. අධිභාර නොවෙන්න කටයුතු කරන්න.සියළු මන්ත්‍රිවරු වෙනුවෙන් කියන්නේ.වෙන කව්රුවත් ගන්නෙත් නැනේ.නීත්‍යානුකූලව ගැටළුවක් නොවෙන්න කරන්න.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා -

උප සභාපතිතුමා කියන්නේ වෙන එකක්. ටෙන්ඩර් කරන එක තවත් එකක්. මේකට සාධාරණය කරන්න.අවුරුදු දෙකයි ව්‍යාපාරය කලේ.මුදල් ගෙවලා.ගිය සභා තීන්දුවක් තියෙනවා.වසර 5 කට දෙන්න කියලා.හැම දේටම අධිභාර වෙන කතා කියන්න එපා. මේක ගන්න කෙනෙක් හිටියෙත් නෑ.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

2025.07.24 දිනෙන් ගිමන්හලේ බදු ගිවිසුම් කාලය අවසන් වෙනවා. නියමිත ටෙන්ඩර් ක්‍රමවේදයට එළඹී තීරනයක් ගැනීම සිදුවන තෙක් කාලයක් අවශ්‍යයි. මාස 2 ක් පමන යයි. ඊට පස්සෙයි මේ තීන්දුව ගන්නේ.ගරු ආණ්ඩුකාරලේකම් ගේ අංක G 6/E 5/6/6/LG/RCM( වෙළුම 16) හා 2025.06.16 දිනැති ලිපියෙන් ඉදිරි වසර 03 ක කාලය සඳහා රජයේ තක්සේරු මුදල පදනම් කරගෙන විවෘත ලන්සු කැදවීමකට අනුමැතිය ලැබිලා තියෙනවා. පළාත් පාලන

කොමසාරිස්ගේ අධීක්ෂණ වාර්තාව අනුව මේ ගිමන්හල පළාත් මාර්ග යෞවන කටයුතු හා සංචාරක අමාත්‍යාංශයට අයත්ව තිබුකාලය තුල ගිමන්හලේ ටෙන්ඩරය ලබාගත් අය කොවිඩ් වසංගතය හේතුවෙන් ගිවිසුම අවලංගු කරගෙන ඇති අතර 2021.01.12 දින සංචාරක අමාත්‍යාංශයෙන් ගිමන්හල කුරුවිට ප්‍රාදේශිය සභාවට භාරදුන් පසුව ඉහත ටෙන්ඩරයේ දෙවැනි ටෙන්ඩර් කරුත් ගිමන්හල භාර නොගන්නා බව ලිඛිතව දැනුම් දීලා.පසුව තෙවන ලංසු කරු වන එච්.එම්.ලක්සිරි කුමාර යන අයට මසකට රු.25200.00 කට වසර දෙකකට ගිවිසුම් ගත වෙලා එච්.එම්.ලක්සිරි කුමාර යන අයට දීලා. දැන් මේ වන විට ටෙන්ඩර් කිරිමට ආණ්ඩුකාර අනුමැතිය ලැබිලා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා -</u>

2023 වර්ෂයේ යතුර ගත්තේ. සභා තීරණයක් අරන් 5% බැගින් වැඩිකරමින් බදු දුන්නේ.අවුරුදු දෙකයි කාලය තවම .අසාධාරනයක් වෙනවා.වැඩිපුර මුදලුත් ගෙවලා. සභා තීන්දු වලංගු නැද්ද?

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

අධීක්ෂණ වාර්තා මගින් පෙන්වා දී තියෙන්නේ. අවුරුද්දක් සඳහා සාමාන්‍ය ටෙන්ඩර් සිදු කිරිම කල හැකි උනත් එතනින් එහාට ආණ්ඩුකාර අනුමැතිය අවශ්‍යයි. ඉදිරි තීන්දුව ගන්නකල් මේ මාස 2 කාලය ඉල්ලුවේ. මෙම ගිමන්හලේ බදු මුදල හා අධිගාස්තු අට ලක්ෂ ගානක් ආණ්ඩුකාර අනුමැතිය අරන් කපා හැරලත් තියෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂණ නාපාවල මහතා -</u>

රටකට පොදු නීතිය අනුව කටයුතු කල යුතුයි. රජයේ නීතිය අනුව කටයුතු කරමු.මගේ ඉල්ලීම මේ සම්බන්ධව රටේ පොදු නීතිය අනුව කටයුතු කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා -</u>

රටේ නීතිය හෝ පළාත් පාලනයේ නීතිය අනුව හෝ අවුරුදු 3 කට බදු දීලා වසර 2 ක් කලාම එ්ක නිවැරදිද? සභාවක තීන්දුවක් අරන් ඊලඟ සභාවේ ඒ තීරණය අවලංගුද?නීතිය වැඩක් නැනේ?.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

එවැනි තත්වයක් නෑ.වසර 03 කට යන්න සභා තීන්දුව තියේද?අධි ගාස්තුව කපා හැරීමට පළාත් පාලන කොමාසාරිස් මගින් ඉල්ලීම් කලත් 5% වැඩිකරමින් කාලය දීර්ඝ කිරිමට ඉල්ලීම් කර නැත.2025.04.25 දින සිට 2025.07.24 දින දක්වා මාස තුනකට ගිවිසුම්ගතවී ඇති අතර වසර තුනක් සඳහා ලංසු කැඳවා ටෙන්ඩර් කරන්න ආණ්ඩුකාරතුමා අනුමැතිය දීලා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

මේ සම්බන්ධයෙන් අවුරුදු තුනකට එහා දෙනවා නම් ටෙන්ඩර් කරන්න කියලා නම්, සභා තීන්දුවක් ගන්නත් අපහසු නම් මත දෙකට බෙදීමකට යමු. කාලය ගත වෙනවා එකම කරුණකට.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

වසර තුනකට එහා නිසා අපි ටෙන්ඩර් ක්‍රමවේදයට යන්න තීන්දු කරමු.මෙම බදු කරු සමග මාස දෙකක කාලයකට ගිවිසුම්ගත විමට කටයුතු කරමු. මෙම බදුකරුටම ගිවිසුම් කාලය තවත් වසරකින් දිර්ස කොට ලබා දීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව හා 2025.07.16 දිනැති මෙම සභාවේ මුදල් කමිටුවේ නිර්දේශ අංක 05 අනුව නාමල්දෙනිය සංචාරක ගිමන්හලේ ගිවිසුම් කාලය 2025.07.24 දිනෙන් අවසන් වූ බැවින් එම ගිවිසුම්කාලය මුදල් කමිටුව මගින් මාස 1 ක් දක්වා දිර්ස කිරිමට ගත් තීරණය , බදුකරු සමග ඉදිරියට මාස 02 ක කාලයක් සඳහා දීර්ස කොට ගිවිසුම්ගත වීමටත්, මෙම බදුකරුටම ගිවිසුම් කාලය තවත් වසරකින් දීර්ස කොට ලබා දීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමටත් මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

06-99. කුරුවිට ප්‍රාදේශීය සභාව සතු LF-4879 අංක දරණ බොලෙරෝ කැබ් රථය ගිනි ගැනීම සම්බන්ධයෙන් සිදුකල මු.රෙ.104(4) පරීක්ෂණයේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මහා සභා තීරනයක් ගැනීමට යෝජනා කරමි.

උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

කැබ් රථය ගිනි ගැනීම සම්බන්ධයෙන් මු.රෙ.104(4) පරීක්ෂණයේ වාර්තාව සබරගමු පළාත් සභාව වෙත යොමු කරලා. එම වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරිමට ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් තුමා අනුමැතිය දිලා. එම නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙස පළාත් පාලන කොමසාරිස්වරයා සභාව වෙත දැනුම් දීලා. එම නිර්දේශ වන්නේ, රට තුළ යම් කලබලකාරී ස්වභාවයක් හෝ සිවිල් කැළඹිලිකාරි තත්වයක් වාර්තා වන අවස්ථාවලදී මුරකරුගේ සභායට වෙනත් සේවක මහතෙකු හෝ කිහිපදෙනෙකු යොදවා අදාල උපදෙස් ලබාදීම, කලබල තත්වයක් අවස්ථාවකදී ප්‍රදේශයේ පොලිස් ස්ථානය වෙතින් අදාළ ආරක්ෂාව ඉල්ලා සිටිම, සභා භූමියට පිවිසිමට ඇති අනෙකුත් මාර්ග ආවරණය කිරිමට නිසි වැඩපිළිවෙලක් යෙදීම,ගිණි නිවීමේ උපකරණ නිසිලෙස ස්ථානගත කිරීම හා රාජකාරී කටයුතු වල යෙදෙන මුරකරුවන් හා සේවකයින් සඳහා ඊට අදාල පුහුණුව ලබාදීම, කුරුවිට ප්‍රාදේශීය සභා භූමිය ආවරණය වන පරිදි ආරක්ෂිත කැමරා පද්ධතියක් ස්ථාපිත කිරිමට කටයුතු කිරීම යන නිර්දේශ ඇතුලත්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජන් ප්‍රදීප් මහතා -

පුළුවන් නිර්දේශ ක්‍රියාත්මක කරමු.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

ක්‍රියාත්මක කිරීමේදි ගැටළු එයි. නිර්දේශ ක්‍රියාත්මක කිරිමට මැදිහත්වෙමු. අනුමැතිය ලබා දෙමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

කුරුවිට ප්‍රාදේශීය සභාව සතු LF-4879 අංක දරණ බොලෙරෝ කැබ් රථය ගිනි ගැනීම සම්බන්ධයෙන් සිදුකල මු.රෙ.104(4) පරීක්ෂණයේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

06-100. 2025.07.24 දින පැවති මුදල් කමිටුවේ තීරණ අංක 07 යටතේ සඳහන් බිල්පත් පිළිබඳ පරික්ෂා කිරිමට පත් කල කමිටුවේ නිර්දේශ අනුව විසල් රත්නපුර ජල ව්‍යාපෘතිය යටතේ නල එලීම සඳහා පළුදු කරන ලද ව්‍යාපෘති 03 හි බිල්පත් සඳහා ගෙවීම් සිදු කිරිම සම්බන්ධයෙන් සභාතීරණයක් ගැනීමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

මුදල් කමිටුවේ අංක 07 යටතේ දක්වා ඇති විසල් රත්නපුර ජල ව්‍යාපෘතිය යටතේ නල එලීම සඳහා පළුදු කරන ලද ව්‍යාපෘති 03 වන පුස්සැල්ල කොක්ඕවිට මාර්ගයේ 2 අධියර අළුත්වැඩියා කිරීම, පුස්සැල්ල ගොන්කුරේවත්ත මාර්ගය මතුපිට අළුත්වැඩියා කිරීම,පරකඩුව නිල්මිණි උයන මාර්ගය කොන්ක්‍රිට් කිරිම. යන කර්මාන්ත.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

එම කර්මාන්ත කලේ මොන වර්ෂයේද?මේ සම්බන්ධයෙන් යම් ගැටළුවක් තිබුණා ගෙවීම් සම්බන්ධව. මාර්ග සංවර්ධන අධිකාරියේ පරික්ෂනයක් හා පළාත් සභාවේ යම් කටයුතු වගයක් සිදු උනා. මේ යෝජනාව සම්බන්ධයෙන් ගැටළු සහගත තත්වයක් තියෙන නිසා මාව නිදහස් කරන්න. බෙදීමක් ඉල්ලනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -
ඔබතුමා විතරක් නෙමෙයි සියළු දෙනා නිදහස් විය යුතුයි.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -
2023 වර්ෂයේ කරපු ව්‍යාපෘති. එම ව්‍යාපෘති වලයම් ගැටළුවක් නිසා බිල්පත් පරීක්ෂාවට පළාත් පාලන කොමසාරිස් මගින් කමිටුවක් පත් කරලා ඒ කමිටුවේ නිර්දේශ අනුව ගෙවීම් කිරිමට මහා සභා තීරණයක් ගන්නා ලෙස ත් 2025.04.21 ලිපියෙන් දැනුම් දීලා. කොමසාරිස් මගින් පත්කල කමිටුවට පළාත් පාලන සහකාර කොමසාරිස් ජේ.සිරිපාල හරිස්චන්ද්‍ර මහතා,ප්‍රජාසංවර්ධන නිලධාරි එම්.එන්.සී.සෝමරත්න මහතා,කාර්මික නිලධාරී එච්.එල්.නිමල් මහතා අයත්. එසේම වන පුස්සැල්ල කොක්ඕවිට මාර්ගයේ 2 අධියර අළුත්වැඩියා කිරීම කොන්ත්‍රාත් මුදල රු.1012156.10 ක් වන අතර නිර්දේශය අනුව ගෙවිම් කල හැකි මුදල රු.581599.28 ක් වේ. පුස්සැල්ල ගොන්කුරේවත්ත මාර්ගය මතුපිට අළුත්වැඩියා කිරීම කොන්ත්‍රාත් මුදල රු.1356095.20 ක් වන අතර නිර්දේශ අනුව ගෙවීම් කල හැකි මුදල රු.1135290.79 ක් වේ. පරකඩුව නිල්මිණි උයන මාර්ගය
කොන්ක්‍රිට් කිරිම සඳහා කොන්ත්‍රාත් මුදල රු.804224.10 වන අතර නිර්දේශ අනුව ගෙවීම් කල හැකි මුදල රු.518244.63 ක් වේ.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

මේ කමිටු පත්කරලා ගත්ත නිර්දේශ අනුව ගෙවිම් කරන්න වෙලා තියෙන්නේ මහා සභාව පත් උනාට පස්සේ. අදාල කමිටුව නිර්දේශ ලබාදීලා තියෙනවා.වගකීම සභා තීරණය ගැනීම. මුදල් කමිටුවත් අදාල නිර්දේශය දීලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

මහා සභාවට එන හැමදේම අනුමත කල නොහැකියි. අපි එකඟ නැති උනාට කල හැකියි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

විනිවිද නෑ. මේ මුල් මුදලින් විශාල මුදලක් අඩු කරලා. මගේ කොට්ඨාශෙ විසල් ජලය ගන්න පළුදු කරපු පාරවල් තාම හදලා නෑ. පාරවල් කැඩිලා. වතාවක් මම මේ සභාවේ තීන්දුවක් අරගෙන ගෙව්වා. ලේකම්තුමිය , හිටිය සභාපතිතුමා ගෙවලා නෑ. අපි මුදල් ගෙව්වා. මම මේකට විරුද්ධයි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා -

පුන්සිරිගම,දොරලබඩවත්ත,පුංචිතැපැල්ගම විසල් ජලය දීමට පළුදු කල මාර්ගකීපයක්ම හදලා නෑ. ඒ පාරවලුත් හදන්න.ජ්‍යේෂ්ඨ මන්ත්‍රීවරු මෙහෙම කියනකොට අපිටත් බයයි.
ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -
මේ හදපු ඒවාට බිල්පත් සඳහා මුදල් ගෙවීම පිළිබඳව මුදල් කමිටුවේ කතා කලා. අදාල නිර්දේශ අනුවයි ගෙවීම් කරන්නේ. ඒ සඳහායි සභාවට ඉදිරිපත් කලේ.

( මෙම අවස්ථාව වන විට වේලාව ප.ව.6.07 වූ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී නයනා ජීවනී අතුකෝරළ මිය හදිසි අවශ්‍යතාවක් හේතුවෙන් සභා ගර්භයෙන් නික්මයන බවට ගරු සභාවට දැනුම්දී අවසරගෙන ඉවත් විය.)

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -
විසල් ජල යෝජනා ක්‍රමය යටතේ සිදුකල ව්‍යාපෘති. යෝජනා ක්‍රමය අනුව නල එලිමට මාර්ග පළුදු කරන්නඋනා. ගිවිසුම් අත්සන් කරලා ඇස්තමේන්තු අනුමත කරලා සභාව විසිරවීමට දින 03 කට කලින්. වැඩ ආරම්භ කරලා කටයුතු කලත් මුදල් ලබාගන්න දිර්ඝ කාලයක් ගියා.උතුරු එක්නැලිගොඩ ගොවිසංවිධානෙන් සභාපතිගේ දිර්ඝ ලිපියක් තියෙනවා.එහි කියනවා එක් නිලධාරියෙක් රු.40000.00ක් දෙනවානම් මේ වැඩය කරන්න පුළුවන් කීවාලු. මේ සම්බන්ධයෙන් පළාත් සභා සාකච්ජා තිබ්බා. විමර්ශනය කලා.තීන්දු අරන් තියෙනවා මේ පාරවල් ගැන. මුදල් ගෙවීම සම්බන්ධව නිර්දේශ දීලා තියෙනවා. මහා සභාවේ තීරනය ගන්න ඕනි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -
මම බෙදීමක් ඉල්ලනවා.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

නිර්දේශ ක්‍රියාත්මක කිරිමක් උවත් විරෝධතා පවතින නිසා එසේනම් බෙදීමකට යමු.මෙම ගෙවීම් කිරිමට විරුද්ධව, විපක්ෂව ජන්දය අත ඔසවා ප්‍රකාශ කරන්න. ගෙවිමට විරුද්ධ එක් එක් මන්ත්‍රීවරයාගේ නම සටහන් කරන්න.අත එසවීමෙන් වැලකීම ගෙවීම් කිරිමට පක්ෂ වීම ලෙස සලකනවා.

ඒ අනුව මෙම අවස්ථාවේදි ඉහත විසල් ජලය ලබාගැනීමට මාර්ග පළුදු කිරිම යටතේ වන පුස්සැල්ල කොක්ඕවිට මාර්ගයේ 2 අඩියර අළුත්වැඩියා කිරීම,පුස්සැල්ල ගොන්කුරේවත්ත මාර්ගය මතුපිට අළුත්වැඩියා කිරීම,පරකඩුව නිල්මිණි උයන මාර්ගය කොන්ක්‍රිට් කිරිම, යන ව්‍යාපෘති වල බිල්පත් සඳහා ගෙවීම් සිදු කිරිම ට විපක්ෂව අත ඔසවා ජන්දය ලබාදෙන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම්දුන් අතර ගරු මන්ත්‍රී තුමන්ලා සහ තුමියන්ලා අතරින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

කේ.එම්.ජයසේකර මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී තනූජා දීපානි චන්ද්‍රිකා මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී ආශා සමන්කුමාරි මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී ඉරෝෂා උදයංගනි විජේසිංහ මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් එදිරිසිංහ මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රොෂාන් මධුශංක දේශප්‍රිය මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී කේ.කේ.දයාවතී මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා වශයෙන් අත ඔසවා යෝජනාවට විපක්ෂව ඡන්දය දුන්නේය.එම සංඛ්‍යාව 17 කි.

අදාල යෝජනාවට පක්ෂව (අත එසවීමෙන් වැලකී සිටි )ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා ,ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පීකේ.ජයනෙත්ති මහතා,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.සිසිර සේනාරත්න මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණී ඉනෝකා මල්ලවආරච්චි මිය,ගරු ප්රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.මහින්ද ජයලාල් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.සිරිල් කරුණාරත්න මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂණ නාපාවල මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් නන්දසිරි මනම්පේරි මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ජස්ටින් රණවීර මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල අබේසිරි මුණසිංහ මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී ටී.එම්.උමේෂා මල්කාන්ති මිය,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී චූලා ශාන්ති මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.මහින්ද ගුණසිංහ මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින්ද අධිකාරම් මහතා,

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී සශිකලා මධුභාෂණී මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්.ගයාන් වික්‍රමසූරිය මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.හරිසිංහ මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී ආර්.එල්.නිරෝෂා ලියනගේ මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා වූහ.එම සංඛ්‍යාව 26 කි.

මෙදින මහා සභාව සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඩී.මහින්ද මහතා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී සුධීරා සේමිණී මිය අසනීප හේතුවෙන් සභාවේ නිවාඩු අවසරය ලබාතිබු අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලීලානන්ද කළුකොටගේ මහතා මෙදින මහා සභාවට සහභාගී නොවීය. ඒ අනුව මෙදින මහා සභා සහභාගිත්වය 43 ක් විය. එසේම ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී නයනා ජීවනි මිය මේ අවස්ථාව වන විට සභාවේ අවසරය ගෙන නික්ම ගොස් සිටි අතර එ් අනුව මෙම අවස්ථාවේ සහභාගිත්වය 42කි.ඉන් 17 ක් යෝජනාවට අනුව ගෙවීම් සිදු කිරිමට විපක්ෂ වූ අතර ඉතිරි 25 යෝජනාවට පක්ෂව ගෙවීම් කිරිමට පක්ෂ විය.

ඒ අනුව ඉහත විසල් ජලය ලබාගැනීමට මාර්ග පළුදු කිරිම යටතේ වන පුස්සැල්ල කොක්ඕවිට මාර්ගයේ 2 අඩියර අළුත්වැඩියා කිරීම,පුස්සැල්ල ගොන්කුරේවත්ත මාර්ගය මතුපිට අළුත්වැඩියා කිරීම,පරකඩුව නිල්මිණි උයන මාර්ගය කොන්ක්‍රීට් කිරිම, යන ව්‍යාපෘති වල බිල්පත් සඳහා ගෙවීම් සිදු කිරිම සම්බන්ධයෙන් බහුතර මතයෙන් මහා සභාවේ අනුමත විය.

<u>ගරු සභාපති විතසික පුෂ්පසූරිය මහතා-</u>

විසල් ජලය ලබාගැනීමට මාර්ග පළුදු කිරිම යටතේ වන පුස්සැල්ල කොක්ඕවිට මාර්ගයේ 2 අඩියර අළුත්වැඩියා කිරීම,පුස්සැල්ල ගොන්කුරේවත්ත මාර්ගය මතුපිට අළුත්වැඩියා කිරීම,පරකඩුව නිල්මිණි උයන මාර්ගය කොන්ක්‍රීට් කිරිම, යන ව්‍යාපෘති වල බිල්පත් සඳහා

ගෙවීම් සිදු කිරිම සම්බන්ධයෙන් විපක්ෂව 17 ක් වන අතර පක්ෂව 25 ක් වන බැවින් බහුතර ඡන්ද 08 කින් ගෙවීම් සිදු කිරිමට මහා සභා සම්මත විය.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය බහුතර මතයෙන් මහ සභා සම්මත විය.

2025.07.24 දින පැවති මුදල් කමිටුවේ තීරණ අංක 07 යටතේ සඳහන් බිල්පත් පිළිබඳ පරීක්ෂා කිරිමට පත්කල කමිටුවේ නිර්දේශ අනුව විසල් රත්නපුර ජල ව්‍යාපෘතිය යටතේ නල එලිම සඳහා පළුදු කරන ලද ව්‍යාපෘති 3 වන පුස්සැල්ල කොක්ඔිවිට මාර්ගයේ 2 අධියර අළුත්වැඩියා කිරීම,පුස්සැල්ල ගොන්කුරේවත්ත මාර්ගය මතුපිට අළුත්වැඩියා කිරීම,පරකඩුව නිල්මිණි උයන මාර්ගය කොන්ක්‍රිට් කිරිම, යන ව්‍යාපෘති වල බිල්පත් ගෙවීම සම්බන්ධයෙන් සිදුකල මත විමසුමේදී විපක්ෂව අත ඔසවා ඡන්ද 17 ක් ප්‍රකාශ වූ අතර පක්ෂව 25 ක් වන බැවින් ගෙවීම් කිරිමට පක්ෂව වැඩි ඡන්ද 08 කින් ,බහුතර මතයෙන් ගෙවීම් සිදු කිරීමට මහා සභා තීරණය විය.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

06-101. කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම්ගේ KIDS/ADM/HR/10/PE/COMP/06 හා 2025.06.16 දිනැති ඉල්ලීම අනුව කුරුවිට ප්‍රාදේශීය සභාව සතු ඉඩමේ පවත්වාගෙන යනු ලබන එල්ලාවල ප්‍රාථමික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානය සංවර්ධනය සඳහා වෙන්වූ මුදල්ප්‍රතිපාදන නිදහස් කරගැනීම ට ඉඩමේ හිමිකාරීත්වය සම්බන්ධව ගැටළුවක් පවතින බැවින් මහාසභාතීරණයක් ගැනීමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි. මේ ඉඩම දයා රණසිංහ මැතිතුමා සභාවට පරිත්‍යාග කල ඉඩමක්. අදාළ ඔප්පුව තියෙනවා. සභාවේ එකගතාව මත අපි මේ එල්ලාවල බහුකාර්ය ගොඩනැගිල්ලේ බිම් මහලේ ප්‍රාථමික වෛද්‍ය සෞඛ්‍ය ඒකකය ආරම්භ කිරිමට අනුමැතිය ඉල්ලුවා. ඒක හදන්න ඉදිකිරිම් එකඟතාව දීලා. නමුත් දැන් ප්‍රාදේශීය ලේකම්තුමිය ඉල්ලලා මේ සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානය පවත්වාගෙන යන ඉඩම සභාව සතු නිසා ප්‍රාථමික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානය සංවර්ධනය සඳහා වෙන්වූ මුදල් ප්‍රතිපාදන නිදහස් කර ගැනීම බාධාවක් කියලා. ඉඩමේ හිමිකාරිත්වය සභාව සතු නිසා,මේ ඉඩමේ අයිතිය සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට ගැනීම පිලිබඳව ප්‍රාදේශීය ලේකම් ට අනුමැතියක් දෙන්න එපා. මෙය සභාව සතු ඉඩම. මේ සෞඛ්‍ය මධ්‍යස්ථානය වැඩිදියුණු කිරිමට සබරගමු පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යංශයට මීට පෙරද සභාව මගින් නිර්දේශ දි ඇති නිසා ඒ අනුව ඉදිරි කටයුතු කරමු. මෙම ස්ථානයේ ග්‍රාමසේවක විසින් තම කාර්යාලය පවත්වාගෙන යාමද සිදු කරන නිසා එය එම ස්ථායෙන් වෙනත් ස්ථානයකට ගෙන යාමට කටයුතු සලසන ලෙස කිරිඇල්ල ප්‍රාදේශිය ලේකම් ගෙන් ඉල්ලා සිටින්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

අපේ ඉඩමක් කුරුවිට ප්‍රාදේශීය ලේකම්ට දීලත් ගැටළුවක් උනා.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

ඉඩමේ අයිතිය සම්බන්ධව වෙනත් පාර්ශව වෙත එකඟත්වය ලබාදීමට සභා තීරනය නොකරන බව පෙන්වා දෙමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජන් ප්‍රදීප් මහතා -

හේතුව සඳහන් කරලා දැනුම් දෙන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම්ගේ KIDS/ADM/HR/10/PE/COMP/06 හා 2025.06.16 දිනැති ඉල්ලීම අනුව කුරුවිට ප්‍රාදේශීය සභාව සතු ඉඩමේ පවත්වාගෙන යනු ලබන එල්ලාවල ප්‍රාථමික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානය සංවර්ධනය සඳහා වෙන්වූ මුදල් ප්‍රතිපාදන නිදහස් කරගැනීම ට ඉඩමේ හිමිකාරීත්වය කුරුවිට ප්‍රාදේශීය සභාව සතුව පැවතීම ගැටළුවක් බව දන්වා ඇති අතර සභාව සතු ඉඩම හෝ ගොඩනැගිල්ල සෞඛ්‍ය අමාත්‍යාංශයට පැවරීම සම්බන්ධයෙන් කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් වෙත එකඟතාවක් ලබා නොදීමට ඒකමතිකව මහා සභා තීරණය විය.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -
06-102. කුරුවිට ප්‍රාදේශීය සභාවේ කිරිඇල්ල පෙර පාසැල සඳහා නව පෙරපාසැල් පාලිකා තනතුරු 02 ක් අනුමතකරගැනීම සඳහා සභාතීරණයක් ගැනීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

සබරගමු පළාත් පූර්ව ළමාවිය සංවර්ධන අධිකාරිය අනුමත කරන්නේ ළමුන් 20ක් සඳහා එක් ගුරුවරයෙකු වශයෙන්. නමුත් අපේ පෙර පාසැලේ 60ක් ඉන්නවා ළමයි. නමුත් එක් පෙර පාසැල් පාලිකාවක් තමයි අනුමත වී ඇත්තේ. තව දෙදෙනෙකු අවශ්‍යයි. එසේ හෙයින් නව තනතුරු 02 ක් අනුමත කරගත යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා -
සහාය පාලිකාවන් 4 ක් ඉන්නවා.පෙරපාසැල් පාලිකාවගේ දුවත් ඉන්නවා. තව සහායට පාලිකාවන් 3 ක් ඉන්නවා. ගිය වරත් ස්ථිර කරගන්න ඉල්ලුවා. ඒ අයත් පාඨමාලා හදාරලා. ඒ අයවත් බඳවා ගන්න. පරිනත අය ඉන්නේ.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -
බඳවා ගැනීමේ සීමාවක් තියෙනවා. අපි නව තනතුරු 02 ක් අනුමත කරගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

කුරුවිට ප්‍රාදේශීය සභාවේ කිරිඇල්ල පෙර පාසැල සඳහා නව පෙරපාසැල් පාලිකා තනතුරු 02 ක් අනුමත කරගැනීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**06-103. කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් ,කොටස් වී ඇති අක්කර බදු ඉඩම් ( හෙක්ටයාර් 1 ට අඩු ) හා කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් නොවන අක්කර බදු ඉඩම් ලේඛණයෙන් ඉවත් කිරීමට හා හිඟ කපා හැරීම සම්බන්ධයෙන් සභාතීරණයක් ගැනීමට යෝජනා කරමි.**

**<u>උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

සමහර ඉඩම් හෙක්ටයාර් 1 ට අඩුයි. ඒවාට බදු අයකිරීමට බෑ. එසේම සභා බල ප්‍රදේශයෙන්න් පිට ඉඩම් හඳුනාගෙන තියෙනවා. ඒවා බදු ඉඩම් ලේඛනයෙන් ඉවත්කිරීමට හා හිඟ කපා හැරීමට අනුමැතිය ඉල්ලනවා. 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ වගන්ති අංක 134(3)යටතේ **හෙක්ටයාර් 1 ට අඩු ඉඩම් සඳහා අක්කර බදු අයකිරිමට නොහැකි බැවින් එකී පනතේ 182 වගන්තිය යටතේ කපාහැරිමට ඉල්ලන්නේ.** මෙම කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කරමු. අදාල ඉඩම් විස්තර හා මුදල් විස්තර පහත පරිදි වේ.

.

| අක්කර බදු ඉඩම්- කොටස් කර ඇති (සත්තේක්ෂනය යටතේ හඳුනාගත්) | | | | | | |
|---|---|---|---|---|---|---|
| අනු අංක | අක්කර බදු අංකය | නම | ඉඩමේ නම | ලිපිනය | 2025.01.01 ශේෂය (රු.) | ගාස්තු (රු.) |
| 1 | 22 | R.M අයිරාංගනී චන්ද්‍රසිංහ | ඌරුවලවත්ත | කෙලින් වීදිය, කුරුවිට | 1,726.66 | 17.97 |
| 2 | 23 | S.V චන්ද්‍රසිංහ | විල්මෝර් වත්ත | තැඹිලියන, කුරුවිට | 881.12 | 18.88 |
| 3 | 70 | T.P ඉන්ද්‍රා මාලනී | ගවුඩර්වත්ත | මලව,කුරුවිට | 0.00 | 12.5 |
| 4 | 86 | K.M ධර්මසේන | කිහියමණ්ඩිය මූකලාන | බ/කාහේන්ගම,හිදැල්ලන | 0.00 | 12.50 |
| 5 | 96 | W.H. ජයකොඩි | | හිග්ගස්හේන,කුරුවිට | 2,007.65 | 19.38 |
| 6 | 109 | K බබාහාමි | පරණවලව්වත්ත | එක්නැලිගොඩ,කුරුවිට | 1,168.00 | 12.50 |
| 7 | 69 | M.A ගුණරත්න | බටයාය වත්ත | හල්පේ , දොඩම්පේ | 0.00 | 12.50 |
| | | | | **එකතුව** | **5,783.42** | **106.23** |

| අක්කර බදු ඉඩම්- ප්‍රාදේශිය සභාවට අයත් නොවන (සත්තේක්ෂනය යටතේ හඳුනාගත්) | | | | | | |
|---|---|---|---|---|---|---|
| අනු අංක | අක්කර බදු අංකය | නම | ඉඩමේ නම | ලිපිනය | 2025.01.01 ශේෂය | ගාස්තු |
| 1 | 13 | කපිල නාමමුත්ත | වදුලන්ද වත්ත | ලංකා සේවා ස්ථානය,රත්නපුර | 611.12 | 35.52 |
| 2 | 75 | H.A.T චන්ද්‍රදාස | පිල්ලගාවවත්ත | කරපිංච කඩේ ,හිදැල්ලන | 1,893.95 | 12.50 |
| 3 | 141 | H.D.C.M.V කරුනාතිලක පෙරේරා | ඇල්බට්වත්ත | | 1,266.75 | 12.50 |
| 4 | 142 | H.D.C.M.V කරුනාතිලක පෙරේරා | ඇල්බට්වත්ත | | 1,266.80 | 12.50 |
| 5 | 152 | H.D.C.M.V කරුනාතිලක පෙරේරා | ඇල්බට්වත්ත | විලකොලදෙනියවත්ත,මලංගම | 429.30 | 12.50 |
| | | | | **එකතුව** | **5,467.92** | **85.52** |

| | |
|---|---|
| **කපාහැරීමට යොජිත මුළු හිඟය (රු.)-** | **11,251.35** |

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

**කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් ,කොටස් වී ඇති අක්කර බදු ඉඩම් ( හෙක්ටයාර් 1 ට අඩු ) හා කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් නොවන ,ඉහත දක්වා ඇති අක්කර බදු ඉඩම් ලේඛණයෙන් ඉවත් කිරීමට හා හිඟ කපා හැරිම සඳහා** 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා **පනතේ 182 වගන්තිය යටතේ කටයුතු කිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**06-104. කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත්,විරෝධතා ඉදිරිපත්කර ඇති 86/1 බෝක්කුවේ සිට නාමල්දෙනිය ගොවිජන සේවා මධ්‍යස්ථානය දක්වා වරිපනම් සීමාවට අයත් පහසුකම් සැපයීමට අපහසු මාර්ගයන්හි පවතින වරිපනම් ඒකකයන්හි හිඟ කපාහැරීම හෝ හිඟ අයකරගැනීම සම්බන්ධයෙන් සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.**

**<u>උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**86/1 බෝක්කුවේ සිට නාමල්දෙනිය ගොවිජන සේවා මධ්‍යස්ථානය දක්වා වරිපනම් සීමාවට අයත් ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් ( මුළු හිඟයෙන් 40% පමන රු.ලක්ෂ 5500000.00 පමණ) ) යෝජිත බදු ගෙවියයුත්තන්ගේ සංවිධානය නමින් සංවිධානයක් පිහිටුවා ගැටළු කීපයක් ඉදිරිපත් කරමින් වරිබනම් බදු ගෙවීමෙන් වැලකී සිටිනවා. ඒ ගැටළු අතර අංක 1751**

දරණ 2012.03.23 දින ප්‍රකාශයට පත්කල ගැසට් පත්‍රය සංශෝධනය විය යුතු බවත් දියුණු ගම් ප්‍රදේශයක් බවට පත් කිරීමට අවශ්‍ය මහජන උපයෝගිතා සේවාවන් ප්‍රමාණවත්ව ලැබී නොමැති බව, එම ප්‍රදේශ වරිපනම් සීමාවට අයත් නොවන බව දක්වා තියෙනවා. එසේම මේ වන විට ගැසට් පත්‍රය නිවැරදි කිරීම යටතේ GIS තාක්ෂණය මගින් වරිපනම් සිතියම් ගත කිරීම කටයුතු අවසන් උනාම එය නිවැරදි කල හැකියි. මහජන උපයෝගතා සේවා ලබාදීම ක්‍රමවත් කිරීමට කාර්මික නිලධාරි මගින් පහසුකම් ප්‍රමුඛතා ගත කරලා කටයුතු කිරීමට පියවර අරන් තියෙනවා. වරිපනම් සීමාවට අයත් නොවන ඉල්ලීම් සම්බන්ධව මේ වන විට කටයුතු කර ඇත. ඒ් අනුව සහකාර පළාත් පාලන කොමසාරිස්ගේ මග පෙන්වීම හා අධීක්ෂණය යටතේ නාමල්දෙනිය උප කාර්යාලයේ හා ප්‍රධාන කාර්යාලයේ මෙම හිඟ වරිපනම් ඇති ප්‍රදේශ සඳහා අවශ්‍ය පහසුකම් සපයන තුරු මෙම හිඟ මුදල වන රු. 908904.63 ක මුදල සම්බන්ධයෙන් අයකර ගැනීම හෝ කපා හැරිය යුතු වරිපනම් විස්තරය පහත පරිදි වේ.

| කාරයාලය හා මාර්ගය | දැනට කපාහරීමට යොජිත මුළු ඒකක දේපල | 2025.06.30 ශේෂය |
|---|---|---|
| නාමල් දෙණිය | | |
| මාර්ගය රත්නපුර පාර වම | 175 | 400,455.78 |
| මාර්ගය රත්නපුර පාර දකුණ | 93 | 288,712.05 |
| **එකතුව** | **268** | **689,167.83** |
| **ප්‍රධාන කාරයාලය** | | |
| මාර්ගය (හිග්ගස්හේන කොළඹ වම) | 29 | 48,671.98 |
| මාර්ගය (හිග්ගස්හේන කොළඹ දකුණ) | 65 | 171,064.82 |
| **එකතුව** | **94** | **219,736.80** |
| **මුළු එකතුව** | **362** | **908,904.63** |

<u>උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

හිඟ කපා හැරීමට එකඟයි.ගැසට් කල දින සිට මුදල් ගෙවලා නෑ. කොමසාරිස්තුමාගෙන් මගපෙන්වීම් ගන්න. ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යවන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා -</u>

පාර මධ්‍ය ලක්ෂයේ සිට දෙපසට මිටර් 150 සීමාව ගත්තේ. කපා හැරීම් සම්බන්ධව. ඉන් එපිට ප්‍රදේශත් ඇතුලත් වෙලාද? ආණ්ඩුකාර අනුමැතියට යවන්න.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත්,විරෝධතා ඉදිරිපත්කර ඇති 86/1 බෝක්කුවේ සිට නාමල්දෙනිය ගොවිජන සේවා මධ්‍යස්ථානය දක්වා වරිපනම් සීමාවට අයත් පහසුකම් සැපයීමට අපහසු මාර්ගයන්හි පවතින වරිපනම් ඒකකයන්හි හිඟය වන රු. 908904.63 ක මුදල කපාහැරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යවමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත්,විරෝධතා ඉදිරිපත්කර ඇති 86/1 බෝක්කුවේ සිට නාමල්දෙනිය ගොවිජන සේවා මධ්‍යස්ථානය දක්වා වරිපනම් සීමාවට අයත් පහසුකම් සැපයීමට අපහසු මාර්ගයන්හි පවතින වරිපනම් ඒකකයන්හි 2025.06.30 දිනට පවතින ශේෂය වන රු. 908904.63 ක මුදල කපාහැරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කිරිමට හා එම ඒකක ලේඛනයෙන් ඉවත් කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>
06-105. කුරුවිට ප්‍රාදේශීය සභාව හා නාගරික සංවර්ධන බල ප්‍රදේශය තුළ අනවසරයෙන් ඉදිකර ඇති ගොඩනැගිලි සඳහා අයකරන අනවසර සේවා ගාස්තු ව ( දඩ මුදල්) තැන්පත්කිරිම සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාව හා නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ඒකාබද්ධ ගිණුමක් ආරම්භ කිරීමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

කුරුවිට ප්‍රාදේශීය සභාව හා නාගරික සංවර්ධන බල ප්‍රදේශය තුළ අනවසරයෙන් ඉදිකර ඇති ගොඩනැගිලි සඳහා අයකරන අනවසර සේවා ගාස්තු ව ( දඩ මුදල්) තැන්පත්කිරිම සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාව හා නාගරික සංවර්ධන අධිකාරියේ උපදෙස් මත හා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය පරිදි ගිණුමක් ලංකා බැංකුවේ ආරම්භ කලත් ඊට අදාල අපගේ ලේඛනවල ගිණුම් ගැලපීමක් සිදු නොවන බව පෙන්වා දීමෙන් පසු එම ගිණුම අවලංගු කර එහි පවතින ශේෂය කුරුවිට ප්‍රාදේශීය ය සභාවේ පොදු අරමුදල් ගිණුමට බැර කිරීමට 2014.05.22 දින පැවති මහ සභාවේ යෝජනා අංක 8-3 යටතේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව රු.2861.62 ක මුදලක් මෙම සභාවේ තැම්පත් ලේඛනයේ 2014.08.27 දිනැතිව තැම්පත් කර ඇත. නමුත් නාගරික සංවර්ධන අධිකාරියේ UDA/ සබර /291/04 හා 2015.10.29 දිනැති ලිපිය අනුව එම අධිකාරිය දන්වා ඇත්තේ නැවත බැංකු ගිණුම විවෘත කර වසා දමා තිබූ කාලය තුල කමිටුව විසින් අයකරගෙන තිබූ අනවසර සේවා ගාස්තු ( දඩ මුදල් ) එම ගිණුමේ තැම්පත් කරන ලෙස යි. ඒ අනුව නැවත 2017.01.25 දිනැති මෙහෙයුම් කමිටුවේ ගත් තීරණය අනුව හා පළාත් පාලන කොමසාරිස්ගේ දැනුම් දීම අනුව එම ගිණුම ආරම්භ කිරීමට උපදෙස් දී ඇතත් මේ වන තෙක්ද එම ගිණුම විවෘත කර නොමැත. මේ සම්බන්ධව නිතර නාගරික සංවර්ධන අධිකාරිය විසින් විමසන අතර 1987.09.330 දිනැති අංක 05/01/119 යටතේ නිකුත් කරනු ලැබූ චක්‍ර ලේඛ අංක 020/01/150 යටතේ නිකුත්කරනු ලැබූ චක්‍රෙල්ඛ අංක 14 ප්‍රකාරව නාගරික සංවර්ධන ප්‍රෙද්ශයක් බවට ප්‍රකාශයට පත් කර ඇති පලාත් පාලන ආයතනයක නාගරික සංවර්ධන ගිණුමක් පිහිටවිය යුතු වේ. එම අනවසර සේවා ගාස්තු වලින් ලැබෙන මුදල් කුරුවිට ප්‍රාදේශීය සභාවේ නාගරික සංවර්ධන කටයුතු වලදී යොදවන අතර ඒවැනි ඒකාබද්ධ ගිණුමක් ආරම්භ කල යුතු බවට පෙන්වා දී ඇත. 2015.09.25 දින සිට 2025.06.06. දක්වා මෙම සභාවේ අදාල ශේෂය රු.1257352.06 ක් වේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා -</u>
අපේ නගර සංවර්ධනයට යොදවනවාද?

**<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**ඔව්. එම කටයුතු වලට විතරයි මෙම මුදල් යෙවිය හැක්කේ.මෙය නීතිමය අවශ්‍යතාවක් බවයි පෙන්වා දී ඇත්තේ. පළාත් පාලන කොමසාරිස් මෙම ගිණුම නොපමාව ආරම්භ කරන ලෙසත් දැනුම් දී තියෙනවා. ඒ අනුව කුරුවිට ප්‍රාදේශීය සභාව හා නාගරික සංවර්ධන බල ප්‍රදේශය තුළ අනවසරයෙන් ඉදිකර ඇති ගොඩනැගිලි සඳහා අයකරන අනවසර සේවා ගාස්තු ව ( දඩ මුදල්) තැන්පත්කිරිම සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාව හා නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ඒකාබද්ධ ගිණුමක් ආරම්භ කරමු.**

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාව හා නාගරික සංවර්ධන බල ප්‍රදේශය තුළ අනවසරයෙන් ඉදිකර ඇති ගොඩනැගිලි සඳහා අයකරන අනවසර සේවා ගාස්තු ව ( දඩ මුදල්) තැන්පත්කිරිම සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාව හා නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ඒකාබද්ධ ගිණුමක් ආරම්භ කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**06-106. කුරුවිට ප්‍රාදේශීය සභාවවට නීතිඥවරයෙකු බඳවාගැනීම,සභා අරමුදලෙන් ගෙවීම් කිරිම සම්බන්ධව මු.රෙ.104(4) පරික්ෂණ වාර්තාව අනුව මේ වන විට මියගොස් ඇති මහජන නියෝජිතයින් වන හිටපු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.රත්නසිරි මහතා සහ හිටපු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ. කුලරත්න මහතා ගෙන් අයවිය යුතු අලාභය කපාහැරීමට ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබාගැනීම සඳහා මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>**

යෝජනාව ස්ථිර කරමි. විභාග කරන්නෙත් එතුමා. උත්තර දෙන්නෙත් එතුමා. නීතිඥයෙක් බඳවාගෙන ගෙවීම් කරලා වසර ගනනාවක් ගිහින් තමා අදාල කටයුත්ත ගැන දැනුම්දීම කරන්නේ. මම නීති මගට යන්න හිතුවත් ඒකට යන නීතිඥ ගාස්තුව වැඩියි. ඒ නිසා ගෙවන්න තියෙන ගාන ගෙවනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -</u>**

හිටපු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා අසනීපෙන් ඉන්නේ. එතුමා ඉල්ලීමක් කරලා ගරු සභාවෙන්. මෙම ගාස්තුව ගෙවීම සම්බන්ධයෙන් එතුමා ගරු ආණ්ඩුකාරතුමියට අභියාචනාවක් ඉදිරිපත් කරලා. එතුමියගෙන් පිළිතුරක් ලැබෙන තෙක් අධිකරණ ක්‍රියාමාර්ග ගන්න එපා කියලා. මේ ඉල්ලිම සභාවට ඉදිරිපත්කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා -</u>**

අපි සභාවේ නඩු කීපයකට විශාල මුදලක් නීතිඥවරුන්ට ගෙව්වා. රු. 40000.00,50000.00 වගේ මුදල් ප්‍රමාණ. අපි ඒක රු. 25000.00 ට අඩු කලා. ඒ මුදලින් නීතිඥ උපදෙස් ගත්තා.වැඩ කලා. නමුත් ඒවට මුදල් අඩු කරලා නෑ. ඇත්තටම ඒවට අඩු වෙන්නත් ඕනි. නැවත පරික්ෂණයක් අවශ්‍යයි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-

ආණ්ඩුකාරතුමියට ඉල්ලීම යවන්න. සමසේ ගෙවන්න උනොත් ගෙවමු. අපි ගෙව්වේ නැත්නම් කාලත්‍රයා ගෙවන්න ඕනි. කාලත්‍රයාටත් බැරි නම් දේපල විකුනලා හරි ගෙවන්න ඕනි. අපි මේ යෝජනාව ආණ්ඩුකාරතුමියට යවමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -**

අපි මේ අභාවයට පත් උන ගරු මන්ත්‍රීතුමන්ලාගේ විස්තර යවමු ආණ්ඩුකාරතුමියට. කාටත් වෙන්න පුළුවන් දේවල්.

**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -**

මේ වන විට මියගොස් ඇති **මහජන නියෝජිතයින් වන හිටපු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.රත්නසිරි මහතා සහ හිටපු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ. කුලරත්න මහතා ගෙන් අයවිය යුතු මුදල වන එක් අයෙකුට රු. 2160.00 ක් බැගින් වන මුදල කපාහැරීමට ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබාගැනීම සඳහා යොමු කරමු.**

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවවට නීතිඥවරයෙකු බඳවාගැනීම,සභා අරමුදලෙන් ගෙවීම් කිරිම සම්බන්ධව මු.රෙ.104(4) පරික්ෂණ වාර්තාව අනුව මේ වන විට මියගොස් ඇති මහජන නියෝජිතයින් වන හිටපු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.රත්නසිරි මහතා සහ හිටපු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ. කුලරත්න මහතා ගෙන් අයවිය යුතු මුදල වන එක් අයෙකුගෙන් රු. 2160.00 ක් බැගින් වන මුදල කපාහැරීමට ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබාගැනීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -**

**06-107. කුරුවිට ප්‍රාදේශීය සභාව හා කුරුවිට වළඳුර බන්ධනාගාරය එක්ව ක්‍රියාත්මක කරනු ලබන කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතිය සම්බන්ධව 2005.10.25 දඅනැති අංක 22257 දරණ ද එළඹි ඇති ගිවිසුමට අනුව මින් පෙර මෙම අංගනයේ නිශ්පාදිත කොම්පෝස්ට් පොහොර විකිනීමෙන් ලද ආදායම ගිවිසුමේ පරිදි දෙපාර්ශවය විසින් ලබා ගන්නා ලද අතර මේ හේතුවෙන් එකල මෙම ව්‍යාපෘතිය ඉතා සාර්ථකව ක්‍රියාත්මක වී ඇත. මේ වන විට රැදවියන් කසල ව්‍යාපෘතියේ සේවය කලත් පොහොර විකිනීමක් සිදු කිරීමට තරම් නිශ්පාදනයේ ප්‍රමිතිය වර්ධනය කර ගැනීමට නොහැකිවී ඇති අතර මෙවන් තත්වයක් යටතේ බන්ධනාගාර අධිකාරී විසින්ද රැදවියන්ට හා එය පරිපාලනය කරන නිලධාරීන්ට යම් දීමනාවක් ලබා ගැනීමේ හැකියාව පිළිබදව විමසා සිටි අවස්ථාවේදී බන්ධනාගාර අධිකාරි හා පළාත් පාලන කොමසාරිස් සමඟ 2025 අප්‍රේල් මස සිදුකරන ලද සාකච්ජාවේදි මෙම කසල වෙන් කිරීම් හා කොම්පෝට් නිපදවීමට බන්ධනාගාරය විසින් රැදවියන් හා අධීක්ෂණය සඳහා නිලධාරීන්ද යොදවන බැවින් සභාවට ඉන් ශ්‍රමික හිඟයට විශාල වාසියක් ලැබෙන බැවින් දැනට කසළ අංගනයට ලැබෙන නොදිරන කසල අලෙවියෙන් ලැබන ආදායම, පරිපාලන වියදම අඩුකර දෙපාර්ශවය අතර සමසේ බෙදීයාම හා බන්ධනාගාරය වෙත හිමිවන මුදල් කොටසෙන් එම ව්‍යාපෘතියේ සේවය කරන නිලධාරියාට හා සේවය කරන රැදවියන් හට ලබාදීම පිළිබඳ එකගතාවයකට පැමිණියද නව සභාවක් පත්වනතෙක් මෙය ක්‍රියාත්මක නොකල අතර මේවන විට බන්ධනාගාර කසල අංගනයේ අලෙවි කළ හැකි විශාල නොදිරන කසල ප්‍රමාණයක් එක් රැස්වී ඇති බැවින් මෙම තොගය හා ඉදිරියටත් ලැබෙන නොදිරණ කසල තොග අලෙවියෙන්**

ලැබෙන ආදායම හා ඉදිරියේදී කොම්පෝස්ට් අලෙවියෙන් ලැබෙන ආදායම ඉහත පරිදි බෙදා හැර කටයුතු කිරීමට මහා සභාවේ සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

උප සභාපති අනිල් ලියනගේ මහතා-

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

මේ සම්බන්ධව අදාල ගිවිසුමේ පිටපතක් ඉදිරිපත් කර තිබෙනවා.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

කුරුවිට ප්‍රාදේශීය සභාව හා කුරුවිට වළඳුර බන්ධනාගාරය එක්ව ක්‍රියාත්මක කරනු ලබන කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතියේ කසළ අංගනයට ලැබෙන නොදිරන කසල හා කොම්පෝස්ට් පොහොර අලෙවියෙන් ලැබෙන ආදායම, පරිපාලන වියදම අඩුකර දෙපාර්ශවය අතර සමසේ බෙදීයාම ට හා බන්ධනාගාරය වෙත හිමිවන මුදල් කොටසෙන් එම ව්‍යාපෘතියේ සේවය කරන නිලධාරියාට හා සේවය කරන රැඳවියන් හට ලබාදීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

06-108. කුරුවිට ප්‍රාදේශීය සභාවේ ස්ථිර සේවක වැටුප්, දෛනික සේවක වැටුප් හා මන්ත්‍රී දීමනා මාසිකව අවස්ථා 03 ක් යටතේ ගෙවීම් කිරිම සිදුකරන හෙයින් අදාල වැටුප් හා දීමනා , අදාල මස ගෙවීම් කිරීමෙන් අනතුරුව මාසික ගෙවීම් වාර්තාව මගින් මහා සභාව වෙත ඉදිරිපත්කිරීමට අනුමැතිය ලබාදීම සඳහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

වාර තුනකට කරන කටයුතු නිසා අදාල මාසයේ ගෙවීම් කිරීමෙන් පසුව ගෙවීම් වාර්තාව මගින් මහා සභාවට ඉදිරිපත් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

කුරුවිට ප්‍රාදේශීය සභාවේ ස්ථිර සේවක වැටුප්, දෛනික සේවක වැටුප් හා මන්ත්‍රී දීමනා මාසිකව අවස්ථා 03 ක් යටතේ ගෙවීම් කිරිම සිදුකරන හෙයින් අදාල වැටුප් හා දීමනා , අදාල මස ගෙවීම් කිරීමෙන් අනතුරුව මාසික ගෙවීම් වාර්තාව මගින් මහා සභාව වෙත ඉදිරිපත්කිරීමට
අනුමැතිය දිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

06-109. කුරුවිට ප්‍රාදේශීය සභාවේ කසල කළමණාකරණ කටයුතු සඳහා සහායවීමට බඳවාගෙන ඇති දෛනික සෞඛ්‍ය කම්කරු එස්.පී.අනෝමා මියගේ සේවා ගිවිසුම්කාලය 2025.08.31 දිනෙන් අවසන් වන අතර ඇගේ සේවා කාලය නැවත මාස 06 ක කාලයක් සඳහා දීර්ඝ කිරිම සම්බන්ධව මහාසභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

කුරුවිට ප්‍රාදේශීය සභාවේ කසල කළමණාකරණ කටයුතු සඳහා සහායවීමට බඳවාගෙන ඇති දෛනික සෞඛ්‍ය කම්කරු එස්.පී.අනෝමා මියගේ සේවා ගිවිසුම්කාලය 2025.08.31 දිනෙන් අවසන් වන අතර ඇගේ සේවා කාලය නැවත මාස 06 ක කාලයක් සඳහා දීර්ඝ කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -

06- 110. කිතුල්පෙ වසම හල්පෙ කොට්ඨාශයේ දර්ශන සම්පත් මයා විසින් සිදුකර ඇති ඉල්ලීම අනුව හල්පෙ ගමේ සමගි මාවත මාර්ගයේ කාණු පද්ධතියක් නොමැතිකම හේතුවෙන් වැසි දිනයන්හි ගමන් කිරිමට නොහැකි ලෙස වැසිජලය රැස්වන අතර ක්‍රමවත් කාණු පද්ධතියක් සකසා වැසිජලය ගලා යාමට සැලැස්විම සම්බන්ධව මහාසභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -

මුදල් ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.
කිතුල්පෙ වසම හල්පෙ කොට්ඨාශයේ දර්ශන සම්පත් මයා විසින් සිදුකර ඇති ඉල්ලීම අනුව හල්පෙ ගමේ සමගි මාවත මාර්ගයේ කාණු පද්ධතියක් නොමැතිකම හේතුවෙන් වැසි දිනයන්හි ගමන් කිරිමට නොහැකි ලෙස වැසිජලය රැස්වන අතර ක්‍රමවත් කාණු පද්ධතියක් සකසා වැසිජලය ගලා යාමට සැලැස්විම සම්බන්ධව මුදල් ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කටයුතු සිදු කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -

06-111. කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/02/35 හා 2025.07.16 දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අදියර 1 හි පිහිටි ස්පාර්ක්ලින් ස්ටාවුර්ඩ් ලංකා පුද්ගලික සමාගමට වාණිජ පදනමින් දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

අපි මීට පෙර මෙවැනි බදු දීම් සම්බන්ධව කමිටුවක් පත් කර ඒ මගින් පරික්ෂා කිරිම් කරලයි දුන්නේ. එවැනි පරික්ෂා කිරිම්වලදි හමු උනා කර්මාන්තපුරයේ ගෙයක්. බ්ලොක් ගල්

වැඩපලක් කියලා ඉල්ලලා තිබුනේ. මේ ඉඩම් නිදහස් උනාට පස්සේ වෙනම විකිනෙනවා. අපිට පුළුවන් කර්මාන්ත පුරයෙන් කසළ ව්‍යාපෘතියට අක්කර 02 ක් විතර ගන්න. ඉල්ලිමක් කරන්න.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

කාර්මික නිලධාරි වාර්තා අරගෙන අයදුම් කර ඇති රූඩ් 01 පර්.11.7 ක් ඉඩම් ප්‍රමාණය දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදෙමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/02/35 හා 2025.07.16 දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අදියර 1 හි පිහිටි ස්පාර්ක්ලින් ස්ටාවුර්ඩ් ලංකා පුද්ගලික සමාගමට රූඩ් 01 පර්.11.7 ක් ඉඩම් ප්‍රමාණය වාණිජ පදනමින් දීර්ඝ කාලිනව බදු ලබාදීම සම්බන්ධව කාර්මික නිලධාරි වාර්තා ලබාගෙන බදු ලබාදීම සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

06-112. කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/02/95 හා 2025.07.16 දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අදියර 2 හි පිහිටි වී.ආර්.සී.ඉන්ඩ්‍රස්ට්‍රිස් ප්‍රයිඩට් ලිමිටිඩ් ආයතනය වෙත කැඩැස්තර සිතියම් අංක 620340 හි කලාප අංක 20 පත්‍ර අංක 04 කැබලි අංක 52,53 ට අයත් රූඩ් 03 පර්චස් 0.3 ක ඉඩම් ප්‍රමාණය වාණිජ පදනමින් දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව කුරුවිට ප්‍රාදේශීය සභාවේ එකඟත්වය ලබාදීම සම්බන්ධයෙන් සභාතීරණයක් ගැනීමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

කාර්මික නිලධාරි වාර්තා අරගෙන අයදුම් කර ඇති රූඩ් 03 පර්චස් 0.3 ක ඉඩම් ප්‍රමාණය දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදෙමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/02/95 හා 2025.07.16 දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අදියර 2 හි පිහිටි වී.ආර්.සී.ඉන්ඩ්‍රස්ට්‍රිස් ප්‍රයිඩට් ලිමිටිඩ් ආයතනය වෙත කැඩැස්තර සිතියම් අංක 620340 හි කලාප අංක 20 පත්‍ර අංක 04 කැබලි අංක 52,53 ට අයත් රූඩ් 03 පර්චස් 0.3 ක ඉඩම් ප්‍රමාණය වාණිජ පදනමින් දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව කාර්මික නිලධාරී වාර්තා ලබාගෙන බදු ලබාදි සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

__ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -__

**06-113. කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/07/163 හා 2022.12.21 දිනැති ලිපිය අනුව ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ අංක 2008/04 විධිවිධාන ප්‍රකාරව පවත්වනලද ඉඩම් කච්චේරි මගින් වඩුතන්ත්‍රිගේ කුමුදිනී අමිතා මිය හට බටුහේනවත්ත අග.පි.අංක 620275 කලාප අංක 3 හි පර්චස් 17.2 ක් නේවාසික කටයුතු සඳහා දීර්සකාලීනව** බදු ලබාදීමට තීරණය වී ඇති අතර ඒ සම්බන්ධයෙන් කුරුවිට ප්‍රාදේශීය සභාවේඑකඟත්වය ලබාදීම සම්බන්ධව සභාතීරණයක් ගැනීමට යෝජනා කරමි.

__ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-__

**එම යෝජනාව ස්ථිර කරමි.**

__ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -__

**කාර්මික නිලධාරි වාර්තා අරගෙන අයදුම් කර ඇති පර්චස් 17.2 ඉඩම් ප්‍රමාණය දීර්ස කාලීනව බදු ලබාදීම සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදෙමු.**

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**
**කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/07/163 හා 2022.12.21 දිනැති ලිපිය අනුව ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ අංක 2008/04 විධිවිධාන ප්‍රකාරව පවත්වනලද ඉඩම් කච්චේරි මගින් වඩුතන්ත්‍රිගේ කුමුදිනී අමිතා මිය හට බටුහේනවත්ත අග.පි.අංක 620275 කලාප අංක 3 හි පර්චස් 17.2 ක් නේවාසික කටයුතු සඳහා දීර්සකාලීනව** බදු ලබාදීමට තීරණය වී ඇති අතර ඒ සම්බන්ධයෙන් **කාර්මික නිලධාරී වාර්තා ලබාගෙන බදු ලබාදිම සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

__ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -__

06-114. කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/02/98 හා 2025.07.17 දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අදියර 2 හි පිහිටි ඉමේජ් මේකර්ස් පුද්ගලික සමාගම වෙත කැඩැස්තර සිතියම් අංක 620340 හි කලාප අංක 20 පත්‍ර අංක 04 කැබලි අංක 26 ට අයත් පර්චස් 88 ක ඉඩම් ප්‍රමාණය වාණිජ පදනමින් දීර්ස කාලීනව බදු ලබාදීම සම්බන්ධව කුරුවිට ප්‍රාදේශීය සභාවේ එකඟත්වය ලබාදීම සම්බන්ධයෙන් සභාතීරණයක් ගැනීමට යෝජනා කරමි

__ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-__

**එම යෝජනාව ස්ථිර කරමි.**

__ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -__

**කාර්මික නිලධාරි වාර්තා අරගෙන අයදුම් කර ඇති** පර්චස් 88 ක **ඉඩම් ප්‍රමාණය දීර්ස කාලීනව බදු ලබාදීම සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදෙමු.**

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**
කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/02/98 හා 2025.07.17 දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අදියර 2 හි පිහිටි ඉමේජ් මේකර්ස්

පුද්ගලික සමාගම වෙත කැඩැස්තර සිතියම් අංක 620340 හි කලාප අංක 20 පත්‍ර අංක 04 කැබලි අංක 26 ට අයත් පර්චස් 88 ක ඉඩම් ප්‍රමාණය වාණිජ පදනමින් දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධයෙන් **කාර්මික නිලධාරී වාර්තා ලබාගෙන බදු ලබාදීම සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

06-115. කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/02/89 හා 2025.07.28 දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අදියර 2 හි පිහිටි එන්.ඩී.ටී.වුඩ් ප්‍රඩක්ට්ස් ආයතනය වෙත කැඩැස්තර සිතියම් අංක 620340 හි කලාප අංක 20 පත්‍ර අංක 04 කැබලි අංක 50 ට අයත් රූඩ් 01යි පර්චස් 2.3 ක ඉඩම් ප්‍රමාණය වාණිජ පදනමින් දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව කුරුවිට ප්‍රාදේශීය සභාවේ එකඟත්වය ලබාදීම සම්බන්ධයෙන් සභාතීරණයක් ගැනීමට යෝජනා කරමි.

**<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**කාර්මික නිලධාරි වාර්තා අරගෙන අයදුම් කර ඇති** රූඩ් 01යි පර්චස් 2.3 ක **ඉඩම් ප්‍රමාණය දීර්ඝ කාලිනව බදු ලබාදීම සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදෙමු.**

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**
කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/02/89 හා 2025.07.28 දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අදියර 2 හි පිහිටි එන්.ඩී.ටී.වුඩ් ප්‍රඩක්ට්ස් ආයතනය වෙත කැඩැස්තර සිතියම් අංක 620340 හි කලාප අංක 20 පත්‍ර අංක 04 කැබලි අංක 50 ට අයත් රූඩ් 01යි පර්චස් 2.3 ක ඉඩම් ප්‍රමාණය වාණිජ පදනමින් දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව **කාර්මික නිලධාරී වාර්තා ලබාගෙන බදු ලබාදීම සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

06-116. කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/02/62 හා 2025.06.09 දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අදියර 1 හි පිහිටි ඩී.ඩී.කේ.ටෙක්නිකල් ඉන්ඩස්ට්‍රීස් ආයතනය වෙත කැඩැස්තර සිතියම් අංක 620340 හි කලාප අංක 21 පත්‍ර අංක 01 කැබලි අංක 17,18 සහ 15 (කොටසක් )යන ඉඩම්කැබලි වලින් රූඩ් 01යි පර්චස් 11.7 ක ඉඩම් ප්‍රමාණය වාණිජ පදනමින් දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව කුරුවිට ප්‍රාදේශීය සභාවේ එකඟත්වය ලබාදීම සම්බන්ධයෙන් සභාතීරණයක් ගැනීමට යෝජනා කරමි.

**<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -**

**කාර්මික නිලධාරි වාර්තා අරගෙන අයදුම් කර ඇති** රූඩ් 01යි පර්චස් 11.7 ක **ඉඩම් ප්‍රමාණය දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදෙමු**

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**
කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/02/62 හා 2025.06.09 දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අදියර 1 හි පිහිටි ඩී.ඩී.කේ.ටෙක්නිකල් ඉන්ඩස්ට්‍රීස් ආයතනය වෙත කැඩැස්තර සිතියම් අංක 620340 හි කලාප අංක 21 පත්‍ර අංක 01 කැබලි අංක 17,18 සහ 15 (කොටසක් )යන ඉඩම්කැබලි වලින් රූඩ් 01යි පර්චස් 11.7 ක ඉඩම් ප්‍රමාණය වාණිජ පදනමින් දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව කුරුවිට ප්‍රාදේශීය සභාවේ එකඟත්වය ලබාදීම සම්බන්ධයෙන් **කාර්මික නිලධාරී වාර්තා ලබාගෙන බදු ලබාදීම සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -**

06-117. කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/02/60 හා 2025.06.09 දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අදියර 2 හි පිහිටි එවර් ග්‍රීප් ඔටෝමෝටිව් ආයතනය වෙත කැඩැස්තර සිතියම් අංක 620340 හි කලාප අංක 20 පත්‍ර අංක 04 කැබලි අංක 59 ට අයත් රූඩ් 01යි පර්චස් 24 ක ඉඩම් ප්‍රමාණය වාණිජ පදනමින් දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව කුරුවිට ප්‍රාදේශීය සභාවේ එකඟත්වය ලබාදීම සම්බන්ධයෙන් සභාතීරණයක් ගැනීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -**

**කාර්මික නිලධාරි වාර්තා අරගෙන අයදුම් කර ඇති** රූඩ් 01යි පර්චස් 24 ක **ඉඩම් ප්‍රමාණය දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදෙමු**

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**
කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/02/60 හා 2025.06.09 දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අදියර 2 හි පිහිටි එවර් ග්‍රීප් ඔටෝමෝටිව් ආයතනය වෙත කැඩැස්තර සිතියම් අංක 620340 හි කලාප අංක 20 පත්‍ර අංක 04 කැබලි අංක 59ට අයත් රූඩ් 01යි පර්චස් 24 ක ඉඩම් ප්‍රමාණය වාණිජ පදනමින් දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව **කාර්මික නිලධාරී වාර්තා ලබාගෙන බදු ලබාදීම සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

06-118. කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/02/92 හා 2025.06.25 දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අදියර 2 හි පිහිටි ලක්රුවන් එන්ටර්ප්‍රයිසස් ආයතනය වෙත කැඩැස්තර සිතියම් අංක 620340 හි කලාප අංක 20 පත්‍ර අංක 04 කැබලි අංක 62 ට අයත් පර්චස් 18 ක ඉඩම් ප්‍රමාණය වාණිජ පදනමින් දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව කුරුවිට ප්‍රාදේශීය සභාවේ එකඟත්වය ලබාදීම සම්බන්ධයෙන් සභාතීරණයක් ගැනීමට යෝජනා කරමි.

**<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**කාර්මික නිලධාරි වාර්තා අරගෙන අයදුම් කර ඇති** ක පර්චස් 18 ක **ඉඩම් ප්‍රමාණය දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදෙමු**

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/02/92 හා 2025.06.25 දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අදියර 2 හි පිහිටි ලක්රුවන් එන්ටර්ප්‍රයිසස් ආයතනය වෙත කැඩැස්තර සිතියම් අංක 620340 හි කලාප අංක 20 පත්‍ර අංක 04 කැබලි අංක 62 ට අයත් පර්චස් 18 ක ඉඩම් ප්‍රමාණය වාණිජ පදනමින් දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව **කාර්මික නිලධාරී වාර්තා ලබාගෙන බදු ලබාදීම සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය**

**<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

06-119. කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/02/102 හා 2025.06.25 දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අදියර 1 හි පිහිටි සංජීව මනුපැක්චරින් ආයතනය වෙත කැඩැස්තර සිතියම් අංක 620340 හි කලාප අංක 21 පත්‍ර අංක 01 කැබලි අංක 50 ට අයත් පර්චස් 32.1 ක ඉඩම් ප්‍රමාණය වාණිජ පදනමින් දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව කුරුවිට ප්‍රාදේශීය සභාවේ එකඟත්වය ලබාදීම සම්බන්ධයෙන් සභාතීරණයක් ගැනීමට යෝජනා කරමි.

**<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**කාර්මික නිලධාරි වාර්තා අරගෙන අයදුම් කර ඇති** ක පර්චස් 32.1 ක **ඉඩම් ප්‍රමාණය දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදෙමු**

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/02/102 හා 2025.06.25 දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අදියර 1 හි පිහිටි සංජීව මනුපැක්චරින් ආයතනය වෙත කැඩැස්තර සිතියම් අංක 620340 හි කලාප අංක 21 පත්‍ර අංක 01 කැබලි අංක 50 ට අයත් පර්චස් 32.1 ක ඉඩම් ප්‍රමාණය වාණිජ පදනමින් දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව **කාර්මික නිලධාරී වාර්තා ලබාගෙන බදු ලබාදීම සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය**

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

06-120. කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/02/68 හා 2025.06.20 දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අදියර 2 හි පිහිටි ජී.කේ.යූ.සී.ඉන්ටර්නැෂනල් පුද්ගලික ආයතනය වෙත කැඩැස්තර සිතියම් අංක 620340 හි කලාප අංක 20 පත්‍ර අංක 04 කැබලි අංක 70 ට අයත් රූඩ් 2 පර්චස් 19 ක ඉඩම් ප්‍රමාණය වාණිජ පදනමින් දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව කුරුවිට ප්‍රාදේශීය සභාවේ එකඟත්වය ලබාදීම සම්බන්ධයෙන් සභාතීරණයක් ගැනීමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

**එම යෝජනාව ස්ථිර කරමි.**

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**කාර්මික නිලධාරි වාර්තා අරගෙන අයදුම් කර ඇති** රූඩ් 2 පර්චස් 19 ක **ඉඩම් ප්‍රමාණය දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදෙමු**

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**
කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/02/68 හා 2025.06.20 දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අදියර 2 හි පිහිටි ජී.කේ.යූ.සී.ඉන්ටර්නැෂනල් පුද්ගලික ආයතනය වෙත කැඩැස්තර සිතියම් අංක 620340 හි කලාප අංක 20 පත්‍ර අංක 04 කැබලි අංක 70 ට අයත් රූඩ් 2 පර්චස් 19 ක ඉඩම් ප්‍රමාණය වාණිජ පදනමින් දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව කුරුවිට ප්‍රාදේශීය සභාවේ එකඟත්වය ලබාදීම සම්බන්ධයෙන් **කාර්මික නිලධාරී වාර්තා ලබාගෙන බදු ලබාදීම සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය**

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

06-121. කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/02/101 හා 2025.06.02 දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අදියර 1 හි පිහිටි එම්.කේ.ජී.තේ නිශ්පාදන ආයතනය වෙත කැඩැස්තර සිතියම් අංක 620340 හි කලාප අංක 23 පත්‍ර අංක 01 කැබලි අංක 14 ට අයත් පර්චස් 8.5 ක ඉඩම් ප්‍රමාණය වාණිජ පදනමින් දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව කුරුවිට ප්‍රාදේශීය සභාවේ එකඟත්වය ලබාදීම සම්බන්ධයෙන් සභාතීරණයක් ගැනීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -**

**කාර්මික නිලධාරි වාර්තා අරගෙන අයදුම් කර ඇති** පර්චස් 8.5 ක **ඉඩම් ප්‍රමාණය දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදෙමු**

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/02/101 හා 2025.06.02 දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අදියර 1 හි පිහිටි එම්.කේ.ජී.තේ නිශ්පාදන ආයතනය වෙත කැඩැස්තර සිතියම් අංක 620340 හි කලාප අංක 23 පත්‍ර අංක 01 කැබලි අංක 14 ට අයත් පර්චස් 8.5 ක ඉඩම් ප්‍රමාණය වාණිජ පදනමින් දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව කුරුවිට ප්‍රාදේශීය සභාවේ එකඟත්වය ලබාදීම සම්බන්ධයෙන් සම්බන්ධයෙන් **කාර්මික නිලධාරී වාර්තා ලබාගෙන බදු ලබාදීම සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය**

**ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -**

06-122. කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/02/58 හා 2025.05.28 දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අදියර 1 හි පිහිටි වෙයිහයිලංකා පුද්ගලික සමාගම වෙත කැඩැස්තර සිතියම් අංක 620340 හි කලාප අංක 20 පත්‍ර අංක 04 කැබලි අංක 74හා 75 ට අයත් අක්කර 02 රූඩ් 02 පර්චස් 28.9ක ඉඩම් ප්‍රමාණය වාණිජ පදනමින් දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව කුරුවිට ප්‍රාදේශීය සභාවේ එකඟත්වය ලබාදීම සම්බන්ධයෙන් සභාතීරණයක් ගැනීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -**

**කාර්මික නිලධාරි වාර්තා අරගෙන අයදුම් කර ඇති** අක්කර 02 රූඩ් 02 පර්චස් 28.9 ක **ඉඩම් ප්‍රමාණය දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදෙමු**

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/02/58 හා 2025.05.28 දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අදියර 1 හි පිහිටි වෙයිහයිලංකා පුද්ගලික සමාගම වෙත කැඩැස්තර සිතියම් අංක 620340 හි කලාප අංක 20 පත්‍ර අංක 04 කැබලි අංක 74හා 75 ට අයත් අක්කර 02 රූඩ් 02 පර්චස් 28.9ක ඉඩම් ප්‍රමාණය වාණිජ පදනමින් දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව **කාර්මික නිලධාරී වාර්තා ලබාගෙන බදු ලබාදීම සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

06-123. කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/07/140 හා 2025.01.30 දිනැති ලිපිය අනුව වළදූර වසමේ පවත්වන ලද ඉඩම්කච්චේරියෙන් අ.ග.සි.333 අංක R/KRW/94/323 අනුරේඛනයේ ලොට් අංක 36 දරණ ඉඩමෙන් හෙක්.0.0248 ක ප්‍රමාණයක් නේවාසික කටයුතු සඳහා වියලගොඩගේ චන්ද්‍රිකා ගුණවර්ධන මිය වෙත නේවාසික කටයුතු සදහා දීර්සකාලීන බදු පදනම මත ලබාදීම සම්බන්ධයෙන් සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

**<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**කාර්මික නිලධාරි වාර්තා අරගෙන අයදුම් කර ඇති** හෙක්.0.0248 ක **ඉඩම් ප්‍රමාණය දීර්ස කාලීනව බදු ලබාදීම සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදෙමු**

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ අංක KUDS/LND/05/LEASE/07/140 හා 2025.01.30 දිනැති ලිපිය අනුව වළදූර වසමේ පවත්වන ලද ඉඩම්කච්චේරියෙන් අ.ග.සි.333 අංක R/KRW/94/323 අනුරේඛනයේ ලොට් අංක 36 දරණ ඉඩමෙන් හෙක්.0.0248 ක ප්‍රමාණයක් නේවාසික කටයුතු සඳහා වියලගොඩගේ චන්ද්‍රිකා ගුණවර්ධන මිය වෙත නේවාසික කටයුතු සදහා දීර්සකාලීන බදු පදනම මත ලබාදීම සම්බන්ධයෙන් **කාර්මික නිලධාරී වාර්තා ලබාගෙන බදු ලබාදීම සම්බන්ධව ගැටළුවක් නොමැති නම් එකඟත්වය ලබාදීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

06-124. කිතුල්පෙ,කුරුවිට,කොට්ඨාශ සභාව,මගින් යොමුකර ඇති ඉල්ලීම් ලිපිය අනුව කිතුල්පෙ පන්සල අසල සිට පාතගම මාර්ගය දක්වා අබලන් තත්වයේ පවතින හෙයින් එම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා -</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>**

කොට්ඨාශයේ මන්ත්‍රී වරයා මගින් ඉදිරිපත් කරන්න.

**<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

ඒ පිලිබඳව ඉදිරියේදී දැනුම් දෙමු. මෙය මහජන ඉල්ලීමක්. ප්‍රතිපාදන ඇති ආකාරයෙන් කරමු.

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

කිතුල්පෙ,කුරුවිට,කොට්ඨාශ සභාව,මගින් යොමුකර ඇති ඉල්ලීම් ලිපිය අනුව කිතුල්පෙ පන්සල අසල සිට පාතගම මාර්ගය දක්වා අබලන් තත්වයේ පවතින හෙයින් එම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරිමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

06-125. දොඩම්පෙ කොට්ඨාශ සභාව,මගින් යොමුකර ඇති ඉල්ලීම් ලිපිය අනුව මිල්ලකඩේ හාමිගෙවත්ත පාර මිටර් 200 ක පමන ප්‍රමාණය අබලන්ව ඇති අතර එම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා -</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

ප්‍රතිපාදන ඇති ආකාරයෙන් කරමු.

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

දොඩම්පෙ කොට්ඨාශ සභාව,මගින් යොමුකර ඇති ඉල්ලීම් ලිපිය අනුව මිල්ලකඩේ හාමිගෙවත්ත පාර මිටර් 200 ක පමන ප්‍රමාණය අබලන්ව ඇති අතර එම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට **මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

06-126. කුරුවිට ප්‍රාදේශිය සභාවේ කිරිඇල්ල පෙරපාසැලේ පිටුපස කොටසේ අඩු වියදමින් වහලයක් සාදා ඉඩප්‍රමාණය වැඩිකොට භාවිතයට ගැනීමට ඇති හැකියාව සොයාබැලීමට යෝජනා කරමි.

<u>උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

පෙර පාසැලේ දරුවන් 60 ක් පමන අධ්‍යාපනය ලබනවා. ඉඩ ප්‍රමාණය පිලිබඳව ගැටළුවක් තියෙනවා. මේ ස්ථානය යම් සංවර්ධනයක් කිරිමට ඇති හැකියාව පිලිබඳව කාර්මික නිලධාරි මගින් වාර්තා ගෙන කටයුතු කරමු.

**<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>**

පෙරපාසැල පිටුපස ඉඩම සම්බන්ධයෙන් තිබ්බ නඩුව අවසන් වෙලා භුක්තිය භාර ගන්න තිබුණෙ. නමුත් ඒ සඳහා කටයුතු කරලා නෑ. මේ පිළිබඳව සොයා බලා ඉදිරි කටයුතු කරන්න.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

ඒ සම්බන්ධයෙන්ද සොයා බලා කටයුතු කරමු.

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

කුරුවිට ප්‍රාදේශිය සභාවේ කිරිඇල්ල පෙරපාසැලේ පිටුපස කොටසේ අඩු වියදමින් වහලයක් සාදා ඉඩප්‍රමාණය වැඩිකොට භාවිතයට ගැනීමට ඇති හැකියාව පිලිබඳව කාර්මික නිලධාරි මගින් වාර්තාවක් ගෙන ඉදිරි කටයුතු කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

06-127.කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් මීගස්තැන්න නැවත පදිංචි කිරීමේ නිවාස ව්‍යාපෘතියේ බිම්කට්ටි 88ක් සඳහා ගාස්තු රහිතව සැලසුම් අනුමතකරගැනීමට ඉල්ලිමක් සිදුකර ඇති අතර ගාස්තු රහිතව ලබාදීමට නොහැකි බව දැන්වූයෙන් මෙම ව්‍යාපෘතිය ආපදා නිවාස ව්‍යාපෘතියක් බැවින් රැඳවුම් මුදල නිදහස් කරගැනිමට සභාවෙන් සැලසුම් අනුමත කිරීමෙන් තොරව පදිංචියට සුදුසු බවට ප්‍රකාශිත ලිපියක් ලබාදෙන ලෙස ඉල්ලා ඇති අතර ඒ සඳහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් මීගස්තැන්න නැවත පදිංචි කිරීමේ නිවාස ව්‍යාපෘතියේ බිම්කට්ටි 88ක් සඳහා ගාස්තු රහිතව සැලසුම් අනුමතකරගැනීමට ඉල්ලීමක් සිදුකර ඇති අතර ගාස්තු රහිතව ලබාදීමට නොහැකි බව දැන්වූයෙන් මෙම ව්‍යාපෘතිය ආපදා නිවාස ව්‍යාපෘතියක් බැවින් රැඳවුම් මුදල නිදහස් කරගැනිමට සභාවෙන් සැලසුම් අනුමත කිරීමෙන් තොරව පදිංචියට සුදුසු බවට ප්‍රකාශිත ලිපියක් ලබාදෙන ලෙස ඉල්ලා ඇති අතර ඒ සඳහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

**<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**
යේ ාජනාව ස්ථිර කරමි.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**
නාය යාම් සිදුවී නිසා නැවත පදිංචියට මීට පෙරත් බිම් කට්ටි 88 ක් ගාස්තු රහිතව අනුමත කරලා දෙන්න ඉල්ලීමක් කරත් ගාස්තු රහිතව සිදු කල නොහැකි බව සභාවෙන් නමුත් මෙම ව්‍යාපෘතිය ආපදා නිවාස ව්‍යාපාතියක් බැවින් රැඳවුම් මුදල් නිදහස් කර ගැනීම සඳහා සභාවෙන් සැලසුම් අනුමත කිරීමෙන් තොරව පදිංචියට සුදුසු බවට ප්‍රකාශිත ලිපියක් පමනක් ලබාදෙන ලෙස ඉල්ලීමක් කරලා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා -</u>**

2017 වර්ෂයේ නාය යාම් යටතේ ආපදාවට පත්වූ අය.අධි අවධානම් අය මේ ස්ථානයේ පදිංචි කරවිමට කටයුතු කරන්නේ. මෙම කටයුත්ත කරමු. එසේම මෙතන ක්‍රිඩා පිටියක් තියෙනවා. තියෙන්නේ ප්‍රාදේශිය ලේකම් යටතේ. සභාවෙන් සංවර්ධනය කලාට තියෙන්නේ ප්‍රාදේශිය ලේකම් යටතේ.අපේ භාරයට ගමු. තව පර්චස් 5 ක් පමන කරුණාපාල මන්ත්‍රිතුමා ප්‍රජා ශාලාවක් හදන්න වෙන් කලා.පර්චස් දෙකට 30000.00 පමන දුන්නා. ජනතා ඉල්ලිමක්. ප්‍රජා ශාලාව සදහා. තොරතුරු සභාවේ ඇති. ඉදිරි කටයුතු කරන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂණ නාපාවල මහතා -</u>**

ක්‍රීඩා පිටියක් ලෙස පවරා ගැනීමට අවශ්‍ය ලිපි කටයුතු සිදු කලා. ක්‍රමවේදය අනුව එම කටයුතු සිදුවෙනවා.මේ ස්ථානයේ සේවා පියසක්ද සැකසීමට සැලසුම්කර පළාත් සභාව සමග කථා කලා.

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව සහ කුරුවිට ප්‍රාදේශීය ලේකම්ගේ ඉල්ලීම අනුව මීගස්තැන්න නැවත පදිංචි කිරීමේ නිවාස ව්‍යාපෘතිය ආපදා නිවාස ව්‍යාපෘතියක් බැවින් රඳවුම් මුදල නිදහස් කරගැනීමට සභාවෙන් සැලසුම් අනුමත කිරීමෙන් තොරව එම බිම් කට්ටි පදිංචියට සුදුසු බවට ප්‍රකාශිත ලිපියක් ලබාදෙන ලෙස ඉල්ලා ඇති අතර ඒ සඳහා මහා සභා අනුමැතිය ලබාදීමට ඒකමතිකව තීරණය විය.

06-128. කුරුවිට ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ කටයුතු සඳහා විදුලිය ඇණහිටීම බාධාවක් වන බැවින් ආදාහනාගාරය සඳහා විදුලිජනක යන්ත්‍රයක් මිලදී ගැනිමට යෝජනා කරමි.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

කුරුවිට ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ කටයුතු සඳහා විදුලිය ඇණහිටීම බාධාවක් වන බැවින් ආදාහනාගාරය සඳහා විදුලිජනක යන්ත්‍රයක් මිලදී ගැනිමට යෝජනා කරමි.

**<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**
යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**
අදාහනාගාරයේ කටයුතු වලදි හදිසි විදුලිය බිඳවැටීමකදී භාවිතයට ගත් මෙම විදුලි ජනක යන්ත්‍රය ක්‍රියා විරහිත වෙලා. එය නැවත යථා තත්වයට ගත හැකිදැයි විමසූ අතර එය සැකසිය නොහැකි බවයි දැනුම්දුන්නේ. මෙම තත්වය දිගින් දිගට සිදු වීම ආදාහනාගාර කටයුතු වලට බාධාවක්.ජනතාවට අපහසුතාවක්.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලීන් අධිකාරම් මහතා -</u>**

ආදාහනාගාරයට කුඩා ධාරිතාවයක විදුලි ජනක යන්ත්‍රයක් අරන් පැවැත්මක් නෑ. නැවත ගනිද්දි සුදුසු ඒ ස්ථානයේ කටයුතු වලට ගැලපෙන ධාරිතාවයකින් යුතු ජෙනරේටරයක් ගන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා -</u>**
සූර්යකෝෂ භාවිතා කරන්න බැරිද?

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලීන් අධිකාරම් මහතා -</u>**
සූර්ය කෝෂ භාවිතය හිතකර දෙයක් උවත් එම මුදලින් ජෙනරේටර් කීපයක් ගන්න පුළුවන්.මෙම ස්ථානයට ගැලපෙන්නේ කිලෝ වොට් 5 ට එහා ගිය ජෙනරේටරයක්. තිබුණ ජෙනරේටරය ප්‍රමාණයවත් නැහැ.මේ ස්ථානයට දිගු කාලීන පැවැත්මක් සහිත එකක් ගන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -</u>**
සූර්ය විදුලිය නිෂ්පාදනය මුදල් ඉපයිමක්. බයෝ ගෑස් සැකසිය හැකියි.නමුත් මෙම ස්ථානයට කටයුතු වලට ප්‍රමාණවත් ලෙස ජෙනරේටරයක් අවශ්‍යයි. ඒ සඳහා සුදුසු එකක් ගන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් කුමාර ජයනෙත්ති මහතා -</u>**
පසුගියදා මෙම සභාවේ නයනා මන්ත්‍රීතුමියකගේ නැන්දණිය ගේ ආදාහන කටයුත්තේදිත් ගැටළු මතු උනා.සවස 4 ඉඳන් රෑ 8.30වෙනතුරු ප්‍රමාදයක් සිදු උනා.එතන සේවකයින්ටත් ගැටළු ඇවිත් අපි මැදිහත්වෙලා විසඳාගත්තා. මේ ජෙනරේටරය අත්‍යාවශ්‍යයි.සභාවට ආදායමක් එන කටයුත්තක්.ජනතාවට සේවයක්.ගමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂණ නාපාවල මහතා -</u>**
මෙම සභාවේ කටයුතු වලටත් එකක් ගමු.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**
දැනට තියෙන ජෙනරේටරය අළුත්වැඩියාව සිදුකල හැකිද තව දුරටත් විමසා බලමු. හැකිනම් එය අළුත්වැඩියා කරලා සභාවට ගමු. ආදාහනාගාරය සඳහා නියමිත පිරිවිතර සහිතව ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරලා නීත්‍යානුකූලව ජෙනරේටරයක් මිලදී ගමු.

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව** කුරුවිට ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ කටයුතු සඳහා විදුලිය ඇණහිටීම බාධාවක් වන බැවින් ආදාහනාගාරය සඳහා නියමිත පිරිවිතර සහිතව ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කොට නීත්‍යානුකූලව විදුලිජනක යන්ත්‍රයක් මිලදී ගැනීමට ඒකමතිකව මහා සභා තීරණය විය.

06-129. කුරුවිට ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ ගෑස් ලබාගැනීම මේ වන තෙක් සිදුකරනුයේ ලාෆ් නාමයෙන් පමනක් වන අතර රටතුල වරින්වර සිදුවන ගෑස් හිඟතාවයෙන් හා මිළ වෙනස්වීම ආදිය හේතුවෙන් එක් එක් වෙළඳ නාමයකින් ගෑස් ලබාගැනීම අවාසි සහගත වන බැවින් එය වලක්වා ගැනීමට අනෙකුත් නාමයන්ගෙන්ද ගෑස් ලබාගැනිමට යෝජනා කරමි.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

මෙම යෝජනාවේ ලාෆ් යන්න ෂෙල් ලෙස විය යුතුයි.එ් අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ ගෑස් ලබාගැනීම මේ වන තෙක් සිදුකරනුයේ ෂෙල් නාමයෙන් පමනක් වන අතර රටතුල වරින්වර සිදුවන ගෑස් හිඟතාවයෙන් හා මිළ වෙනස්වීම ආදිය හේතුවෙන් එක් එක් වෙළඳ නාමයකින් ගෑස් ලබාගැනීම අවාසි සහගත වන බැවින් එය වලක්වා ගැනීමට අනෙකුත් නාමයන්ගෙන්ද ගෑස් ලබාගැනීමට යෝජනා කරමි.

**<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**
එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**දැනට තියෙන්නේ ෂෙල්. මේ වෙළඳ නාමයෙන් මිලදි ගන්න විතරයි අනුමැතිය අරන් තියෙන්නේ. හදිසියේ මේ ගෑස් වෙළඳපල හිගයක් උනොත් අනිත්වාගෙන් ගන්න පුළුවන් අනුමැතිය කලින් අරන් තිබීම සුදුසුයි.**

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව** කුරුවිට ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ ගෑස් ලබාගැනීම මේ වන තෙක් සිදුකරනුයේ ෂෙල් නාමයෙන් පමනක් වන අතර රටතුල වරින්වර සිදුවන ගෑස් හිඟතාවයෙන් හා මිළ වෙනස්වීම ආදිය හේතුවෙන් එක් එක් වෙළඳ නාමයකින් ගෑස් ලබාගැනීම අවාසි සහගත වන බැවින් එය වලක්වා ගැනීමට අනෙකුත් නාමයන්ගෙන්ද ගෑස් ලබාගැනීමට ඒකමතිකව මහා සභා තීරණය විය.

**07. කාරක සභාවල වාර්තා ඉදිරිපත් කිරීම -**

**07 - 01. 2025. 07.24 දිනැති මුදල් කමිටු වාර්තාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>
කමිටු වාර්තාවේ වන මිලදී ගැනීම් සඳහා අනුමැතිය ලබාදුන් බවට සඳහන්. ඒවා නිර්දේශ ද?

<u>**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -**</u>
**මුදල් සීමාව ලක්ෂ 10 දක්වා වන මිලදී ගැනීම් වලට මුදල් කමිටුවට බලය පැවරුවා. ඊට වැඩි මුදලක් වැය වන ඒවා මහා සභාවේ අනුමැතියට යොමු කර තියෙනවා.**
<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -**</u>
අංක 28 යටතේ නීතිඥ ගාස්තුව 35000.00 ක් ගෙවනවා. අපි රු. 25000.00 යක් ගෙවන්නයි කටයුතු කලේ. සභාවට වාසි දායක ලෙස. එය ගැටළුවක් උනා.

අංක 30 යටතේ වන ව්‍යාපෘති සම්බන්ධව විමසූ අතර ඒවා ගරු ආණ්ඩුකාර අනුමැතියෙන් ක්‍රියාත්මක වූ අතර වැඩ අවසන් බිල්පත් ගෙවීමට අනුමත වූ බවට සාකච්චා විය. එසේම මෙම ව්‍යාපෘති කාගේද යන්න නමින් සඳහන් කර ඉදිරිපත් කිරීමටද සාකච්ජා විය.

07-02. 2025.07.29 දිනැති ජල කමිටු වාර්තාව.

කමිටු වාර්තාව පිලිබඳව සාකච්ජා කල අතර පසුගිය සතියේ සාකච්ජාවට ලක් උන ජල මෝටරය

ව්‍යාපෘතිය සතුව පවතින බවත් එය ජල සම්පාදන කටයුතු සඳහා ළිඳට සවිකර ඇති බවත් සාකච්චාවට බඳුන් විය. මේ සම්බන්ධව විස්තර ජල කමිටු වාර්තාවේ ඉදිරිපත්ව ඇත.
එසේම **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂන නාපාවල මහතා විසින් අදහස් දක්වමින් මෙම කමිටුවට ද ගෙවීම් කිරීමකින් තොරව සභාවේ අනිත් කමිටු මෙන් පවත්වාගෙන යාම සුදුසු බවත් ස්වේච්ජාවෙන් කටයුතු කිරීම සුදුසු බවත් ප්‍රකාශ කලේය. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුල මහතා අදහස් දක්වමින් කමිටු දීමනාව රු. 5000.00 ගෙවීම සම්බන්ධයෙන් එකඟ නොවන අතර රු. 1000.00 ක් ගෙවීමක් සිදු කිරීම සුදුසු බවත් කාර්යාලයිය වේලාවෙන් පසුවත් මෙම කමිටුව පැවැත්වෙන බැවින් එසේ ගෙවීම සාධාරණ බවද ප්‍රකාශ කලේය. ගරු උප සභාපති අනිල් ලියනගේ මහතාද මුදල් ගෙවීමකින් තොරව කමිටු කටයුතු සිදු කිරීම සුදුසු බවට අදහස් දැක්වීය.**

**08 . ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ ,එකතු කල ආදායම් පිලිබඳ ප්‍රගති වාර්තා-**

**08-01. 2025 ජූලි මස ගෙවීම් වාර්තාව.**

**08-02. 2025 ජූනි මස ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව**

**08-03. 2025 ජූනි මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය.**

**08- 04. 2025 ජූනි මස ඒකාබද්ධ වැය සාරාංශය.**

**2025 ජූලි මස ගෙවීම් වාර්තාව, 2025 ජූනි මස ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව, 2025 ජූනි මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය, 2025 ජූනි මස ඒකාබද්ධ වැය සාරාංශය පිලිබඳව**

**පොදුවේ සාකච්ජා කළ අතර ගැටළු සහිත පැවති තොරුතුරු සම්බන්ධව නිරාකරණය කරගන්නා ලදී.**

**09.** සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම් - නොමැත.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා</u>

**අද දින මහා සභාවේ සියළු කටයුතු සඳහා සහාය දුන් සියළු ගරු මන්ත්‍රීතුමන්ලාට ,මාධ්‍ය හිතවතුන්ට,කාර්යමණ්ඩලයට ස්තුතියි.**

සභාවේ කටයුතු ප.ව. 7.25 ට පමණ අවසන් කරන ලදී.

එම්.විකසිතපුෂ්පසූරිය,

සභාපති,

ප්‍රාදේශීය සභාව,

කුරුවිට.

පිටපත් : -

01.කුරුවිට ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලා වෙතට - (දැ.ගැ.පි)

02.පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා - (දැ.ගැ.පි)

03.විගණකාධිපති,විගණකාධිපති උපකාර්යාලය,මහ නගර සභාව,රත්නපුර - (දැ.ගැ.පි)

04.ප්‍රධාන කාර්යාලයේ සියලුම වැඩසටහන් සහකාරවරුන්,සංවර්ධන නිළධාරීන්, කළමණාකාර සහකාරවරුන් හා කාර්මික නිලධාරීන් වෙතට - ඔබ විෂයට අදාල කටයුතු කිරීමට

05.කාර්ය භාර නිලධාරීන් - එල්ලාවල, කිරිඇල්ල, දොඩම්පේ - ඔබ කාර්යාලයට අදාල කරුණ ගැන අවධානය යොමු කිරීමට

06.ප්‍රජා සංවර්ධන නිලධාරී